# ජාතික ළමා ආරක්ෂණ ප්‍රතිපත්තිය පිළිබඳ

# පස් අවුරුදු ජාතික ක්‍රියාකාරී සැලැස්ම

# 2025– 2029

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය

## පටුන


| | |
|---|---|
| කෙටි යෙදුම් | i – iv |
| පෙරවදන | v |
| හැඳින්වීම | vii – x |
| දැක්ම හා මෙහෙවර | xi |
| නිශ්චිත අරමුණු | xiii – xiv |
| ළමා කටයුතු ක්ෂේත්‍රය | 01 - 34 |
| ආපදා කළමනාකරණ ක්ෂේත්‍රය | 35 - 50 |
| ආරක්ෂක හා නීතිය බලාත්මක කිරීමේ ක්ෂේත්‍රය | 51 - 76 |
| සමාජ සවිබලගැන්වීම් ක්ෂේත්‍රය | 77 - 90 |
| මාධ්‍ය හා තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රය | 91 - 104 |
| සෞඛ්‍ය ක්ෂේත්‍රය | 105 – 124 |
| කම්කරු සහ රැකියා ක්ෂේත්‍රය | 125 - 137 |
| අධ්‍යාපන ක්ෂේත්‍රය | 138 - 157 |
| අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ ක්ෂේත්‍රය | 158 - 171 |
| සංවරණ හා සංචාරක ක්ෂේත්‍රය | 172 – 183 |
| මෙහෙයුම් හා ඇගයුම් ක්‍රමවේදය | 184 - 187 |
| ඇමුණුම 01 | 188 |
| ඇමුණුම 02 | 190 |

## කෙටි යෙදුම්

1. අ.ඖ.පා.ජා.ම. - අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය
2. අ.තැ.පි.කා. - අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය
3. අ.වි.සා.ආ.කි.ජා.අ. - අපරාධයක, වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය
4. අ.සේ.කො.ස.ලේ.කා. - අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය
5. අ.උ.අ.වෘ.අ.අමා. - අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
6. අධි.ජා.ඒ.අමා. - අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය
7. ආ.ක.අ. - ආපදා කළමනාකරණ අංශය
8. ආ.ක.ම. - ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය
9. ආ.මා.ප්‍ර.කා. - ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී කාර්යාලය
10. ආ.වි.දෙ. - ආගමන හා විගමන දෙපාර්තමේන්තුව
11. ආ.ස.තැ.ස.ජා.ම.ලේ.කා. - ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික මහලේකම් කාර්යාලය
12. ආර.අමා. - ආරක්ෂක අමාත්‍යාංශය
13. ක.දෙ. - කම්කරු දෙපාර්තමේන්තුව
14. ක.අමා. - කම්කරු අමාත්‍යාංශය
15. කා.වි.දෙ. - කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
16. කා.ළ.ක.අමා. - කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය
17. කො.ආ.වි.වි. - කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය
18. ජා.අ.ආ. - ජාතික අධ්‍යාපන ආයතනය
19. ජා.අධ.කො.ස. - ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව
20. ජා.ආ.අ. ආ. - ජාතික ආරක්ෂක අධ්‍යයන ආයතනය
21. ජා.ආ.අ.ආ. - ජාතික ආරක්ෂක අධ්‍යයන ආයතනය
22. ජා.ආ.කා.පු.කි.අ. - ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය

23. ජා.ආ.ස.සේ.ම. - ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය

24. ජා.කා.ක. - ජාතික කාන්තා කමිටුව

25. ජා.ගො.ප.ආ. - ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය

26. ජා.චි.ස. - ජාතික චිත්‍රපට සංස්ථාව

27. ජා.යො.සේ. - ජාතික යොවුන් සේනාංකය

28. ජා.ශි.හ.බ. - ජාතික ශිෂ්‍ය භට බලකාය

29. ජා.ශ්‍ර.ස.ආ. - ජාතික ශ්‍රම සංවර්ධන ආයතනය

30. ජා.ස.ස.ආ. - ජාතික සමාජ සංවර්ධන ආයතනය

31. ජා.ළ.ආ.අ. - ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

32. ත.ක.ක්‍රී.අමා. - තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය

33. ත්‍රි.හ.මූ. - ත්‍රිවිධ හමුදා මූලස්ථානය

34. ත්‍රි.හ.සේ.ව.ඒ. - ත්‍රිවිධ හමුදා සේවා වනිතා ඒකක

35. නි.වෛ.සෞ.සේ.ආ.ම. - නිවාරණ වෛද්‍ය හා සෞඛ්‍ය සේවා සඳහා ආපදා මණ්ඩලය

36. නී.දෙ. - නීතිපති දෙපාර්තමේන්තුව

37. ප.වෛ.උ.ආ. - පශ්චාත් වෛද්‍ය උපාධි ආයතනය

38. ප.සෞ.කා. - පවුල් සෞඛ්‍ය කාර්යාංශය

39. ප.සෞ.සේ.නි. - පවුල් සෞඛ්‍ය සේවා නිලධාරි

40. ප.ළ.ර.සේ.දෙ. - පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව

41. පො.ළ.කා.අ.නි.කො. - පොලිස් ළමා හා කාන්තා අපයෝජන නිවාරණ කොට්ඨාසය

42. ප්‍ර.ම.ව.සි.ගු.සේ.අමා. - ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය

43. බ.දෙ. - බන්ධනාගාර දෙපාර්තමේන්තුව

44. බු.ශා.ආ.සං.ක.අමා. - බුද්ධ ශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

45. ම.ආ.පා.ක.අමා. -මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය

46. මා.සෞ.අ.කා. - මානසික සෞඛ්‍ය අධ්‍යක්ෂ කාර්යාලය

47. මා.ළ.සෞ.වෛ.නි. - මාතෘ හා ළමා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි

48. මු.ළ.ස.පි.ජා.ලේ.කා. - මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය

49. යු.හ.සේ.ව.ඒ. - යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය

50. ර.ප්‍ර.දෙ. - රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

51. ර.සේ.අ. - රණවිරු සේවා අධිකාරිය

52. වි.ක.වි.රැ.ස.අමා. - විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය

53. වි.තා.අමා. - විද්‍යා සහ තාක්ෂණ අමාත්‍යාංශය

54. වි.වැ.දෙ. - විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

55. වි.වි.ප්‍ර.කො.ස. - විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

56. ශ්‍රී.ල.වෘ.පු.අ. - ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

57. ශ්‍රී.ල.කා.කා. - ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය

58. ශ්‍රී.ල.පො. - ශ්‍රී ලංකා පොලීසිය

59. ශ්‍රී.ල.ආ.ම. - ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

60. ශ්‍රී.ල.ගු.වි.ස. - ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව

61. ශ්‍රී.ල.ගු.හ.මූ. - ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානය

62. ශ්‍රී.ල.නා.හ.මූ. - ශ්‍රී ලංකා නාවික හමුදාව මූලස්ථානය

63. ශ්‍රී.ල.නී.කො.ස. - ශ්‍රී ලංකා නීති කොමිෂන් සභාව

64. ශ්‍රී.ල.ප.ආ. - ශ්‍රී ලංකා පදනම් ආයතනය

65. ශ්‍රී.ල.ප.හ.ප්‍ර.ස. - ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය

66. ශ්‍රී.ල.පු.ම. - ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය

67. ශ්‍රී.ල.බාලදක්ෂ ස. - ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය

68. ශ්‍රී.ල.බාලදක්ෂිකා ස. - ශ්‍රී ලංකා බාලදක්ෂිකා සංගමය

69. ශ්‍රී.ල.යු.හ.මූ. - ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය

70. ශ්‍රී.ල.ර.ස. - ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව

71. ශ්‍රී.ල.වි.ස.නි.කො.ස. - ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

72. ශ්‍රී.ල.වි.සේ.නි.කා. - ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

73. ශ්‍රී.ල.වෙ.දෙ. - ශ්‍රී ලංකා වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුව

74. ශ්‍රී.ල.වෛ.ස. - ශ්‍රී ලංකා වෛද්‍ය සභාව

75. ශ්‍රී.ල.වෛ.සං. -ශ්‍රී ලංකා වෛද්‍ය සංගමය

76. ශ්‍රී.ල.ස.ප්‍ර.කා. - ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය

77. ශ්‍රී.ල.ස.ස.අ. - ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

78. ශ්‍රී.ල.ස.හෝ.ක.ආ. - ශ්‍රී.ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය

79. ශ්‍රී.ල.පො.අ.වි. - ශ්‍රී ලංකා පොලිස් අභ්‍යාස විද්‍යාලය

80. ශ්‍රී.ල.නී.ආ.කො. – ශ්‍රී ලංකා නීති ආධාර කොමිසම

81. ශ්‍රී.ල.රූ.ස. - ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව

82. ශ්‍රී.ල.වි.ආ. - ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය

83. ස.සේ.දෙ. - සමාජ සේවා දෙපාර්තමේන්තුව

84. ස.ආ.ම. - සමාජ ආරක්ෂණ මණ්ඩලය

85. ස්.රූ.සේ. - සී/ස ස්වාධීන රූපවාහිනී සේවය

86. සි.ආ.දෙ. - සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව

87. සෞ.ජ.මා.අමා. - සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය

88. සෞ.ප්‍ර.කා. - සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශය

89. ග්‍රා.ස.ස.ආ.ප්‍ර.ස.අමා. - ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය

# පෙරවදන

ශ්‍රී ලංකාවේ සෑම ළමයකුගේම ආරක්ෂාව, යහපැවැත්ම සහ අයිතිවාසිකම් සහතික කිරීම අරමුණු කරගත් පුළුල් හා උපායමාර්ගික රාමුවක් වන ළමා ආරක්ෂණය පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම ඉදිරිපත් කිරීමට ලැබීම ජාතික ළමා ආරක්ෂක අධිකාරිය සහ කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය වශයෙන් ඉතා සතුටට පත්විය යුතු කරුණකි. මෙම ලේඛනය නියෝජනය කරන්නේ රජයේ ආයතන, රාජ්‍ය නොවන සංවිධාන, සිවිල් සමාජය සහ අපගේ ළමයින්ගේ අනාගතය සුරක්ෂිත කිරීම සඳහා කැපවී සිටින අනෙකුත් පාර්ශවකරුවන්ගේ සාමූහික ප්‍රයත්නයකි.

ළමුන් ආරක්ෂා කිරීම අප සැමගේ මූලික වගකීමක් වන අතර, මෙම ජාතික ක්‍රියාකාරී සැලැස්ම සෑම ළමයෙකුම ආරක්ෂා කරන පරිසරයක් නිර්මාණය කිරීම සඳහා ඇති කැපවීම අවධාරණය කරයි. ළමයින්ට එරෙහි සාහසිකත්වය, ළමා අපයෝජනය, සූරාකෑම, නොසලකා හැරීම සහ වෙනස් කොට සැලකීම ඇතුළුව ශ්‍රී ලාංකේය ළමයින් මුහුණදෙන නානාවිධ අභියෝග හා ගැටළු ඵලදායී ලෙස විසඳීම සඳහා මෙම පස් අවුරුදු ක්‍රියාකාරී සැලැස්ම මාර්ග සිතියමක් ලෙස ක්‍රියාත්මක වෙයි.

ළමා ආරක්ෂාව ට අදාළ දැනට පවතින නෛතික රාමු වැඩි දියුණු කිරීම සහ බලාත්මක කිරීම, ඒවා ජාත්‍යන්තර ප්‍රමිතීන් හා හොඳම භාවිතයන් සමඟ පෙළගැසෙන බව සහතික කිරීම, ළමා අපයෝජන හා සූරාකෑමේ අවස්ථා හඳුනා ගැනීම, ප්‍රතිචාර දැක්වීම සහ වැළැක්වීම සඳහා වෘත්තිකයන්, රැකබලා ගන්නන් සහ ප්‍රජාවන්ගේ ධාරිතාව ගොඩනැගීම, සෑම ළමයෙකුටම ගුණාත්මක අධ්‍යාපනයක් සඳහා ප්‍රවේශය සහතික කිරීම, ආරක්ෂිත ඉගෙනුම් පරිසරයන් ප්‍රවර්ධනය කිරීම සහ ළමුන් පාසලට පැමිණීම වළක්වන බාධක විසඳීම, ළමුන් සහ ඔවුන්ගේ පවුල් සඳහා සෞඛ්‍ය සේවා වැඩිදියුණු කිරීම සහ මානසික සෞඛ්‍ය සහාය ඇතුළු සාකල්‍යය යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම, ළමුන් අගය කරන, සහයෝගය දක්වන සහ ඔවුන්ගේ අයිතිවාසිකම්වලට ගරු කරන ආරක්ෂිත පරිසරයක් නිර්මාණය කිරීම සඳහා ප්‍රජා සහභාගීත්වය සහ දැනුවත්භාවය වර්ධනය කිරීම, ප්‍රගතිය නිරීක්ෂණය කිරීම, අභියෝග හඳුනා ගැනීම සහ සාක්ෂි මත පදනම් වූ තීරණ ගැනීම හා දැනුම්දීම සඳහා දත්ත රැස් කිරීම, අධීක්ෂණය සහ ඇගයීම සඳහා ශක්තිමත් පද්ධතියක් ස්ථාපිත කිරීම, හවුල්කාරිත්වය සහ සහයෝගීතාව මත පදනම්ව ළමා ආරක්ෂණ ක්ෂේත්‍රයේ සම්පත් හා විශේෂඥ දැනුම උපරිම කිරීම සඳහා රාජ්‍ය ආයතන, රාජ්‍ය නොවන සංවිධාන සහ පෞද්ගලික අංශය අතර හවුල්කාරිත්වය ශක්තිමත් කිරීම වැනි ළමුන් වෙනුවෙන්ම කටයුතු කරනු ලබන පද්ධති හා ක්‍රමවේද මෙම ක්‍රියාකාරී සැලසුම මඟින් ඉදිරි වර්ෂ පහ තුළදී ළඟාකර ගැනීමට අපේක්ෂා කර ඇත.

මෙම ජාතික ක්‍රියාකාරී සැලැස්ම වෙනස් වන අවශ්‍යතා සහ අභියෝග සමඟ පරිණාමය වන ගතික ලියවිල්ලකි. එය සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා සියලු පාර්ශවකරුවන්ගේ කැපවීම සහ සහයෝගීතාව අවශ්‍ය වේ. ශ්‍රී ලංකාවේ සෑම ළමයෙකුටම ආරක්ෂිත පරිසරයක් තුළ වර්ධනය වීමට, ඉගෙන ගැනීමට සහ සමෘද්ධිමත් වීමට හැකි අනාගතයක් සියළු පාර්ශව ආයතනයන්ට එක්ව වැඩ කිරීමෙන් නිර්මාණය කළ හැකිය.

මෙම සැලසුම සංවර්ධනය කිරීම සඳහා දායක වූ සියලු දෙනාට කෘතඥතාව පළ කරන අතර, මෙම ඒකාබද්ධ උත්සාහයන් දැයේ ළමයින්ගේ යහපැවැත්ම සඳහා ධනාත්මක හා කල් පවත්නා ප්‍රතිඵල ලබා දෙනු ඇතැයි ජාතික ළමා ආරක්ෂක අධිකාරිය සහ කාන්තා සහ ළමා කටයුතු  අමාත්‍යාංශය වශයෙන් විශ්වාස කරමු .

ලේකම්,
කන්තා සහ  ළමා කටයුතු  අමාත්‍යාංශය

## හැඳින්වීම

ළමයින් ඕනෑම රටක අනාගතය නියෝජනය කරන අතර, සමාජයේ තිරසාර වර්ධනය හා සමෘද්ධිය සඳහා ඔවුන්ගේ යහපැවැත්ම ප්‍රමුඛ වේ. මෙම ජාතික ක්‍රියාකාරී සැලැස්ම සඳහා පදනම් වී ඇත්තේ එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ ඇති ළමා අයිතිවාසිකම්ය. ළමයා අයිතිවාසිකම් දරන්නෙකු ලෙස පිළිගැනීමෙන්, මෙම සැලසුම ගෝලීය ප්‍රමිතීන්ට අනුකූල වන අතර, සෑම ළමයෙකුටම වර්ධනය හා සංවර්ධනය විය හැකි ආරක්ෂිත පරිසරයක් ලබාදීම සඳහා ශ්‍රී ලංකාවේ කැපවීම තහවුරු කරයි.

ළමුන්ගේ අධ්‍යාපනය සහ සෞඛ්‍ය සඳහා ආයෝජනය කිරීම මෙන් ම ඔවුන්ගේ ආරක්ෂාව සඳහා ආයෝජනය මානව ප්‍රාග්ධනයේ ආයෝජනයකි. ළමා ආරක්ෂාව වෙනුවෙන් තාර්කික ඉදිරි දර්ශනයක් හඳුන්වාදීමෙන් එනම්, ළමයින්ට එරෙහි සාහසිකත්වයෙන්, ළමා අපයෝජනයෙන්, සූරාකෑමෙන් සහ නොසලකා හැරීමෙන් ළමයින් ආරක්ෂා කිරීම මඟින් සමාජ අපගමනයේ චක්‍රය බිඳ දමා සමෘද්ධිමත් සමාජයක් සංවර්ධනය කිරීමට දායකවීම මෙම සැලැස්මේ අරමුණයි.

## අදාළ ප්‍රතිපත්ති රාමුව

1998 අංක 50 දරණ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පනතේ 14 (අ) වගන්තියේ විධිවිධාන යටතේ සකස් කරන ලද ළමා ආරක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා ළමා ආරක්ෂාව පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම සම්පාදිතය. ළමා ආරක්ෂණය පිළිබඳ ප්‍රතිපත්ති රාමුව සකස් කර ඇත්තේ රටෙහි වෙසෙන ළමයා, ළමයින්ට එරෙහි සාහසිකත්වයෙන්, ළමා අපයෝජනයෙන්, සූරාකෑමෙන් සහ නොසලකා හැරීමෙන් ආරක්ෂා කිරීම සඳහා විධිමත් ප්‍රවේශයක් ලබාදීම සඳහා ය. ළමා ආරක්ෂණය හා සම්බන්ධ විෂයය ක්ෂේත්‍ර 10ක් ආවරණය වන පරිදි මෙම ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ඇත.එනම්,

1. ළමා කටයුතු (Child Affairs)
2. ආරක්ෂක හා නීතිය බලාත්මක කිරීම (Defense and Law Enforcement)
3. සමාජ සවිබලගැන්වීම් (Social Empowerment)
4. මාධ්‍ය හා තොරතුරු තාක්ෂණය (Media and Information Technology)
5. සෞඛ්‍ය (Health)
6. කම්කරු (Labor)
7. අධ්‍යාපනය (Education)
8. අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ (Justice and Law Reform)
9. සංචරණ හා සංචාරක (Travel and Tourism)
10. ආපදා කළමණාකරණය (Disaster Management)

ළමා ආරක්ෂණය යනුවෙන් අර්ථ දක්වන්නේ, ප්‍රචණ්ඩත්වය, සූරාකෑම, නොසලකා හැරීම, අපරාධ තත්ත්වයේදී ඇතිවන අනාරක්ෂිතතාවය යන සියලු ආකාරයේ ළමා අපයෝජනයන්ට එරෙහි වැළැක්වීමට හා ප්‍රතිචාර දැක්වීමට නියමිත සඵලදායි ක්‍රියාපටිපාටින් හා ව්‍යුහයන් ඇතුළත් ක්‍රියාවලිය වේ. (ළමා ආරක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය, 2019)

ශ්‍රී ලංකාවේ ළමයින්ගේ සුරක්ෂිතතාව, ආරක්ෂාව හෝ උපරිම යහපත තහවුරු කිරීම වෙනුවෙන් ඒකාබද්ධ ප්‍රවේශයකින් ළමයින්ට එරෙහි සාහසිකත්වය වැළැක්වීම හා ප්‍රතිචාර දැක්වීමට රජය හා අනෙකුත් සියලුම පාර්ශවකරුවන් විසින් ක්‍රියාකාරකම් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය, නියාමනය හා සම්බන්ධීකරණය කිරීමට උපකාර වියහැකි පහත සඳහන් ජාතික ප්‍රතිපත්ති රාමුවට අනුව මෙම ක්‍රියාකාරී සැලැස්මේ සියලු ක්‍රියාකාරකම් හඳුනාගත හැක.

1. සියලු ළමයින්ගේ සුරක්ෂිතතාව හා පූර්ණ සංවර්ධනය පිණිස අවශ්‍ය සමස්ත විශ්වීය ප්‍රතිපත්ති, වැඩසටහන්, ප්‍රමිතීන් හා සේවාවන්
2. පවුල හා ප්‍රජාව මට්ටමින් පවතින ප්‍රමුඛ සමාජ-ආර්ථික හා සංස්කෘතික හේතූන් හා අවදානම් තත්ත්වයන් ආමන්ත්‍රණය කිරීමට මෙන්ම නිවාරණය සඳහා වූ සියලු ප්‍රතිපත්ති, වැඩසටහන්, ප්‍රමිතීන් හා සේවාවන්.
3. අවදානම්, අනාරක්ෂිත, ආන්තික හා ඇස නොගැටෙන ළමයින් හා පවුල් සඳහා ඉලක්කගත සේවාවන්, (ළමා වින්දිතයින් හා ඉන් මුදවාගනු ලැබූ ළමුන් ද ඇතුළත් වේ.)
4. ළමා වින්දිතයින් හා ඉන් මුදවාගනු ලැබූ ළමයින් සඳහා සේවාවන් (විශේෂයෙන් නීතිය සමඟ සම්බන්ධ වන ළමයින්ද ඇතුළත් වේ.)

එමෙන්ම ළමා ආරක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියට අදාළ පහත සඳහන් ප්‍රධාන අභිමතාර්ථයන් හය ආවරණය වන සේ සියලු ක්‍රියාකාරකම් මෙහි දී හඳුනාගෙන ඇත.

1. ළමයා හා පවුල සවිබලගැන්වීම.
2. ළමයින්ගේ උපරිම යහපත තහවුරු කිරීම සඳහා උචිත රැකවරණය හා සහාය සැපයීමට පවුලට හා ප්‍රජාවට අයත් හැකියාව හා ධාරිතාව වර්ධනය.
3. ආයතනික මානව සම්පතෙහි දැනුම, කුසලතා හා ආකල්ප සංවර්ධනය.
4. අනාරක්ෂිත, අවදානම්, ආන්තික හා ඇස නොගැටෙන ළමයින් හා පවුල් පදනම් වූ සේවාවන්
5. සියලු පාර්ශවකරුවන් විසින් මනා සම්බන්ධීකරණය, සම්පත් සමෘද්ධිභාවය ප්‍රතිචාරාත්මක ඍජු හා වක්‍ර සේවාවන්
6. දෙමාපිය දූ දරු සබඳතා ගොඩනැගීමට බලපාන්නා වූ ආර්ථිකමය, දේශපාලනමය හා සමාජ සංස්කෘතික හැකියාවන් ප්‍රවර්ධනය

මේ වන විට ළමා ආරක්ෂාව වෙනුවෙන් රටේ පවත්නා නීති ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වනවා පමණක් නොව ළමා ආරක්ෂාව සඳහා ශක්තිමත් නෛතික පදනමක් ද සපයයි. එසේම ව්‍යවස්ථාදායකය විසින් ළමා ආරක්ෂාව වෙනුවෙන් පවත්නා යල්පැන ගිය නීති සංශෝධනයටත් හා නව නීති හඳුන්වා දීමටත් කටයුතු කරනු ඇත. ළමා ආරක්ෂාව

වෙනුවෙන් කටයුතු කරනු ලබන ආයතනික ව්‍යුහය ශක්තිමත් කිරීම ප්‍රධාන අංගයක් වන අතර, ළමා ආරක්ෂණ ගැටළු සඳහා සම්බන්ධීකරණ ප්‍රතිචාරයන් සහතික කිරීම සඳහා ධාරිතා ගොඩනැගීම සහ අන්තර් නියෝජිත සහයෝගීතාව අවධාරණය කරයි. එමගින් බහුආංශික, බහුපාර්ශවීය හා ඒකාබද්ධ සේවා ප්‍රවේශයක් සඳහා ඉඩකඩ සැලසෙනු ඇත.

ප්‍රජාව පදනම් කරගත් වැඩසටහන් සහ මහජන දැනුවත් කිරීමේ ව්‍යාපාර ළමා අපයෝජන වැළැක්වීමේ ක්‍රමෝපායන් ලෙස අවධාරණය කරමින් මෙම සැලැස්මෙහි මූලිකාංග ලෙස ඇතුළත් කර ඇත. අධ්‍යාපන ප්‍රතිපත්ති ඇතුළත් ''සැමට අධ්‍යාපනය'' සහ ජීවන නිපුණතා පුහුණුව කෙරෙහිද අවධානය යොමුකර ඇති අතර, අධ්‍යාපනය ළමුන් සඳහා ආරක්ෂිත පලිහක් ලෙස පිළිගනී. ළමුන් සඳහා ප්‍රවේශවිය හැකි සෞඛ්‍ය සේවා සහ පෝෂණ වැඩසටහන්වල වැදගත්කම සෞඛ්‍ය හා යහපැවැත්ම ප්‍රතිපත්ති අවධාරණය කරයි. නීතිමය ආරක්ෂාව, යුක්තිය හා සාධාරණත්වය වෙනුවෙන් නීති ආධාර සේවා සහ ළමා හිතකාමී නීති ක්‍රියා පටිපාටි සඳහා පෙනී සිටී. ජාත්‍යන්තර සහයෝගීතා ප්‍රතිපත්ති වෙනුවෙන් ගෝලීය හවුල්කරුවන් සමඟ සහයෝගිතා ගිවිසුම් සහ තොරතුරු හුවමාරු කර ගැනීම අපේක්ෂා කරයි. ළමා ආරක්ෂාව ජාතික භාදේශසීමාවලින් ඔබ්බට විහිදෙන හවුල් වගකීමක් බව පිළිගනී.

**සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ දී මුහුණ දිය හැකි අභියෝග සහ ගැටලු:**

සමස්ථ ශ්‍රී ලාංකීය ළමයින්ගේ ආරක්ෂණය උදෙසා අරමුණු කර තිබියදීත්, සැලැස්ම සාර්ථකව ක්‍රියාත්මක කිරීමට බාධා කළ හැකි අභියෝග කිහිපයකට මුහුණ දෙයි. තීරණාත්මක වැඩසටහන් සහ සේවාවන් ක්‍රියාත්මක කිරීමට සීමිත සම්පත්, විශේෂයෙන් මූල්‍ය සීමාවන්, සැලකිය යුතු බාධාවක් විය හැකිය. මූල්‍ය හා මානව සම්පත් මෙන්ම අත්‍යාවශ්‍ය යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීම ක්ෂණික සහයෝගය ලබා ගැනීමට බලපෑම් කළ හැකිය.

වෘත්තිකයන් අතර ධාරිතාව සහ පුහුණු ලුහුඬුතා ළමයින්ට එරෙහි සාහසිකත්වය හඳුනා ගැනීම සහ ප්‍රතිචාර දැක්වීමේදී ඒවායේ කාර්යක්ෂමතාව සීමා කළ හැකිය. රාජ්‍ය ආයතන සහ රාජ්‍ය නොවන සංවිධාන, සිවිල් සංවිධාන ඇතුළු විවිධ පාර්ශවකරුවන් අතර සම්බන්ධීකරණ අභියෝග හේතුවෙන් ඛණ්ඩනය වූ උත්සාහයන් ඇති විය හැකි අතර පුළුල් ළමා ආරක්ෂාව සඳහා අවශ්‍ය සහජීවනයට බාධා ඇති විය හැකිය.

ළමුන්ට එරෙහි හානිකර පිළිවෙත් ඉවසා සිටින හෝ පවත්වාගෙන යන ගැඹුරින් මුල් බැස ගත් සංස්කෘතික හා සමාජ සම්මතයන් සැලකිය යුතු බාධක ඇති කරයි. මෙම අන්තර්ගත විශ්වාසයන් ජය ගැනීම සඳහා තිරසාර දැනුවත් කිරීමේ ව්‍යාපාර සහ ප්‍රජා සහභාගීත්වය අවශ්‍ය වේ. අපකීර්තිය සහ භීතිය හේතුවෙන් අඩුවෙන් වාර්තා කිරීම වැනි දත්ත රැස් කිරීම සහ වාර්තා කිරීමේ ගැටළු ළමා අපයෝජනයේ සැබෑ ව්‍යාප්තිය පැහැදිලිව නොපෙන්වයි.

නීතිමය කටයුතුවල ප්‍රමාදයන් ඇතුළු නීතිමය හා අධිකරණමය අභියෝග ළමා වින්දිතයන් සඳහා යුක්තිය ඉටු කිරීමට බලපායි. අධ්‍යාපනයට ඇති බාධක, ඩිජිටල් සූරාකෑම හා සම්බන්ධ තාක්ෂණික අභියෝග සහ ස්වාභාවික ආපදා හා ගැටුම්වල බලපෑම සැලැස්මේ අරමුණු තවදුරටත් සංකීර්ණ කරයි.

ශ්‍රී ලංකාවේ ළමා ආරක්ෂාව පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම සෑම ළමයෙකුටම සුරක්ෂිත හා ආරක්ෂිත පරිසරයක් පිළිබඳ දැක්ම සාක්ෂාත් කර ගැනීම සහතික කිරීම සඳහා බහු-පාර්ශවකරුවන්ගේ ප්‍රවේශයක්, අඛණ්ඩ ඇගයීමක් සහ අනුවර්තන උපාය මාර්ග ඇතුළත් විය යුතුය.

## දැක්ම

රටේ සංස්කෘතිය, ආචාර ධර්ම, සාරධර්ම, අනන්‍යතාවයන් ආරක්ෂා කර ගනිමින් සහ ගෝලීය පසුබිම තුළ ශ්‍රී ලංකාව ඉදිරියට ගෙන යාමේ අභියෝගවලට සාර්ථකව මුහුණ දීමට හැකි නිරෝගී සහ ආරක්ෂිත ළමා පරපුරක්.

## මෙහෙවර

ළමුන්ගේ යහපැවැත්ම උදෙසා ක්‍රියාකරන සියලු ක්ෂේත්‍රයන්ගේ සාමූහික කැපවීම් තුළින්, දැයේ සියලු ළමයින්හට සිය පූර්ණ හැකියාවන් වර්ධනය සහ සංවර්ධනය කරගැනීමට අවශ්‍ය සුරක්ෂිත හා ආරක්ෂිත පරිසරයක් සහතික කරන රාමුවක් සැපයීම.

## නිශ්චිත අරමුණු

ජාතික ළමා ආරක්ෂණ ප්‍රතිපත්තියේ ඉදිරි කටයුතු සිදු කිරීමේදී ළමා ආරක්ෂණය පිළිබඳ විශේෂිත අරමුණු ලෙස ළමයින්ගේ ආරක්ෂාව, යහපැවැත්ම සහ සංවර්ධනය සහතික කිරීම මූලික කරගත් ඉලක්කගත හා මැනිය හැකි අරමුණු ඉතා වැදගත් බවට හඳුනාගෙන ඇත. මෙම අරමුණු ළමා ආරක්ෂණ වැඩසටහන් සහ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට මඟ පෙන්වයි. ළමා ආරක්ෂාව පිළිබඳ නිශ්චිත අරමුණු මෙසේය:

1. ළමා අපයෝජන සහ නොසලකා හැරීම වැළැක්වීම:

- අරමුණ: ඉලක්කගත වැළැක්වීමේ වැඩසටහන් සහ දැනුවත් කිරීමේ ව්‍යාපාර හරහා ළමා අපයෝජන හා නොසලකා හැරීම් අවම කිරීම.

2. ළමා අපයෝජනයේ හේතු හඳුනා ගැනීම සහ මැදිහත්වීම:

- අරමුණ: අවදානමට ලක්ව ඇති ළමුන් කලින් හඳුනා ගැනීමේ ක්‍රමෝපායන් වැඩි දියුණු කිරීම සහ තවදුරටත් හානි වීම වැළැක්වීම සඳහා කාලෝචිත මැදිහත්වීම් සිදු කිරීම.

3. නෛතික රාමුව ශක්තිමත් කිරීම:

- අරමුණ: ළමා ආරක්ෂාවට අදාළ නෛතික රාමුව වැඩි දියුණු කිරීම සහ ශක්තිමත් කිරීම, එය ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වන බව සහතික කිරීම.

4. වෘත්තිකයන් සඳහා ධාරිතා ගොඩනැගීම:

- අරමුණ: ළමා ආරක්ෂණ ගැටලුවලට ඵලදායී ලෙස ප්‍රතිචාර දැක්වීම සඳහා ළමා ආරක්ෂණය පිළිබඳ ක්ෂේත්‍ර ආවරණය වනසේ ළමුන් සමඟ වැඩකරන වෘත්තිකයන්ගේ ධාරිතාව ගොඩනැගීම.

5. ගුණාත්මක අධ්‍යාපනය සඳහා ප්‍රවේශය:

- අරමුණ: ස්ත්‍රී - පුරුෂ හා, සමාජ-ආර්ථික තත්ත්වය හෝ භූගෝලීය පිහිටීම නොසලකා සෑම ළමයෙකුටම ගුණාත්මක අධ්‍යාපනයක් සඳහා ප්‍රවේශය සහතික කිරීම.

6. ප්‍රජා සහභාගීත්වය සහ දැනුවත්භාවය:

- අරමුණ: ළමා අයිතිවාසිකම්, ළමා ආරක්ෂණ යාන්ත්‍රණයන් සහ ලබාගත හැකි උපකාරක සේවාවන් පිළිබඳ ප්‍රජා දැනුවත්භාවය වැඩි කිරීම.

7. ළමුන්ගේ අන්තර්ජාල භාවිතය සඳහා ආරක්ෂාව:

- අරමුණ: ඩිජිටල් සූරාකෑම, මාර්ගගත අපයෝජනය සහ සයිබර් හිරිහැරවලින් ළමයින් ආරක්ෂා කිරීම.

8. මනෝ සමාජීය සහාය සහ මානසික සෞඛ්‍ය සේවා:

- අරමුණ: කම්පනය හෝ අපයෝජනයට මුහුණ දුන් ළමයින් සඳහා ප්‍රමාණවත් මනෝ සමාජීය සහාය සහ මානසික සෞඛ්‍ය සේවා සැපයීම.

9. අර්බුදකාරී ළමයින් සඳහා ආරක්ෂිත අවකාශයන්:

- අරමුණ: සරණාගතයින්, අභ්‍යන්තරව අවතැන් වූ හෝ ඔවුන්ගේ පවුල්වලින් වෙන් වූ අය ඇතුළු අර්බුදකාරී අවස්ථාවන්හිදී ළමුන් සඳහා ආරක්ෂිත අවකාශයන් ස්ථාපිත කිරීම.

10. ළමා හිතකාමී නීතිමය ක්‍රියා පටිපාටි:

- අරමුණ: නීතිමය ක්‍රියාවලීන් තුළදී ළමා වින්දිතයන්ගේ කම්පනය අවම කිරීමට ළමා හිතකාමී නීතිමය ක්‍රියා පටිපාටි ක්‍රියාත්මක කිරීම.

11. අධීක්ෂණ හා ඇගයීම් පද්ධතිය:

- අරමුණ: ළමා ආරක්ෂණ වැඩසටහන්වල ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සහ වැඩිදියුණු කිරීම පිණිස ක්ෂේත්‍ර හඳුනාගැනීම සඳහා ශක්තිමත් අධීක්ෂණ හා ඇගයීම් පද්ධතියක් ස්ථාපිත කිරීම.

12. තීරණ ගැනීමේදී ළමා සහභාගීත්වය:

- අරමුණ: ඔවුන්ගේ ජීවිතයට බලපාන තීරණ සඳහා ළමයින්ගේ ක්‍රියාකාරී සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීම.

මෙම නිශ්චිත අරමුණු, සාමූහිකව ක්‍රියාත්මක කරන විට ළමයින්ට එරෙහි සාහසිකත්වයෙන්, ළමා අපයෝජනයෙන්, සූරාකෑමෙන් සහ නොසලකා හැරීමෙන් තොර, සෑම ළමයෙකුටම සමෘද්ධිමත් විය හැකි ආරක්ෂිත පරිසරයක් නිර්මාණය කිරීමේ අවසන් ඉලක්කයට දායක වේ.

# 01. ළමා කටයුතු ක්ෂේත්‍රය

**ක්ෂේත්‍රය පිළිබඳ අර්ථ දැක්වීම:**

ළමා කටයුතු ක්ෂේත්‍රය මූලික වශයෙන් ළමයින්ගේ රැකවරණය, සංවර්ධනය, ආරක්ෂාව සහ යහපැවැත්ම කෙරෙහි අවධානය යොමු කරයි. මෙම විෂය පථය තුළදී ළමා ආරක්ෂාව, නීතිය සමඟ ගැටුම් ඇතිකර ගත් ළමුන්ගේ පරිවාසය හා රැකවරණය, ළමා වින්දිතයින් සඳහා රැකවරණය සහ ආරක්ෂාව සැපයීම සහ මුල් ළමාවිය රැකවරණය සහ සංවර්ධනය යන විෂයයන්ගෙන් ක්ෂේත්‍රයේ විධිනියෝගයන් සමන්විත වේ. ළමා ආරක්ෂාව යනු සියලුම ආකාරයේ ශාරීරික හෝ මානසික හිංසන, තුවාල කිරීම් හෝ අපයෝජන, නොසලකා හැරීම් හෝ නොසැලකිලිමත් ලෙස සැලකීම්, හිරිහැර කිරීම් හෝ ලිංගික අපයෝජන ඇතුළුව සූරාකෑම වැළැක්වීමට සහ ඒවාට ප්‍රතිචාර දැක්වීමට ගනු ලබන පියවර සහ ව්‍යුහයන් ලෙස අර්ථ දැක්විය හැකිය. (ළමා අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය 19 වැනි වගන්තිය). මහේස්ත්‍රාත් නියෝග මත සිය පුනරුත්ථාපනය, රැකවරණය හා ආරක්ෂාව තහවුරු කළ යුතු වූ නීතිය සමඟ ගැටුම් ඇති කර ගැනීම හේතු කොට ගෙන පරිවාස භාරයේ සිටින ළමුන්ට මෙන්ම, අපයෝජනයට ලක් වූ ළමුන්ට රැකවරණය හා ආරක්ෂාව ලබාදීම සඳහා වූ ක්‍රියාපටිපාටි ළමයින් හා යෞවනයින් පිළිබඳ ආඥාපනත (1939) මඟින් සපයනු ලැබේ. මුල් ළමාවිය රැකවරණය සහ සංවර්ධනය යනුවෙන් නිර්වචනය කරනු ලබන්නේ මුල් ළමාවියේ (පිළිසිඳ ගැනීමේ සිට අවුරුදු 5 දක්වා) ළමයින්ට, විශේෂයෙන්ම වඩාත්ම අවදානමට ලක්විය හැකි සහ අවාසි සහගත තත්ත්වයේ සිටින ළමයින් සඳහා අත්‍යවශ්‍ය සේවාවන් වන සෞඛ්‍ය, පෝෂණය, අධ්‍යාපනය, සමාජ සේවා, රැකවරණය සහ ආරක්ෂාව සැපයීම ය. (මුල් ළමාවිය රැකවරණය සහ සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය)

**ළමා ආරක්ෂාව සඳහා අදාළත්වය:**

ළමා ආරක්ෂාව යනු තනි විෂයයක් හෝ ධාරාවක් නොවේ. එබැවින් එය බහු-ආංශික උත්සාහයක් බවට පත්වේ. එහෙත්, ළමා ආරක්ෂාව, ළමා කටයුතු අංශයේ විධිනියෝගයේ හරය සහ කේන්ද්‍රය වන බැවින්, ළමයින්ට එරෙහි සියලු ආකාරයේ හිංසන වැළැක්වීම සහ ඒවාට ප්‍රතිචාර දැක්වීම සඳහා වන ක්‍රියාමාර්ග සහ ව්‍යුහයන් ක්‍රියාත්මකව පවත්නා බව සහතික කිරීම සඳහා එම ක්ෂේත්‍රය ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. එමඟින් ළමා ආරක්ෂාව පිළිබඳ ප්‍රතිපත්ති සහ ක්‍රියාකාරී සැලසුම් සකස් කර තිරස් ආංශිකව ක්‍රියාත්මක කිරීමේ දී බහු-ආංශික සම්බන්ධීකරණය සහ සහයෝගීතාවය පිළිබඳ වගකීම භාර ගනු ලැබේ.

**ආයතනික රාමුව:**

කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය මූලිකවම ළමා කටයුතු විෂයභාර අමාත්‍යාංශය වේ. ළමා අපයෝජන වැළැක්වීම සහ එවැනි අපයෝජනයන්ට ගොදුරු වන ළමුන් ආරක්ෂා කිරීම සහ ප්‍රතිකාර කිරීම සඳහා පාර්ලිමේන්තු පනතක් මඟින් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පිහිටුවා ඇත. අධිකාරිය විසින් සියලුම ආකාරයේ ළමා අපයෝජන සහ නොසලකා හැරීම්වලට එරෙහිව ගනු ලබන ක්‍රියාමාර්ග සම්බන්ධීකරණය කිරීම සහ අධීක්ෂණය කිරීම අනිවාර්යයෙන්ම සිදුකළ යුතුය. ප්‍රතිපත්ති සම්පාදනයට සහ උපදේශනයට සහාය දෙන අතරම අධිකාරිය විසින් ළමා අපයෝජන පිළිබඳ පැමිණිලි භාරගෙන ඒ සම්බන්ධයෙන් විමර්ශන සඳහාත්, නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කිරීම සඳහාත් යොමු කරනු ලැබේ. තවද, ළමා අපයෝජන වැළැක්වීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමට සහ සම්බන්ධීකරණය කිරීමට එය බල ගන්වා ඇත. එසේම විෂයය භාර අමාත්‍යාංශය යටතේ, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව මඟින් (අ) අධිකරණය මගින් වරදකරුවන් වූ හෝ වෙනත් දඬුවමකට ලක් වූ ළමයින් නිවසේදී හෝ පළාත් සභා යටතේ පිහිටුවා ඇති රැකවරණ ආයතන තුළ පුනරුත්ථාපනය කිරීම (ආ) අධිකරණය මඟින් නිවසේ හෝ පවුල් පදනම මත වූ ඕනෑම විකල්ප රැකවරණ සැකසුමක හෝ ආයතනික රැකවරණයේ හෝ තබා ඇති අපයෝජනයට ගොදුරු වූ ළමයින්ට රැකවරණය සහ ආරක්ෂාව සැපයීම (ඇ) බහු-ආංශික සහයෝගීතාව හරහා රට තුළ ළමා අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය ක්‍රියාත්මක කිරීම සඳහා මඟපෙන්වීම මෙන්ම ළමා අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් වැළැක්වීම සඳහා ප්‍රජාව දැනුවත් කිරීම හා බලගැන්වීමද, සිදුවන උල්ලංඝනයන් පිළිබඳව විමසා බැලීමද සිදු කරනු ලැබේ. මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය මඟින් මුල් ළමාවිය රැකවරණය සහ සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සම්පාදනය කරන අතර රාජ්‍ය, රාජ්‍ය නොවන සහ පෞද්ගලික අංශ තුළ මුල් ළමාවිය රැකවරණය සහ සංවර්ධනය සම්බන්ධයෙන් වන වැඩසටහන් සම්බන්ධීකරණය කරමින් ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණයද ලෙස ක්‍රියා කරයි. එය ළමයින්ගේ මුල් ළමාවියේ සමස්ථ සංවර්ධනය පිළිබඳ පර්යේෂණ කටයුතු සිදු කරන අතර පුහුණු වැඩසටහන්ද ක්‍රියාත්මක කරයි. මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයද ළමා සංවර්ධනය තුළ මුල් ළමාවියේ වැදගත්කම පිළිබඳව මහජනතාව දැනුවත් කරන අතර විශේෂයෙන් අවදානම් සහගත සහ ආන්තික ජනතාවට සිය ළමයින් වෙත මුල් ළමාවිය රැකවරණය සහ සංවර්ධනය ලබාදීම පිළිබඳව සංවේදීභාවය ඇති කරයි.

| උපාය මාර්ගය | | උපාය මාර්ගික අරමුණු | ගැටලුව | ප්‍රධාන ක්‍රියාකාරකම්/ මැදිහත්වීම් | ප්‍රධාන කාර්ය සාධක දර්ශකය | සත්‍යාපනය කිරීමේ ක්‍රම | උප ක්‍රියාකාරකම් | වසර 1 | වසර 1-3 | වසර 1-5 | ප්‍රධාන වගකිව යුතු ආයතන | ඇස්තමේන්තුගත අයවැය (රු. මිලියන) | අරමුදල් මූලාශ්‍රය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1. නීති ක්‍රියාත්මක කිරීම සහ බලාත්මක කිරීම | 1.1. ප්‍රතිපත්ති | 1.1.1. ක්ෂේත්‍රයට අදාළ ප්‍රතිපත්ති ශක්තිමත් කිරීම මඟින් ළමා ආරක්ෂණ ප්‍රවේශයන් සහතික කිරීම | 1.1.1.1. පවුල සම්බන්ධ ප්‍රතිපත්ති වල නොගැලපීම | 1.1.1.1.1. ශ්‍රී ලංකාවේ පවුල් ප්‍රතිපත්ති සමාලෝචනය සහ සංශෝධනය | සංශෝධිත ප්‍රතිපත්ති ලේඛනය | මූලික නිර්දේශය සහිත සමාලෝචන වාර්තා<br>සංශෝධිත පවුල් ප්‍රතිපත්තිය | 1. කමිටුවක් පත් කිරීම<br>2. සමාලෝචනය<br>3. සංශෝධිත ප්‍රතිපත්තිය කෙටුම්පත් කිරීම<br>4. අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම | | 2025 - 2027 | | කා.ළ.ක.අ මා.<br>ජා.ස.ස.ආ. | 0.200 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | | 1.1.2. ළමා රැකවරණ සේවා පහසුකම් සපයන ආයතන විධිමත් කිරීම සහතික කිරීම | 1.1.2.1 දිවා සුරැකුම් මධ්‍යස්ථානවල ක්‍රියාකාරීත්වය පිළිබඳව ලැබුණු පැමිණිලි | 1.1.2.1.1. ජාතික දිවා සුරැකුම් ප්‍රතිපත්තිය එළි දැක්වීම හා ක්‍රියාත්මක කිරීම | ප්‍රතිපත්ති ලේඛනය | අමාත්‍ය මණ්ඩල අනුමත ජාතික දිවා සුරැකුම් ප්‍රතිපත්තියක් තිබීම | 1. ප්‍රතිපත්තිය එළි දැක්වීම<br>2. ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම | 2025 | | | කා.ළ.ක.අ මා.<br>ජා.ළ.ආ.අ. | 0.400 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | | 1.1.3. ආයතනික ප්‍රතිපත්තියක් වර්ධනය කිරීම මඟින් ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ | 1.1.3.1. 1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරී පනතේ | 1.1.3.1.1. ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ ආයතනික ප්‍රතිපත්තිය සකස් කිරීම | ප්‍රතිපත්ති ලේඛනය | ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ ආයතනික ප්‍රතිපත්තිය පවතී<br>ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම | 1. කමිටුවක් පත් කිරීම<br>2. සාහිත්‍ය සමාලෝචනය<br>3. සංකල්ප පත්‍රය සකස් කිරීම<br>4.පාර්ශවකරුවන්ගේ සාකච්ඡාව | 2025 | | | ජා.ළ.ආ.අ. | 0.300 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | දැක්ම සහ මෙහෙවර සහතික කිරීම | 14 වැනි වගන්තිය ක්‍රියාත්ම-ක කිරීමේ ලුහුඬුතා | | | | 5.පාර්ශවකරුවන් ගේ එකඟතාව<br>6. ප්‍රතිපත්ති කෙටුම්පත් කිරීම<br>7. ආමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කිරීම<br>8. ප්‍රතිපත්තිය එළි දැක්වීම | | | | | | |
| | 1.2. නීති | රැකවරණය, ආරක්ෂාව සහ බාලවයස්කාර යුක්තිය පිණිස ප්‍රතිචාර දැක්වීම සඳහා ඵලදායී සහ යාවත්කාලීන නීතිමය රාමුවක් සහතික කිරීම | නීති වර්තමාන අවශ්‍යතා සපුරාල-න්නේ නැත | 1.2.1.1.1. 1998 අංක 50 ජාතික ළමා ආරක්ෂක අධිකාරී පනත සමාලෝචනය කර සංශෝධනය කිරීම | සංශෝධනය කරන ලද ජාතික ළමා ආරක්ෂක අධිකාරී පනත | ප්‍රධාන නිර්දේශ සහිත සමාලෝචනය වාර්තාව<br><br>සංශෝධිත ජාතික ළමා ආරක්ෂක අධිකාරී පනත පවතී | 1. කමිටුවක් පත් කිරීම.<br>2. සමාලෝචනය පැවැත්වීම.<br>3. සංශෝධන පනත කෙටුම්පත් කිරීම<br>4.නීති කෙටුම්පත් සම්පාදක වෙත ඉදිරිපත් කිරීම<br>5. බලාත්මක කිරීම සඳහා ඉදිරිපත් කිරීම | | 2025 - 2027 | | ජා.ළ.ආ.අ. | 0.500 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | | | | 1.2.1.1.2. කැපකරු රැකවරණය පිළිබඳ නීති කෙටුම්පත් කිරීම | කැපකරු රැකවරණය පිළිබඳ පනත | කැපකරු රැකවරණ පනත පවතී. | 1. කමිටුවක් පත් කිරීම.<br>2. සමාලෝචනය පැවැත්වීම.<br>3. සංශෝධන පනත කෙටුම්පත් කිරීම<br>4.නීති කෙටුම්පත් සම්පාදක වෙත ඉදිරිපත් කිරීම<br>5. බලාත්මක කිරීම සඳහා ඉදිරිපත් කිරීම | | 2024 - 2026 | | ජා.ළ.ආ.අ. | 0.400 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 1.2.1.1.3. විවිධ නීති සම්පාදනයන්හි ළමයින්ගේ වයස පිළිබඳ විෂමතාව වෙනස් කිරීම සඳහා නීතිමය ප්‍රතිසංස්කරණ සමාලෝචනය කිරීම, සංශෝධනය කිරීම සහ හඳුන්වාදීම | “ළමයා“ යන නිර්වචනය යාවත්කාලීන කර ඇති නීති | සියලුම ප්‍රධාන නීති සම්පාදනය තුළ “ළමයා“නිර්වචන යේ පෙළගැස්ම සහ අනුකූලතාව | 1. කමිටුවක් පත් කිරීම.<br>2. සමාලෝචනය පැවැත්වීම.<br>3. සංශෝධන පනත කෙටුම්පත් කිරීම<br>4.නීති කෙටුම්පත් සම්පාදක වෙත ඉදිරිපත් කිරීම<br>5. බලාත්මක කිරීම සඳහා ඉදිරිපත් කිරීම | 2025 | | | ජා.ළ.ආ.අ. | 0.100 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | | | | 1.2.1.1.4. පිරිමි ළමයින් ලිංගික අපයෝජන වැරදි සම්බන්ධයෙන් නීතිමය ප්‍රතිපාදනවල ඇති හිඩැස් සමාලෝචනය කිරීම සහ ආමන්ත්‍රණය කිරීම | ලුහුඬුතා ආමන්ත්‍රණය කිරීම සහ ප්‍රතිසංස්කරණ පිණිස අධිකරණ අමාත්‍යාංශය වෙත යොමු කරන ලද සමාලෝචන වාර්තා හා නිර්දේශ | මූලික නිර්දේශ සහිත සමාලෝචනය වාර්තා පවතී | 1. කමිටුවක් පත් කිරීම.<br>2. සමාලෝචනය කිරීම.<br>3. සමාලෝචන වාර්තාව සකස් කිරීම<br>4. අධිකරණ අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීම | 2025 | | | ජා.ළ.ආ.අ. | 0.300 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | | | | 1.2.1.1.5.කායික දණ්ඩනය පිළිබඳ නීතිමය ප්‍රතිපාදනවල ඇති හිඩැස් සමාලෝචනය කිරීම සහ ආමන්ත්‍රණය කිරීම | ලුහුඬුතා ආමන්ත්‍රණය කිරීම සහ ප්‍රතිසංස්කරණ පිණිස අධිකරණ අමාත්‍යාංශය වෙත යොමු කරන ලද සමාලෝචන වාර්තා හා නිර්දේශ | මූලික නිර්දේශ සහිත සමාලෝචනය වාර්තා පවතී | 1. කමිටුවක් පත් කිරීම.<br>2. සමාලෝචනය කිරීම.<br>3. සමාලෝචන වාර්තාව සකස් කිරීම<br>4. අධිකරණ අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීම | | 2025 - 2027 | | ජා.ළ.ආ.අ. | 0.300 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 1.2.1.1.6. 2005 අංක 34 දරන ගෘහස්ථ හිංසනය වැළැක්වීමේ පනත සමාලෝචනය කිරීම | ලුහුඬුතා ආමන්ත්‍රණය කිරීම සහ ප්‍රතිසංස්කරණ පිණිස අධිකරණ අමාත්‍යාංශය වෙත යොමු කරන ලද සමාලෝචන වාර්තා හා නිර්දේශ | මූලික නිර්දේශ සහිත සමාලෝචනය වාර්තා පවතී | 1. කමිටුවක් පත් කිරීම.<br>2. සමාලෝචනය කිරීම.<br>3. සමාලෝචන වාර්තාව සකස් කිරීම<br>4. අධිකරණ අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීම | | 2025 - 2027 | | ජා.කා.ක.<br><br>ශ්‍රී. ල. කා.කා. | 0.250 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | | | | 1.2.1.1.7. ළමයින්ට එරෙහි සයිබර් අපරාධ ආමන්ත්‍රණය කරන නීති වැඩිදියුණු කිරීමට නිර්දේශ ඉදිරිපත් කිරීම | ලුහුඬුතා ආමන්ත්‍රණය කිරීම සහ ප්‍රතිසංස්කරණ පිණිස අධිකරණ අමාත්‍යාංශය වෙත යොමු කරන ලද සමාලෝචන වාර්තා හා නිර්දේශ | මූලික නිර්දේශ සහිත සමාලෝචනය වාර්තා පවතී | 1. කමිටුවක් පත් කිරීම<br>2. පර්යේෂණ සාක්ෂි අධ්‍යයනය කිරීම<br>3. නිර්දේශ සංවර්ධනය<br>4. අධිකරණ අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීම | | 2025 - 2027 | | ජා.ළ.ආ.අ.<br><br>ළ.කා.අ.නි. කො. | 0.100 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | 1.3 රෙගු-ලාසි | 1.3.1.ජාතික ළමා ආරක්ෂණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සහ දිස්ත්‍රික් මට්ටමින් බහු ආංශික සම්බන්ධීකර-ණය | 1.3.1.1. ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණ-වල ලුහුඬුතා | 1.3.1.1.1. දිස්ත්‍රික් ළමා ආරක්ෂණ තාක්ෂණික කමිටු සංයුතිය, කාර්යයභාරය බලතල, නියාමනය සහ ඇගයීම සම්බන්ධයෙන් රෙගුලාසියක් නිකුත් කිරීම | අදාළ රෙගුලාසි / චක්‍රලේඛ සකස් කර ඇත | අදාළ රෙගුලාසි සහ චක්‍රලේඛ පවතී | 1. කමිටුවක් පත් කිරීම.<br>2. තක්සේරුවක් පැවැත්වීම.<br>3. රෙගුලාසි / චක්‍රලේඛය සකස් කිරීම<br>4. රෙගුලාසි / චක්‍රලේඛය සඳහා අදාළ අනුමැතිය ලබා ගැනීම<br>5. රෙගුලාසි / චක්‍රලේඛය නිකුත් කිරීම | 2025 | | | ජා.ළ.ආ.අ. | 0.400 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 1.3.1.1.2.<br>1998 අංක 50 ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පනතේ 14 වගන්තිය යටතේ කාර්යයන් නියාමනය කිරීම සඳහා රෙගුලාසි සකස් කිරීම | අදාළ රෙගුලාසි / චක්‍රලේඛ සකස් කර ඇත | අදාළ රෙගුලාසි සහ චක්‍රලේඛ පවතී | 1. කමිටුවක් පත් කිරීම.<br>2. සමාලෝචනය පැවැත්වීම.<br>3. රෙගුලාසි / චක්‍රලේඛය සකස් කිරීම<br>4. රෙගුලාසි / චක්‍රලේඛයේ අදාළ අනුමැතිය ලබා ගැනීම<br>5. රෙගුලාසි / චක්‍රලේඛය නිකුත් කිරීම | | 2025 - 2027 | | ජා.ළ.ආ.අ. | 0.300 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | | | | 1.3.1.1.3.<br>ළමා ආරක්ෂාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා රෙගුලාසි සකස් කිරීම | අදාළ රෙගුලාසි / චක්‍රලේඛ සකස් කර ඇත | අදාළ රෙගුලාසි සහ චක්‍රලේඛ පවතී | 1. කමිටුවක් පත් කිරීම.<br>2. තක්සේරුවක් පැවැත්වීම.<br>3. රෙගුලාසි / චක්‍රලේඛය සකස් කිරීම<br>4. රෙගුලාසි / චක්‍රලේඛයේ අදාළ අනුමැතිය ලබා ගැනීම<br>5. චක්‍රලේඛය/ රෙගුලාසි නිකුත් කිරීම | | 2025 - 2027 | | ජා.ළ.ආ.අ. | 0.250 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | | | | 1.3.1.1.4.<br>ළමා ආරක්ෂණ අරමුදලක් සඳහා රෙගුලාසි සකස් කිරීම. | අදාළ රෙගුලාසි / චක්‍රලේඛ සකස් කර පවතී | අදාළ රෙගුලාසි සහ චක්‍රලේඛඇත | 1. කමිටුවක් පත් කිරීම.<br>2. තක්සේරුවක් පැවැත්වීම.<br>3. රෙගුලාසි / චක්‍රලේඛය සකස් කිරීම<br>4. රෙගුලාසි / චක්‍රලේඛයේ අදාළ | | 2025 - 2027 | | ජා.ළ.ආ.අ. | 0.250 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | අනුමැතිය ලබා ගැනීම<br>5. චක්‍රලේඛය/ රෙගුලාසි නිකුත් කිරීම | | | | | | |
| | | | | 1.3.1.1.5. ජනමාධ්‍ය ප්‍රවෘත්ති වාර්තාකරණය (වෙළඳ දැන්වීම් සහ වැඩසටහන් ඇතුළුව) නියාමනය පිළිබඳ රෙගුලාසි සකස් කිරීම | අදාළ රෙගුලාසි / චක්‍රලේඛ සකස් කර ඇත | ජනමාධ්‍ය ප්‍රවෘත්ති නියාමනය සම්බන්ධයෙන් අදාළ රෙගුලාසි සහ චක්‍රලේඛ පවතී | 1. කමිටුවක් පත් කිරීම.<br>2. තක්සේරුවක් පැවැත්වීම.<br>3. රෙගුලාසි / චක්‍රලේඛය සකස් කිරීම<br>4. රෙගුලාසි / චක්‍රලේඛය සඳහා අදාළ අනුමැතිය ලබා ගැනීම<br>5. චක්‍රලේඛය/ රෙගුලාසි නිකුත් කිරීම. | | 2025<br>-<br>2027 | | ජා.ළ.ආ.අ.<br><br>කා.ළ.ක.අ මා.<br><br>සෞ.ජ.මා. අමා. | 0.500 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | | | | 1.3.1.1.6. “සිත්සවිය” වැඩසටහන සඳහා ජාතික පද්ධතියක් සකස් කිරීම | අදාළ චක්‍රලේඛ සකස් කර ඇත | "සිත්සවිය" ජාතික වැඩසටහන සඳහා අදාළ රෙගුලාසි සහ චක්‍රලේඛ පවතී. | 1. කමිටුවක් පත් කිරීම.<br>2. තක්සේරුවක් පැවැත්වීම.<br>3. රෙගුලාසි / චක්‍රලේඛය සකස් කිරීම<br>4. රෙගුලාසි / චක්‍රලේඛය සඳහා අදාළ අනුමැතිය ලබා ගැනීම<br>5. චක්‍රලේඛය/ රෙගුලාසි නිකුත් කිරීම | | 2025<br>-<br>2027 | | ජා.ළ.ආ.අ. | 0.400 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1.4 ක්‍රියාත්මක කිරීම | 1.4.1. යාන්ත්‍රණ සංවර්ධනය කිරීම මඟින් ළමා ආරක්ෂණ ක්‍රියාකාරකම්වල ක්‍රියාත්මක කිරීමේ ලුහුඬුතා ආමන්ත්‍රණය කිරීම | 1.4.1.1. යුක්තිය පසිඳලීමේ පද්ධතිය තුළ ළමයින්ට දඬුවම් නියම කිරීමේදී නිසි ප්‍රමිතීන් සහ ඒකාකාරිත්වය නිසි මාර්ගෝපදේශ නොමැත | 1.4.1.1.1.ළමා වැරදිකරුවන්ට දඬුවම් නියම කිරීමේදී විනිශ්වයකරුවන්ට සහාය වීම සඳහා දඬුවම් නියම කිරීමේ මාර්ගෝපදේශය සකස් කිරීම | මාර්ගෝපදේශ සකස් කරන ලදී | විනිසුරුවන් සඳහා දඬුවම් නියම කිරීමේ මාර්ගෝපදේශ ලබා ගත හැකි වීම | 1. කමිටුවක් පත් කිරීම.<br>2. තක්සේරුවක් පැවැත්වීම.<br>3. මාර්ගෝපදේශ සකස් කිරීම<br>4. මාර්ගෝපදේශ සඳහා අදාළ අනුමැතිය ලබා ගැනීම<br>5. මාර්ගෝපදේශ නිකුත් කිරීම | | 2025 - 2027 | | ජා.ළ.ආ.අ. | 0.500 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | | | 1.4.1.2. කාන්තාවන්ට එරෙහි වෙනස්කම් තුරන් කිරීම පිළිබඳ කාරක සභාව නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිළිබඳ පැහැදිලි තක්සේරුවක් නොමැත | 1.4.1.2.1. කාන්තාවන්ට එරෙහි වෙනස්කම් තුරන් කිරීම පිළිබඳ කාරක සභාවෙහි නිර්දේශිත ගැහැණු ළමයින්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් ක්‍රියාත්මක කිරීමේ ලුහුඬුතා සමාලෝචනය කර හඳුනා ගැනීම | සමාලෝචන වාර්තාව ඇත | කාන්තාවන්ට එරෙහි වෙනස්කම් තුරන් කිරීම පිළිබඳ කාරක සභාවෙහි ක්‍රියාත්මක කිරීමේ ලුහුඬුතා සහ ලුහුඬුතා අවම කිරීමට ප්‍රධාන නිර්දේශ සහිත වාර්තා සමාලෝචනය කිරීම | 1. කමිටුවක් පත් කිරීම<br>2. ද්විතීයික ලේඛන සමාලෝචනය පැවැත්වීම<br>3. බහු පාර්ශ්වකරුවන් ගේ සාකච්ඡාව<br>4.අවසන් කිරීම | | 2025 - 2027 | | ජා.ළ.ආ.අ.<br><br>ජා.කා.ක.<br><br>ශ්‍රී. ල. කා.කා.<br><br>කා.ළ.ක.අ මා. | 0.100 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 1.4.1.2.2. වීඩියෝ සාක්ෂි පිළිබඳ මාර්ගෝපදේශ සකස් කිරීම | මාර්ගෝපදේශ සකස් කරන ලදී | වීඩියෝ සාක්ෂි පිළිබඳ අනුමත මාර්ගෝපදේශ ලබා ගත හැකි වීම | 1. තක්සේරුවක් පැවැත්වීම. 2. මාර්ගෝපදේශ සකස් කිරීම 3. මාර්ගෝපදේශ සඳහා අදාළ අනුමැතිය ලබා ගැනීම 4. මාර්ගෝපදේශ නිකුත් කිරීම | 2025 | | | ජා.ළ.ආ.අ. | 0.100 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | | | | 1.4.1.2.3. ළමා හිතකාමී අධිකරණ ක්‍රියා පටිපාටි පිළිබඳ මාර්ගෝපදේශ සකස් කිරීම | මාර්ගෝපදේශ සකස් කරන ලදී | ළමා හිතකාමී අධිකරණ ක්‍රියා පටිපාටි පිළිබඳ අනුමත මාර්ගෝපදේශ පවතී | 1. තක්සේරුවක් පැවැත්වීම. 2. මාර්ගෝපදේශ සකස් කිරීම 3. මාර්ගෝපදේශ සඳහා අදාළ අනුමැතිය ලබා ගැනීම 4. මාර්ගෝපදේශ නිකුත් කිරීම | 2025 | | | ජා.ළ.ආ.අ. | 0.100 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | | | | 1.4.1.2.4. පොලිසිය සඳහා ළමුන්ට එරෙහි සංවිධානාත්මක අපරාධ විමර්ශනය කිරීම සඳහා සම්මත මෙහෙයුම් පටිපාටියක් සංවර්ධනය කිරීම | සම්මත මෙහෙයුම් පටිපාටියක් සංවර්ධනය කර ඇත | ළමා අපයෝජන විමර්ශනය සඳහා අනුමත සම්මත මෙහෙයුම් පටිපාටියක් පවතී | 1. කමිටුවක් පත් කිරීම. 2. තක්සේරුවක් කිරීම 3. සම්මත මෙහෙයුම් පටිපාටියක් සකස් කිරීම 4. සම්මත මෙහෙයුම් පටිපාටිය සඳහා අනුමැතිය ලබා ගැනීම 5. සම්මත මෙහෙයුම් පටිපාටිය නිකුත් කිරීම | | 2025 - 2027 | | ජා.ළ.ආ.අ. ශ්‍රී. ල.පො. | 0.300 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 1.4.1.2.5. ප්‍රතිපත්තියේ අදාළ උප වගන්තිවලට අනුව ජාතික ළමා ආරක්ෂණ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ සහ නියාමනය කිරීමේ යාන්ත්‍රණය ස්ථාපිත කිරීම. | යාන්ත්‍රණය ස්ථාපිත කර ඇත | ජාතික ළමා ආරක්ෂණ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සහ නියාමනය කිරීම සහතික කිරීම සඳහා පද්ධතියක් | 1. උපදේශන පැවැත්වීම<br>2.යාන්ත්‍රණය සංවර්ධනය කිරීම<br>3.යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීම | 2025 | | | ජා.ළ.ආ.අ. | 0.500 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | | | | 1.4.1.2.6. මහාධිකරණවල ළමා අපචාර නඩු නිරීක්ෂණය කිරීමට යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම | යාන්ත්‍රණයක් සංවර්ධනයක් කරන ලදී | මහාධිකරණවල ළමා අපචාර නඩු නිරීක්ෂණය කිරීම සඳහා පද්ධතියක් ඇත ප්‍රායෝගිකව ක්‍රියාත්මකවේ | 1. උපදේශන පැවැත්වීම<br>2. යාන්ත්‍රණය සංවර්ධනය කිරීම<br>3. යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීම | | 2025 - 2027 | | ජා.ළ.ආ.අ. | 1.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | | | | 1.4.1.2.7. "සුරැකි පියස" යාන්ත්‍රණයක් සමාලෝචනය කර සංවර්ධනය කිරීම | යාන්ත්‍රණය සංවර්ධනය කරන ලදී | "සුරැකි පියස" අනුමත යාන්ත්‍රණයක් තිබීම | 1. උපදේශන පැවැත්වීම<br>2. යාන්ත්‍රණය සංවර්ධනය කිරීම<br>3. යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීම | | 2025 - 2027 | | ජා.කා.කා.<br><br>ප.ළ.ර.සේ. දෙ.<br><br>අ.සා.වි.ආ. කි.ජා.අ. | 0.500 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | | | | 1.4.1.2.8. මුල් ළමා විය සංවර්ධනය ප්‍රතිපත්තිය 2004 නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම. | ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ඇත | ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් තිබීම | 1. කමිටුවක් පත් කිරීම<br>2. පරිචය හා සාහිත්‍ය විමර්ශන කිරීම<br>3. ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම<br>4.පාර්ශවකරුවන් | | 2025 - 2027 | | මු.ළ.ස.පි. ජා.ලේ.කා. | 0.400 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | ගේ වලංගුකරණය<br>5. අවසන් කිරීම සහ එළි දැක්වීම | | | | | | |
| | | | | 1.4.1.2.9<br>ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පනතට අනුව විදේශීය රජයන් සහ ජාත්‍යන්තර සංවිධාන සමඟ සම්බන්ධීකරණය කිරීමේ යාන්ත්‍රණයක් සංවර්ධනය කිරීම | යාන්ත්‍රණය සංවර්ධනය කර ඇත | විදේශීය රජයන් සහ ජාත්‍යන්තර සංවිධානය සමඟ සම්බන්ධීකරණය කිරීම සඳහා ප්‍රායෝගික ක්‍රමවේදයක් ක්‍රියාත්මකව පවතී | 1. උපදේශන පැවැත්වීම<br>2. යාන්ත්‍රණය සංවර්ධනය කිරීම<br>3. යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීම | | 2025<br>-<br>2027 | | ජා.ළ.ආ.අ.<br><br>ළ.කා.අ.නි. කො. | 0.400 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | | | | 1.4.1.2.10.<br>ළමා අපචාර (ළමා අපයෝජකයන්ට අදාළ තොරතුරු) අපරාධකරුවන් සම්බන්ධයෙන් අපරාධ වැළැක්වීමේ ආඥාපනත ක්‍රියාත්මක කිරීම සමාලෝචනය කිරීම | සමාලෝචනය පවත්වන ලදී | සමාලෝචන වාර්තාව ලබාගත හැක | 1. කමිටුවක් පත් කිරීම<br>2. සමාලෝචනය පැවැත්වීම<br>3. සමාලෝචන වාර්තාව සකස් කිරීම<br>4. අධිකරණ අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීම | | 2025<br>-<br>2027 | | ළ.කා.අ.නි. කො.<br><br>ආ.වි.දෙ. | 0.400 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | | | | 1.4.1.2.11.<br>ජාතික විකල්ප රැකවරණ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා යාන්ත්‍රණයක් සකස් කිරීම | යාන්ත්‍රණය සංවර්ධනය කරන ලදී | පවුල් වෙන්වීම වැළැක්වීම සහ ළමයින් නැවත එක් කිරීම පිළිබඳ ප.ළ.ර.සේ.දෙ. වාර්තා කරයි<br><br>විකල්ප රැකවරණ | 1. පළාත් ක්‍රියාකාරී සැලැස්ම අවසන් කිරීම<br>2. ජාතික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම<br>3. නියාමනය සඳහා කමිටුවක් | 2025 | | | ප.ළ.ර.සේ. දෙ. | 0.400 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය නිරීක්ෂණය කිරීමට යාන්ත්‍රණයක් තිබීම | පත් කිරීම | | | | | | |
| | | | | 1.4.1.2.12. ගිවිසුම් බැඳීම් වලට ප්‍රතිචාර දැක්වීමට යාන්ත්‍රණයක් සකස් කිරීම | යාන්ත්‍රණය සංවර්ධනය කරන ලදී | ගිවිසුම් බැඳීම්වලට ප්‍රතිචාර දැක්වීමට යාන්ත්‍රණයක් තිබීම<br><br>ගිවිසුම් වාර්තා ඉදිරිපත් කිරීම | 1. ගිවිසුම් බැඳීම් සම්බන්ධව ගැඹුරු අධ්‍යනයක් තිබීම හා ගැටළු ආමන්ත්‍රණය කිරීමට විකල්ප සංවර්ධනය කිරීම<br>2. අන්තර් ක්ෂේත්‍ර අතර දැනුවත්භාවය සහ සහයෝගීතාව | | | 2025 - 2029 | කා.ළ.ක.අ මා. | 0.500 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | | | | 1.4.1.2.13. ළමා අයිතීන් පිළිබඳ කමිටු පද්ධති යාන්ත්‍රණය සමාලෝචනය කිරීම සහ ශක්තිමත් කිරීම | 1.ළමා අයිතීන් පිළිබඳ අධීක්ෂණ යාන්ත්‍රණය හා සම්බන්ධ පාර්ශවකරුවන් සංඛ්‍යාව<br>2. ආරක්ෂාව සඳහා ළමයාගේ අයිතිය නියාමනය කිරීම සඳහා ගෙන ඇති නව පියවර සංඛ්‍යාව | අඛණ්ඩ නියාමන වාර්තා | 1.සියලුම පාර්ශව-කරුවන් සමඟ ජාල ගත වීම<br>2. නව මැදිහත්වීම් නිර්වචනය කිරීම<br>3. ගෙන ඇති ක්‍රියාමාර්ග සමාලෝචනය කිරීම | | 2025 - 2027 | | ප.ළ.ර.සේ. දෙ. | 0.250 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | | | | 1.4.1.2.14. පළාත් පරිවාස පද්ධතිය සමඟ සම්බන්ධීකරණය කිරීමට යාන්ත්‍රණයක් සකස් කිරීම | 1.යාන්ත්‍රණය සංවර්ධනය කරන ලදී | පළාත් පරිවාස පද්ධතිය සම්බන්ධීකරණය කිරීම සඳහා පද්ධතියක් තිබීම<br><br>කාර්තුමය ප්‍රගති | 1. පාර්ශවකරුවන් සහ සම්පත් පුද්ගලයින් නිර්වචනය කිරීම<br>2. බහු පාර්ශ්වකරුවන් ගේ උපදේශන | | 2025 - 2027 | | ප.ළ.ර.සේ. දෙ. | 0.200 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | වාර්තා ලබා ගැනීමේ හැකියාව තිබීම | 3. සොයාගැනීම් විශ්ලේෂණය කිරීම<br>4. නිර්දේශ මත පදනම් වූ පද්ධතියක් ස්ථාපිත කිරීම | | | | | | |
| 2. සම්ම-තයන් සහ අගය-න් | | 2.1. ළමා කටයුතු අංශයේ වෘත්තිකයන් සහ කාර්ය මණ්ඩලය ළමයින් සමඟ කටයුතු කළ යුතු ආකාරය පිළිබඳ ළමා හිතකාමී ආචාර ධර්ම පද්ධතියක් හඳුන්වාදීම | 2.1.1. ළමා ආරක්ෂණ කටයුතුව-ළදී ළමා ආරක්ෂාව පිළිබඳ ගැටළු හා සිද්ධීන් | 2.1.1.1. ක්ෂේත්‍රයේ විෂය පථයට අයත් සියලුම ආයතනවල ළමා ආරක්ෂාව සම්බන්ධ විශේෂ ආචාර ධර්ම පද්ධතියක් හඳුන්වා දීම. | 1. වෘත්තිකයන්, ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නිලධාරීන් හා ළමා ආරක්ෂාවට අදාළ අනෙකුත් නිළධාරින් සඳහා ළමා ආරක්ෂාව පිළිබඳ ආචාර ධර්ම පද්ධතියක් පවතී | අනුමත චර්යා ධර්ම සංග්‍රහය සම්මත කර ගැනීම පිළිබඳ ප්‍රගති වාර්තා | 1. කමිටුවක් පත් කිරීම<br>2. සාහිත්‍ය විමර්ශනය<br>3. සංකල්ප පත්‍රිකා සකස් කිරීම<br>4. පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා කිරීම<br>5. පාර්ශ්වයන්ගේ කැමැත්ත<br>6. ආචාර ධර්ම කෙටුම්පත් කිරීම<br>7. අනුමැතිය ලබා ගැනීම<br>8. ආචාර ධර්ම සංග්‍රහය එළි දැක්වීම<br>9. භාවිතය/ අනුගමනය කිරීම | | | 2025 - 2029 | කා.ළ.ක.අ මා. | 0.400 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | | | | 2.1.1.2. ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් නියම කර ඇති නිශ්චිත අවශ්‍යතා සපුරාලන ළමා ආරක්ෂණ ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම සඳහා ළමුන් | රෙගුලාසි සහ මාර්ගෝපදේශ සංවර්ධනය කරන ලදී | පවතින රෙගුලාසි සහ මාර්ගෝපදේශ | 1. තක්සේරුවක් කිරීම<br>2. මාර්ගෝපදේශ සකස් කිරීම<br>3. මාර්ගෝපදේශ සඳහා අදාළ අනුමැතිය ලබා ගැනීම<br>4. මාර්ගෝපදේශ නිකුත් කිරීම | | 2025 - 2027 | | ජා.ළ.ආ.අ. | 0.100 | |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | සමඟ වැඩ කරන සියලුම රාජ්‍ය නොවන සංවිධාන සඳහා රෙගුලාසි සකස් කිරීම. | | | | | | | | | |
| | | 2.2<br>සෑම විටම ළමයාගේ උපරිම යහපත සලකා බලා ළමයින් සම්බන්ධයෙ-න් තීරණ ගත යුතුය | 2.2.1.<br>තීරණ ගැනීමේදී බොහෝ අවස්ථාව-ලදී ළමයාගේ උපරිම යහපත සැලකිල්-ලට නොගනී | 2.2.1.1<br>ළමුන් සම්බන්ධයෙන් පරිපාලන, ව්‍යවස්ථාදායක සහ අධිකරණ තීන්දු වලදී ළමයාගේ යහපත තීරණය කිරීම සඳහා සාමාන්‍ය පොදු රාමුවක් සකස් කිරීම | සාමාන්‍ය රාමුව සංවර්ධනය කරන ලදී<br><br>රාමුව භාවිතයෙන් සිදු කරන උපරිම යහපත තීරණය කරන ක්‍රියා හඳුනාගැනීමේ නිර්ණායක | සාමාන්‍ය රාමුව භාවිතා කර ඇති අවස්ථා පිළිබඳ වාර්තා | 1.උපදේශන පැවැත්වීම<br>2.සාමාන්‍ය රාමුවක් සංවර්ධනය කිරීම<br>3. ක්ෂේත්‍රය හරහා නියමු වැඩසටහනක් පැවැත්වීම<br>4. රාමුව අවසන් කිරීම | | 2025<br>-<br>2027 | | ජා.ළ.ආ.අ.<br><br>අධි.ජා.ඒ.අ මා.<br>. | 0.100 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | | 2.3.<br>මහජනතාවට සපයනු ලබන සේවාවන්හි ගුණාත්මක බව සහතික කිරීම | 2.3.1.<br>කාර්යක්-ෂමතාව සහ පාරිභෝ-ගික තෘප්තිය පිළිබඳ තොරතුරු ප්‍රමාණවත් නොවීම | 2.3.1.1.<br>සේවාදායක තෘප්තිය සඳහා පැමිණිලි යාන්ත්‍රණයක් හරහා ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් සපයනු ලබන සේවාවන් නියාමනය කිරීමට පද්ධතියක් සංවර්ධනය කිරීම | 1.පැමිණිලි යාන්ත්‍රණය සකස් කර ඇත<br>2. ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව සහ ඒවාට ප්‍රතිචාර දක්වා ඇති පැමිණිලි සංඛ්‍යාව | පැමිණිලි යාන්ත්‍රණයක් හරහා ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් සපයනු ලබන සේවාවන් නියාමනය කිරීමට පද්ධතියක් ක්‍රියාත්මක වේ<br><br>කාර්තුමය ප්‍රගති වාර්තා | 1. පද්ධති සමාලෝචනය<br>2. පැමිණිලි යාන්ත්‍රණය සංවර්ධනය<br>3. පැමිණිලි යාන්ත්‍රණය පිළිබඳව දැනුවත් කිරීම | | 2025<br>-<br>2027 | | ජා.ළ.ආ.අ. | 0.250 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | 2.4.<br>සමාජ හැසිරීම් සහ චර්යා විපර්යාස සන්නිවේදනය (SBCC) මඟින් ළමයාගේ යහපැවැත්ම සහතික කිරීම | 2.4.1.<br>ළමයාට ගරු නොකරයි සහ සමාජය මඟින් ළමයාගේ හඬ අගය නොකරයි | 2.4.1.1.<br>"ළමයාට ගරු කිරීම" පිළිබඳ සමාජ සහ චර්යා විපර්යාස සන්නිවේදනය පිළිබඳ ව්‍යාපාරයක් සංවර්ධනය කිරීම | සමාජ හැසිරීම සහ චර්යා විපර්යාස සමඟ සම්බන්ධ පුද්ගලයින් සංඛ්‍යාව | උපදේශන ද්‍රව්‍ය මාධ්‍ය සන්නිවේදනය මහජන ප්‍රතිපෝෂණය<br><br>නිගමන වාර්තා | 1. කමිටුව පත් කිරීම<br>2. තාක්ෂණික රැස්වීම් පැවැත්වීම<br>3. සමාජ සහ චර්යා විපර්යාස උපදේශන උපාය මාර්ග සංවර්ධනය කිරීම.<br>4. ව්‍යාපාරයට සමාජ සහ චර්යා විපර්යාස යටතේ අයත් ක්‍රියාකාරී සැලැස්මක් සහ ක්‍රියාකාරකම් සැලසුම් කිරීම.<br>5. ක්‍රියාකාරකම් නියාමනය කිරීම | | | 2025<br>-<br>2029 | ජා.ළ.ආ.අ.<br><br>ප.ළ.ර.සේ.දෙ. | 10.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | | | | 2.4.1.2.<br>ළමා හිතකාමී ගම්මාන සංකල්පය ස්ථාන 25ක නියමු වැඩසටහන් කිරීම | ළමා හිතකාමී ගම්මාන සංකල්පය සම්මත කරගත් ගම්මාන සංඛ්‍යාව<br><br>නියමු මුල පිරීම් ඇගයීම | ප්‍රගති වාර්තා | 1. ළමා හිතකාමී ගම්මාන පිහිටුවීමේ ක්‍රමවේදය අධ්‍යයනය කිරීම<br>2. සුදුසු ස්ථාන තේරීම<br>3. ක්‍රමවේදය පිළිබඳව නිලධාරීන් පුහුණු කිරීම<br>4. නියමු වැඩසටහන් ආරම්භ කිරීම<br>5. ක්‍රියාවලිය අඛණ්ඩව නියාමනය කිරීම | | | 2025<br>-<br>2029 | කා.ළ.ක.අ මා.<br><br>ප.ළ.ර.සේ.දෙ.<br><br>ජා.ළ.ආ.අ.<br><br>මු.ළ.ස.පි.<br>ජා.ලේ.කා. | 10.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 2.4.1.3<br>නියාමන, ඇගයුම්, වගවීම් සහ ඉගෙනුම් උපාය මාර්ගය (MEAL) ශක්තිමත් කිරීම සඳහා යාන්ත්‍රණයක් සැකසීම | 1. පැවැත්වූ තාක්ෂණික රැස්වීම් සංඛ්‍යාව<br>2. නිර්වචනය කරන ලද නිර්දේශ සංඛ්‍යාව සමග සංවර්ධිත උපායමාර්ගය<br>3. සංවර්ධනය කරන ලද ව්‍යාපෘති යෝජනා සංඛ්‍යාව<br>4. නියාමන, ඇගයුම්, වගවීම් සහ ඉගෙනුම් වැඩසටහන ක්‍රියාත්මක කරන ප්‍රදේශය/ ලේකම් කොට්ඨාස සංඛ්‍යාව | ප්‍රගති වාර්තා | 1.තාක්ෂණික රැස්වීම් පැවැත්වීම<br>2.උපාය සංවර්ධනය කිරීම<br>3.ව්‍යාපෘති යෝජනා සංවර්ධනය කිරීම<br>4. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම | | 2025<br>-<br>2027 | | කා.ළ.ක.අ මා.<br><br>ප.ළ.ර.සේ. දෙ.<br><br>ජා.ළ.ආ.අ.<br><br>මු.ළ.ස.පි. ජා.ලේ.කා. | 0.100 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| 3.<br>මාපිය සහ රැකව-රණ සපය-න්නා-ගේ සහාය | | 3.1.<br>දෙමාපිය කුසලතා ශක්තිමත් කිරීම මඟින් ළමයින්ට ප්‍රමාණවත් රැකවරණයක් සහ ආරක්ෂාවක් සහතික කිරීම | 3.1.1.<br>දුර්වල මාපිය කුසලතා සහ භාවිතයන් ළමයින් ගේ රැකවරණ-ය සහ ආරක්ෂාව සඳහා අවදානමට දායක වේ | 3.1.1.1.<br>අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ සහයෝගයෙන් හැකියාවන් සපිරි දෙමාපියභාවය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් සැලසුම් කිරීම සහ පැවැත්වීම | 1. වැඩසටහන් මොඩියුලය<br>2. පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව<br>3. ප්‍රතිලාභී දෙමාපියන් / දැනුවත් කිරීම් ලබාගත් දෙමාපියන් සහ රැකබලාගන්න-න් සංඛ්‍යාව | වැඩසටහන් මොඩියුලය තිබීම<br><br>ව්‍යාපෘති ප්‍රගති වාර්තා | 1. දැනුවත් කිරීමේ වැඩසටහනේ මොඩියුලය සකස් කිරීම.<br>2. පුහුණුකරුවන් / සම්පත් පුද්ගලයින් පුහුණු කිරීම<br>3. වැඩසටහන් පැවැත්වීම | | | 2025<br>-<br>2029 | ජා.ළ.ආ.අ.<br><br>ප.ළ.ර.සේ. දෙ.<br><br>මු.ළ.ස.පි. ජා.ලේ.කා.<br><br>අ.උ.අ.වෘ.අ . අමා. | 12.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 3.1.1.2.<br>ආබාධ සහිත ළමයින් රැකබලා ගන්නන් සඳහා හැකියාවන් සපිරි දෙමාපිභාවය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් සැලසුම් කිරීම සහ පැවැත්වීම | 1. වැඩසටහන් මොඩියුලය<br>2. කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන්<br>3. දෙමාපියන් සහ රැකබලාගන්න-න් සඳහා පවත්වනු ලබන වැඩසටහන් සංඛ්‍යාව<br>4. මාපියන්/ රැකබලා ගන්නන් සංඛ්‍යාව | වැඩසටහන් මොඩියුලය තිබීම<br><br>කාර්ය මණ්ඩල පුහුණු විෂය මාලාව<br><br>ප්‍රගති වාර්තා | 1. සම්පත් පුද්ගලයින් හඳුනා ගැනීම<br>2. දැනුවත් කිරීමේ වැඩසටහනේ මොඩියුලය සකස් කිරීම.<br>2. පුහුණුකරුවන් / සම්පත් පුද්ගලයින් පුහුණු කිරීම<br>3. වැඩසටහන් පැවැත්වීම | | | 2025<br>-<br>2029 | ජා.ළ.ආ.අ.<br><br>ප.ළ.ර.සේ. දෙ.<br><br>මු.ළ.ස.පි. ජා.ලේ.කා.<br><br>ආ.ස.පු.ස. ජා.ම.ලේ. කා. | 3.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | | | | 3.1.1.3.<br>ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ තාක්ෂණික සහ නියාමනය සහාය ඇතිව අවදානමට ලක්විය හැකි, අවදානම් සහිත, ආන්තික සහ ඇස නොගැටෙන ළමයින් සිටින පවුල් සඳහා පවුල ශක්තිමත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | 1. සකස් කරන ලද උපාය මාර්ග සහ ව්‍යාපෘති සංඛ්‍යාව<br>2. කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන්<br>3. දෙමාපියන් සඳහා පවත්වනු ලබන වැඩසටහන් සංඛ්‍යාව<br>4. සහභාගී වූ පවුල් සංඛ්‍යාව | වැඩසටහන් මොඩියුලය තිබීම කාර්ය මණ්ඩල පුහුණු විෂය මාලාව<br><br>ප්‍රගති වාර්තා | 1. පුහුණු කරුවන් පුහුණු කිරීමේ දැනුවත් කිරීමේ වැඩසටහන සඳහා මොඩියුලය සකස් කිරීම.<br>2. පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම. | | | 2025<br>-<br>2029 | ජා.ළ.ආ.අ.<br><br>ප.ළ.ර.සේ. දෙ.<br><br>මු.ළ.ස.පි. ජා.ලේ.කා.<br><br>ශ්‍රී. ල. කා.කා. | 8.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 4. ප්‍රති-වාර සහ සහාය සේවා | | 4.1. ළමා වින්දිතයින්ට සහ අවදානම් සහිත ළමයින්ට ප්‍රතිචාර දැක්වීමේ සහ සහාය දැක්වීමේ හැකියාව ශක්තිමත් කිරීම | 4.1.1. සෑම ළමයෙකු-ටම සේවාවන් සමව හා සාධාරණ-ව ළඟා නොවීම | 4.1.1.1."දිරිය" ජාතික මනෝ සමාජීය ආධාර වැඩසටහන පුළුල් කිරීම සහ පැවැත්වීම | වැඩසටහන මඟින් ප්‍රතිලාභ ලබා දුන් සංඛ්‍යාව<br><br>සාර්ථකව නිම කළ සිද්ධි සංඛ්‍යාව | ප්‍රගති වාර්තාව | 1. වැඩසටහන් උපාය මාර්ග සහ වැඩසටහන් රාමුව සමාලෝචනය කර යාවත්කාලීන කිරීම<br>2. ක්ෂේත්‍ර නිලධාරීන් පුහුණු කිරීම සහ උපදේශනය කිරීම<br>3. පුද්ගල සත්කාර සැලසුම් අනුව මනෝ සමාජීය සහය ලබාදීම | | | 2025 - 2029 | ජා.ළ.ආ.අ. | 5.500 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | | | | 4.1.1.2. ළමා ආරක්ෂණ නිලධාරීන් සඳහා ළමා ආරක්ෂණ සිද්ධි කළමනාකරණ මාර්ගෝපදේශ සකස් කිරීම | සකස් කරන ලද ළමා ආරක්ෂණ සිද්ධි කළමනාකරණ මාර්ගෝපදේශ<br><br>පුහුණු වූ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නිලධාරීන් සංඛ්‍යාව | මාර්ගෝපදේශ පවතී | 1.උපදේශන පැවැත්වීම<br>2. මාර්ගෝපදේශ කෙටුම්පත් කිරීම<br>3. නියමු වැඩසටහන් පැවැත්වීම<br>4. මාර්ගෝපදේශ අවසන් කිරීම<br>5. ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ කාර්ය මණ්ඩලය සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම | 2025 | | | ජා.ළ.ආ.අ. | 0.100 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 4.1.1.3. කාර්යක්ෂමව සහ ඵලදායීව 1929 ළමා උපකාරක දුරකථන සේවාව වෙත ලැබෙන පැමිණිලි භාර ගැනීම සහ ඒවාට ප්‍රතිචාර දැක්වීම | ලැබුණු පැමිණිලි සංඛ්‍යාව<br><br>ප්‍රතිචාර දැක්වූ පැමිණිලි සංඛ්‍යාව | මාසික ප්‍රගති වාර්තා | 1. නිරන්තර පුහුණු සමාලෝචන<br>2. වැඩිදියුණු කිරීමේ සැලසුම්<br>3. නියාමනය සහ අඛණ්ඩ වැඩිදියුණු කිරීම | | | 2025 - 2029 | ජා.ළ.ආ.අ. | 0.500 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | | | | 4.1.1.4. 1929 ළමා ආරක්ෂණ යෙදුම් සඳහා ලැබෙන පැමිණිලි කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස භාර ගැනීම සහ ප්‍රතිචාර දැක්වීම | ලැබුණු පැමිණිලි සංඛ්‍යාව<br><br>ප්‍රතිචාර දැක්වූ පැමිණිලි සංඛ්‍යාව | මාසික ප්‍රගති වාර්තා | 1. නිරන්තර පුහුණු සමාලෝචන<br>2. වැඩිදියුණු කිරීමේ සැලසුම්<br>3. නියාමනය සහ අඛණ්ඩ වැඩිදියුණු කිරීම | | | 2025 - 2029 | ජා.ළ.ආ.අ. | 0.500 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | | | | 4.1.1.5. සයිබර් ආවේක්ෂණ කාර්යක්‍ෂමව සහ ඵලදායී ලෙස පැවැත්වීම | අනාවරණය වූ පැමිණිලි සංඛ්‍යාව<br><br>ප්‍රතිචාර දැක්වූ පැමිණිලි සංඛ්‍යාව | මාසික ප්‍රගති වාර්තා | 1. නිරන්තර පුහුණු සමාලෝචන<br>2. වැඩිදියුණු කිරීමේ සැලසුම්<br>3. නියාමනය සහ අඛණ්ඩ වැඩිදියුණු කිරීම | | | 2025 - 2029 | ජා.ළ.ආ.අ. | 0.500 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | | | | 4.1.1.6. වීඩියෝ සාක්ෂි පටිගත කිරීම කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස පැවැත්වීම | ලැබුණු පැමිණිලි සංඛ්‍යාව<br><br>ප්‍රතිචාර දැක්වූ පැමිණිලි සංඛ්‍යාව | මාසික ප්‍රගති වාර්තා<br>වීඩියෝ පටිගත කිරීම් | 1. නිරන්තර පුහුණු සමාලෝචන<br>2. වැඩිදියුණු කිරීමේ සැලසුම්<br>3. නියාමනය සහ අඛණ්ඩ වැඩිදියුණු කිරීම | | | 2025 - 2029 | ජා.ළ.ආ.අ. | 0.500 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 4.1.1.7.<br>ළමා රැකවරණ පහසුකම් සපයන ආයතන නියාමනය | නියාමනය කරන ලද ආයතන සංඛ්‍යාව | කාර්තුමය ප්‍රගති වාර්තා | 1. නියාමන රාමුව සංවර්ධනය කිරීම<br>2. නියාමනය කිරීම<br>3. පාර්ශවකරුවන් සමඟ ඉගෙනුම් බෙදා ගැනීම<br>4. පාඨමාලා නිවැරදි කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම | | | 2025<br>-<br>2029 | ජා.ළ.ආ.අ. | 0.600 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | | | | 4.1.1.8.<br>ළමයින්ට පාසලට පැමිණීමට සහය වීම සහ පාසල් හැර ගිය අය නැවත පාසලට ඒකාබද්ධ කිරීම | පාසල් හැර යාමේ සිද්ධීන් අනාවරණය වූ සංඛ්‍යාව<br><br>ප්‍රතිචාර දැක්වූ පැමිණිලි සංඛ්‍යාව | කාර්තුමය නියාමන වාර්තා | 1. සිද්ධි කළමනාකරණය මඟින් හඳුනාගන්නා ලද ළමයි සංඛ්‍යාව ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වෙත වාර්තා කිරීම | | | 2025<br>-<br>2029 | ජා.ළ.ආ.අ.<br><br>ප.ළ.ර.සේ.දෙ. | 0.500 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | | | | 4.1.1.9.<br>ප්‍රවාහන අමාත්‍යාංශය, අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ පාසල් ප්‍රවාහන සේවා නියාමනය කිරීම | පාසල් ප්‍රවාහන සේවා නියාමනය සඳහා ක්‍රියාකාරී යාන්ත්‍රණයක් තිබීම | සංවර්ධනය කරන ලද නියාමන පද්ධතිය<br><br>සකස් කරන ලද නියාමන පද්ධතිය | 1. නියාමන රාමුව සංවර්ධනය කිරීම<br>2. නියාමනය කිරීම<br>3. පාර්ශවකරුවන් සමග ඉගෙනුම් බෙදා ගැනීම<br>4. පාඨමාලා නිවැරදි කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම | | | 2025<br>-<br>2029 | ජා.ළ.ආ.අ.<br><br>අ.උ.අ.වෘ.අ. අමා.<br><br>ප්‍ර.ම.ව.සි.ගු.සේ.අමා. | 1.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | | | | 4.1.1.10.<br>පළමු වාර්තාව මත පදනම්ව අපයෝජනයට ගොදුරු වූවන් | ක්ෂණික මනෝ සමාජීය සහය සේවාව ලබාදීම සඳහා ක්‍රියාකාරී යාන්ත්‍රණයක් | සංවර්ධිත යාන්ත්‍රණය ප්‍රගති වාර්තා | 1. ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වෙත ලැබුණු පැමිණිලි හරහා හඳුනාගත් | | | 2025<br>-<br>2029 | ජා.ළ.ආ.අ. | 0.700 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | සඳහා මනෝ සමාජීය සහාය | තිබීම<br><br>මනෝ සමාජීය සහය සේවාව ලබාදෙන ලද ළමයින් සංඛ්‍යාව | | ළමයින්<br><br>2. මැදිහත්වීම<br><br>3.නියාමනය | | | | | | |
| | | 4.2 ප්‍රජාව තුළ ළමුන් මුහුණ-දෙන අවදානම් අවම කිරීම සඳහා ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම කාලෝචිත හා බලපෑමෙන් යුත් ප්‍රතිචාර දැක්වීමෙන් ළමයින්ට එරෙහි සාහසිකත්වය වැළැක්වීම සහතික කිරීම | 4.2.1. ප්‍රජා මූලික ළමා අයිතිවාසි-කම් ආරක්ෂණ පද්ධති හරහා ළමා අයිතිවාසි-කම් සුරැකීමේ සිද්ධි කළමනා-කරණය සඳහා වෙන් කර ඇති සම්පත් ප්‍රමාණවත් නොවීම | 4.2.1.1. ළමා අයිතිවාසිකම් සුරැකීමේ සිද්ධි කළමනාකරණය තාක්ෂණික හා මූල්‍යමය වශයෙන් ශක්තිමත් කිරීම | ප්‍රාදේශීය මට්ටමින් ළමා අයිතිවාසිකම් සුරැකීමේ සිද්ධි කළමනාකරණ-ය සඳහා මූල්‍ය ආධාර සඳහා සුදුසුකම් සඳහා නිර්ණායක සකස් කර ඇත<br><br>ළමා අයිතිවාසිකම් සුරැකීමේ සිද්ධි කළමණාකරණ හරහා ප්‍රතිචාර දැක්වූ අවස්ථා සංඛ්‍යාව | නිර්ණායක සංවර්ධනය කිරීම සහ බෙදාහැරීම<br><br>මූල්‍ය ආධාර සඳහා තෝරාගත් පැමිණිලි<br><br>අරමුදල් මාරු කිරීමේ වාර්තා<br><br>ප්‍රගති වාර්තා | 1. පෙර සිද්ධි කළමනාකරණ සමාලෝචනය<br>2. අරමුදල් සඳහා නිශ්චිත නිර්ණායක සකස් කිරීම<br>3. නිර්ණායක බෙදා හැරීම<br>4. ලැබුණු සත්කාර සැලසුම් සමාලෝචනය<br>5. අරමුදල් වෙන් කිරීම<br>6. සිද්ධියේ ප්‍රගතිය සමාලෝචනය කිරීම | | | 2025<br>-<br>2029 | ප.ළ.ර.සේ.දෙ. | 20.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | | 4.2. ළමාරක්ෂක ආයතනවල සිටින ළමයින්ගේ රැකවරණය සහ ආරක්ෂාව සහතික කිරීම, | 4.2.1. ළමා නිවාසවල පහසුකම්-වල දුර්වල තත්ත්වය සහ ළමා නිවාසවල | 4.2.1.1. ළමා සංවර්ධන මධ්‍යස්ථාන සඳහා අවම ප්‍රමිතීන් ඇතුලත් මාර්ගෝපදේශ සකස් කිරීම | සකස් කරන ලද මාර්ගෝපදේශ<br><br>ප්‍රතිලාභී ළමා සංවර්ධන මධ්‍යස්ථාන සංඛ්‍යාව | ප්‍රකාශිත මාර්ගෝපදේශ<br><br>බෙදා හැරීමේ වාර්තා | 1. කමිටුවක් පත් කිරීම<br>2. තක්සේරුවක් කිරීම<br>3. මාර්ගෝපදේශය සකස් කිරීම<br>4. මාර්ගෝපදේශ | 2025 | | | ජා.ළ.ආ.අ. | 5.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | පවතින යාන්ත්‍රණයන් ශක්තිමත් කිරීම | දුර්වල ළමා රැකවරණ හා ආරක්ෂණ ප්‍රමිතීන් | | | | සඳහා අදාළ අනුමැතිය ලබා ගැනීම<br>5. මාර්ගෝපදේශ බෙදා හැරීම | | | | | | |
| | | | | 4.2.1.2.<br>ළමා රැකවරණ ආයතන වල ළමයින්ගේ රැකවරණ වැඩිදියුණු කිරීම සහ ආරක්ෂාව ඇති කිරීම සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරිය සහ පරිවාස සහ ළමා රක්ෂක සේවා දෙපාර්තුමේන්තු-ව අතර සම්බන්ධීකරණය | සංශෝධනය සඳහා හඳුනාගෙන ඇති ලුහුඬුතා සංඛ්‍යාව<br><br>යාන්ත්‍රණය දියුණු කිරීම,<br><br>නියමු වැඩසටහන් කිරීම සහ අවසන් කිරීම | ළමාරක්ෂක ආයතනවල ළමයින් රැකබලා ගැනීම සහ ආරක්ෂා කිරීම සඳහා සංශෝධිත පද්ධතියක්<br><br>ප්‍රගති වාර්තා | 1. පවතින ක්‍රියාමාර්ග සහ මාර්ගෝපදේශ සමාලෝචනය කර ලුහුඬුතා හඳුනා ගැනීම<br>2.උපදේශන පැවැත්වීම<br>3.යාන්ත්‍රණයක් සංවර්ධනය කිරීම<br>4. පළාත් සමඟ යාන්ත්‍රණය නියමු වැඩසටහන් කිරීම<br>5. යාන්ත්‍රණය අවසන් කිරීම සහ අනුගත කිරීම | | | 2025<br>-<br>2029 | ප.ළ.ර.සේ. දෙ.<br><br>ජා.ළ.ආ.අ. | 5.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | | 4.3<br>නව ආයතනික කටයුතු හඳුන්වා දෙමින් ළමා ආරක්ෂණ විෂය ක්ෂේත්‍රයේ මනෝවිද්‍යා-වේ වර්ධනය සහතික කිරීම | | 4.3.1.1.<br>ළමා ආරක්ෂාව පිළිබඳ ළමා මනෝවිද්‍යාව සඳහා ජාතික මධ්‍යස්ථානයක් පිහිටුවීම මඟින් ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ ආයතනික ධාරිතාව වර්ධනය කිරීම | ජාතික මධ්‍යස්ථානය පිහිටුවා ඇත | ජාතික මධ්‍යස්ථානය විවෘතව ඇත සහ ක්‍රියාත්මක වේ | 1. බහුආංශික ප්‍රවේශයක් හරහා විෂය පථ සමාලෝචනයක් කිරීම<br>2.මූල්‍ය, මානව සම්පත් සහ යටිතල පහසුකම් සුරක්ෂිත කිරීම.<br>3. විෂයමාලා සංවර්ධනය<br>4. නීතිමය තත්ත්වය පවත්වා | | | 2025<br>-<br>2029 | ජා.ළ.ආ.අ. | 100.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | සහ ළමා ආරක්ෂාව පිළිබඳ පර්යේෂණ, පුහුණු සහ ප්‍රතිපත්ති සංවර්ධනය | | | ගැනීම | | | | | | |
| | | | 4.3.2.<br>01.ආපදා අවදානම් අවම කිරීමේදී ළමා අවශ්‍යතා සහ ගැටළු පිළිබඳ අඩු සංවේදී-තාව<br><br>02. ආපදා අවදානම් අවම කිරීමේදී ළමුන්ගේ අඩු සහභාගී-ත්වය<br><br>03.ළමයි-න් ආපදාවල-ට ගොදුරු-වීමේ ඉහළ අවදානම | 4.3.2.1.<br>ආපදා අවදානම් අවම කිරීම සඳහා ළමයින් සමඟ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය සහ පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තු-ව එක්ව යාන්ත්‍රණයක් සැකසීම. | 1. ළඟා වූ ළමුන් සංඛ්‍යාව<br><br>2. පවත්වන ලද පුහුණුවීම් සංඛ්‍යාව<br><br>3. සංවර්ධනය කරන ලද පුහුණු මෙවලම් සංඛ්‍යාව සහ වර්ග | ආපදා අවදානම් අවම කිරීම ගැන වැඩසටහන් මොඩියුලය තිබීම<br><br>පුහුණු විෂය මාලාව<br><br>ප්‍රගති වාර්තා | 1. සම්පත් / සම්පත් දායකයින් හඳුනා ගැනීම<br>2. දැනුවත් කිරීමේ වැඩසටහනේ මොඩියුලය සකස් කිරීම.<br>3. පුහුණුකරුවන් / සම්පත් පුද්ගලයින් පුහුණු කිරීම<br>3. දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම<br>4. පවතින ආපදා අවදානම් අවමකිරීමේ යාන්ත්‍රණය සමඟ සම්බන්ධීකරණය | | | 2025<br>-<br>2029 | ප.ළ.ර.සේ.දෙ.<br><br>කා.ළ.ක.අමා.<br><br>ජා.ළ.ආ.අ.<br><br>මු.ළ.ස.පි.ජා.ලේ.කා. | 10.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

| | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | 4.3.3. 01.වීදිවල ජීවත් වන ළමයින්-ගේ ඉහළ අවදානම<br><br>02. සමාජ අපරාධ සිදු කිරීමට වීදිවල ජීවත් වන ළමුන්ගේ ඉහළ අවදානම<br><br>03. වැළැක්වීම සඳහා මනා සම්බන්ධීකරණ යාන්ත්‍රණයක් නොමැතිකම | 4.3.3.1. වීදිවල ජීවත්වන ළමුන් සඳහා විශේෂ සත්කාර මධ්‍යස්ථාන/ඇතුළත්වීමේ මධ්‍යස්ථාන ඇති කරලීම | 1. සංවර්ධනය කරන ලද හෝ පිහිටුවා ඇති මධ්‍යස්ථාන සංඛ්‍යාව<br>02. පුහුණු කරන ලද රැකවරණ දෙන්නන් සංඛ්‍යාව<br>03. පුහුණු කරන ලද පොලිස් නිලධාරීන් සංඛ්‍යාව | වීදි ළමයින් සඳහා විශේෂ සත්කාර මධ්‍යස්ථාන/ඇතුළත්වීමේ මධ්‍යස්ථාන තිබීම<br><br>පුහුණු විෂය මාලාව<br><br>ප්‍රගති වාර්තා | 1. භෞතික අවශ්‍යතා සැපයීම<br>2. ආරක්ෂිත අවකාශයන් හඳුනා ගැනීම.<br>3. ක්‍රියාකාරීත්වය සඳහා මාර්ගෝපදේශ සකස් කිරීම.<br>4. පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම<br>5. මනෝ සමාජීය පහසුකම් සැපයීම<br>6. අධ්‍යාපනික පහසුකම් සැපයීම<br>7. නිසි ලියකියවිලි පවත්වාගෙන යාම.<br>8. සෞඛ්‍ය සායන සහ පහසුකම් සැපයීම<br>9. පවුල් සමඟ නැවත එක්වීම<br>10. පෝෂණ ආහාර සඳහා ප්‍රතිපාදන | | | 2025 - 2029 | ප.ළ.ර.සේ. දෙ. | 5.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | | | 4.3.4. අදාළ ආයතන විසින් සමාජ ආරක්ෂණය ඒකාබද්ධ කිරීමට | 4.3.4.1. ළමුන් සඳහා සමාජ ආරක්ෂණ වැඩසටහන ඒකාබද්ධ කිරීම සහ නියාමනය කිරීම සඳහා යාන්ත්‍රණයක් සංවර්ධනය කිරීම | 1. පැවැත්වූ සාකච්ඡා සංඛ්‍යාව<br>2. සංවර්ධිත ක්‍රමවත් යාන්ත්‍රණය<br>3. සංවර්ධිත තොරතුරු කළමනාකරණ | ප්‍රතිපත්ති පත්‍රිකාව ලබා ගැනීමේ හැකියාව/ ක්‍රියාකාරී යාන්ත්‍රණය/ තොරතුරු සහ කළමනාකරණ පද්ධතිය ලබා ගැනීමේ හැකියාව ප්‍රගති වාර්තා | 1. සාකච්ඡා සහ උපදේශන පැවැත්වීම<br>2. ප්‍රතිපත්ති පත්‍රිකාව සකස් කිරීම<br>3. යාන්ත්‍රණය සංවර්ධනය කිරීම<br>4. යාන්ත්‍රණය | | | 2025 - 2029 | අමාත්‍යාංශය ඇතුළු සියලු ආයතන | 9.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | සහ නියාමනය කිරීමට විධිමත් යාන්ත්‍රණයක් නොමැතිවීම | | ය සහ දත්ත පදනම | | සඳහා අනුමැතිය ලබා ගැනීම<br>3. තොරතුරු සහ කළමනාකරණ පද්ධතිය සංවර්ධනය කිරීම<br>4. දීමනාව ලබා දීම<br>5. දීමනාව නිදහස් කිරීම | | | | | | |
| | | | | 4.3.1.2. 2019 වර්ෂයේ ළමා සංවර්ධන මධ්‍යස්ථාන සමීක්ෂණයේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම | නිර්දේශ මත පදනම්ව ගන්නා ලද ක්‍රියාමාර්ග සංඛ්‍යා | ප්‍රගති වාර්තා / රැස්වීම් වාර්තා | 1. නිර්දේශ සමාලෝචනය කිරීම.<br>2. වහාම අවධානය යොමු කිරීම සඳහා ඉහළ ප්‍රමුඛතාවයක් ඇති ක්ෂේත්‍ර තේරීම.<br>3. ක්‍රියාත්මක කිරීම | 2025 | | | ප.ළ.ර.සේ. දෙ. | 5.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | | | | 4.3.1.3. පරත්ත ජාතික උපදේශන හා පුහුණු මධ්‍යස්ථානය ශක්තිමත් කිරීම. | සංවර්ධනය කරන ලද සම්මත ක්‍රියාපටිපාටි පවත්වන ලද සේවා වැඩිදියුණු සංඛ්‍යාව වැඩසටහන් සංඛ්‍යාව<br><br>ශක්තිමත් කිරීම සඳහා ගෙන ඇති පරිපාලන ක්‍රියාමාර්ග | ප්‍රගති වාර්තා සංවර්ධනය කරන ලද සම්මත ක්‍රියාපටිපාටි<br><br>ක්‍රියාකාරි සැලසුම | 1. සංවර්ධනය කරන ලද ක්‍රියා සම්මත පටිපාටි<br>2. සේවාවන්හි ලුහුඬුතා සමාලෝචනය කර හඳුනාගැනීම<br>3. වැඩිදියුණු කිරීම සඳහා අයවැය සහිත සැලසුම් සකස් කිරීම<br>4. සැලසුම් ක්‍රියාත්මක කිරීම. | | 2025 - 2027 | | ප.ළ.ර.සේ. දෙ. | 5.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 5. අධ්‍යා-පනය සහ ජීවන කුස-ලතා | | 5.1 උපදේශනය මගින් ළමා ආරක්ෂාව සඳහා ඵලදායී සහභාගීත්වය සහතික කිරීම | 5.1.1 ළමා ආරක්‍ෂාව සහ ළමා අයිතිවාසි-කම් සම්බන්ධ-යෙන් හඳුනාගත් දැනුම් ලුහුඬුතා | 5.1.1.1. ළමා ආරක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියේ සියලුම පාර්ශවකරුවන් සඳහා ළමා අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය සහ ළමා ආරක්ෂාව පිළිබඳ උපදේශන වැඩසටහනක් සංවර්ධනය කිරීම සහ පැවැත්වීම | 1. වැඩසටහන් මොඩියුලය සංවර්ධනය කිරීම.<br>2. පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව | වැඩසටහන් මොඩියුලය තිබීම පුහුණු විෂය මාලාව ප්‍රගති වාර්තා | 1. දැනුවත් කිරීමේ වැඩසටහනේ මොඩියුලය සකස් කිරීම<br>2. පුහුණුකරුවන් / සම්පත් දායකයින් පුහුණු කිරීම<br>3. වැඩසටහන් පැවැත්වීම | | 2025 - 2027 | | ජා.ළ.ආ.අ.<br>ප.ළ.ර.සේ. දෙ. | 0.500 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | | | | 5.1.1.2. සාමාන්‍ය ජනතාව සඳහා ළමා අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය සහ ළමා ආරක්ෂාව පිළිබඳ උපදේශන වැඩසටහනක් සංවර්ධනය කිරීම සහ පැවැත්වීම | 1. දෛනික හැසිරීම් වෙනස් කිරීමේ සන්නිවේදනය පිළිබඳ ව්‍යාපාරය සංවර්ධනය<br>2. පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව<br>3. ප්‍රතිලාභී පුද්ගලයින් සංඛ්‍යාව | ව්‍යාපාර උපාය මාර්ග<br>ප්‍රගති වාර්තා<br>සහභාගිවන්නන්-ගේ දත්ත | 1. උපදේශන උපාය මාර්ගය සහ සැලසුම් සකස් කිරීම.<br>2. උපදේශන වැඩසටහන සංවර්ධනය කිරීම.<br>3. වැඩසටහන් පැවැත්වීම | | 2025 - 2027 | | ජා.ළ.ආ.අ.<br>ප.ළ.ර.සේ. දෙ. | 0.500 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | | | | 5.1.1.3. දැනට පවතින මාර්ගෝපදේශ සමාලෝචනය කිරීම සහ ජාතික ළමා අරක්ෂක | වැඩිදියුණු කළ ළමා අරක්ෂාව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් | අනුමත සංශෝධිත ළමා අරක්ෂාව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් තිබීම | 1. මාර්ගෝපදේශ සමාලෝචනය කිරීම.<br>2. ප්‍රායෝගික සාක්ෂි සමාලෝචනය | | 2025 - 2027 | | ජා.ළ.ආ.අ. | 0.250 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | අධිකාරිය විසින් පවත්වනු ලබන ළමා අරක්ෂාව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා අවශ්‍ය සංශෝධන සිදු කිරීම | | | කිරීම.<br>3. අවශ්‍ය සංශෝධන කිරීම. | | | | | | |
| | | | | 5.1.1.4.<br>ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය සහ ළමා ආරක්ෂණය පිළිබඳ ළමුන් සඳහා උද්දේශන වැඩසටහනක් සංවර්ධනය කිරීම සහ පැවැත්වීම | 1. සංවර්ධන කරන ලද හැකියා,හැසිරීම් වෙනස් කිරීමේ සන්නිවේදන ව්‍යාපාර සංවර්ධනය කිරීම<br>2. පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව<br>3. ප්‍රතිලාභී ළමුන් සංඛ්‍යාව | වැඩසටහන් මොඩියුලය තිබීම ප්‍රගති වාර්තා | 1. උද්දේශන උපාය මාර්ගය සහ සැලසුම් සකස් කිරීම.<br>2. උද්දේශන වැඩසටහන සංවර්ධනය කිරීම.<br>3. වැඩසටහන් පැවැත්වීම | | 2025<br>-<br>2027 | | ජා.ළ.ආ.අ.<br><br>ප.ළ.ර.සේ.දෙ. | 1.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | | | | 5.1.1.5.<br>ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය සහ ළමා ආරක්ෂණය පිළිබඳ තොරතුරු අධ්‍යාපන සන්නිවේදන මෙවලම් සංවර්ධනය කිරීම (බ්‍රේල් සහ සංඥා භාෂාව ඇතුළුව) | සංවර්ධනය කරන ලද තොරතුරු අධ්‍යාපන සන්නිවේදන මෙවලම් සංඛ්‍යාව සහ වර්ග | තොරතුරු අධ්‍යාපන සන්නිවේදන මෙවලම් (ආවරණය පිළිබඳ ප්‍රගති වාර්තා) | 1. සාකච්ඡා පැවැත්වීම සහ මෙවලම් නිර්මාණය<br>2 තොරතුරු අධ්‍යාපන සන්නිවේදන මෙවලම් සැකසීම.<br>3. තොරතුරු අධ්‍යාපන සන්නිවේදන මෙවලම් බෙදා හැරීම. | | 2025<br>-<br>2027 | | ජා.ළ.ආ.අ.<br><br>ප.ළ.ර.සේ.දෙ. | 1.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 5.1.1.6. ජාතික ළමා අරක්ෂක අධිකාරිය සම්පත් මධ්‍යස්ථානය සංවර්ධනය කිරීම. | ජාතික ළමා අරක්ෂක අධිකාරියේ සම්පත් මධ්‍යස්ථානය ක්‍රියාත්මක කිරීම. | සම්පත් මධ්‍යස්ථානය ක්‍රියාත්මක කිරීම. | 1. මානව, මූල්‍ය සහ අනෙකුත් සම්පත් ලබා ගැනීම<br>2. මධ්‍යස්ථානය සඳහා සංකල්ප සටහනක් සහ මෙහෙයුම් රාමුවක් සකස් කිරීම<br>3. අවශ්‍ය තාක්ෂණික පහසුකම්වලින් මධ්‍යස්ථානය සමන්විත වීම. | | | 2025 - 2029 | ජා.ළ.ආ.අ. | 4.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | | | | 5.1.1.7. පාසල් ළමා ආරක්ෂක කමිටු ස්ථාපනය සහ පවත්වාගෙන යාම | ක්‍රියාත්මක වන පාසල් ළමා ආරක්ෂක කමිටු සංඛ්‍යාව<br><br>පාසල් ළමා ආරක්ෂක කමිටු විසින් පවත්වනු ලැබූ වැඩසටහන් සංඛ්‍යාව | ප්‍රගති වාර්තා / නියාමන වාර්තා | 1. පද්ධතිය සංවර්ධනය කිරීම<br>2. අදාළ කටයුතු සිදු කිරීම<br>3. පද්ධතිය ඇගයීම | | | 2025 - 2029 | ජා.ළ.ආ.අ.<br><br>අ.උ.අ.වෘ.අ. අමා. | 2.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | | | | 5.1.1.8. ගැහැණු ළමයින් සවිබල ගැන්වීම සඳහා උද්දේශන වැඩසටහන් සංවර්ධනය කිරීම | සංවර්ධනය කළ උද්දේශන වැඩසටහන් සංඛ්‍යාව<br><br>ප්‍රතිලාභී ගැහැණු ළමුන් සංඛ්‍යාව | ප්‍රගති වාර්තා / නියාමන/ අධීක්ෂණ වාර්තා | 1.උද්දේශන පැවැත්වීම සහ වැඩසටහන් සැලසුම් කිරීම<br>2. වැඩසටහන් පැවැත්වීම<br>3. සමාලෝචනය සහ ඇගයීම | | | 2025 - 2029 | ජා.කා.ක.<br><br>ශ්‍රී. ල. කා.කා.<br><br>අ.උ.අ.වෘ.අ. අමා. | 2.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 5.1.1.9.<br>බාල වයස්කාර විවාහ වැළැක්වීම ඉලක්ක කරගත් උද්දේශන වැඩසටහනක් සකස් කිරීම | සංවර්ධනය කළ උද්දේශන වැඩසටහන් සංඛ්‍යාව<br><br>ප්‍රතිලාභී ළමුන් සහ වැඩිහිටියන් සංඛ්‍යාව | ප්‍රගති වාර්තා / අධීක්ෂණ වාර්තා | 1.උද්දේශන පැවැත්වීම සහ වැඩසටහන් සැලසුම් කිරීම<br>2. වැඩසටහන් පැවැත්වීම<br>3. සමාලෝචනය සහ ඇගයීම | | 2025<br>-<br>2027 | | ජා.ළ.ආ.අ.<br><br>ප.ළ.ර.සේ.දෙ.<br><br>ජා.කා.ක.<br><br>ශ්‍රී. ල. කා.කා. | 2.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | | | | 5.1.1.10.<br>ළමා සහභාගිත්වය වැඩි දියුණු කිරීම සඳහා ළමා සමාජ සහ ළමා සභා යාන්ත්‍රණය සමාලෝචනය කර ශක්තිමත් කිරීම. | ශක්තිමත් කර ඇති ළමා සමාජ සහ ළමා සභා සංඛ්‍යාව<br><br>අලුතින් පිහිටුවන ලද සහ සංවර්ධනය කරන ලද ළමා සමාජ සහ ළමා සභා සංඛ්‍යාව<br><br>පුහුණු කළ ළමුන් සංඛ්‍යාව<br><br>ක්‍රියාත්මක කරන ලද නිර්දේශ සංඛ්‍යාව | ප්‍රගති වාර්තා | 1. ළමා සමාජ සහ ළමා සභා පිහිටුවීම සහ ශක්තිමත් කිරීම.<br>2. ළමයින්ගේ ධාරිතා සංවර්ධනය.<br>3. ළමයින්ගේ ව්‍යාපෘති යෝජනා එකතු කිරීම. (ළමා සහභාගීත්වය සහතිකකිරීම.)<br>4. ක්‍රියාත්මක කිරීම | | | 2025<br>-<br>2029 | ප.ළ.ර.සේ.දෙ. | 6.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 6. සාක්ෂි ජන-නය කිරීම | | 6.1. ළමා ආරක්ෂණය පිළිබඳ ප්‍රතිපත්තිය, වැඩසටහන්-කරණය සහ ළමා ආරක්ෂාව පිළිබඳ අනෙකුත් සියලුම මැදිහත්වීම් සඳහා ශක්තිමත් සාක්ෂි පදනමක් සංවර්ධනය කිරීම. | 6.1.1 ජාතික මට්ටමින් ළමා ආරක්ෂාව පිළිබඳ දත්ත ග්‍රහණය කර ගැනීමට සහ ගබඩා කිරීමට යාන්ත්‍රණ-යක් නොමැත | 6.1.1.1. ළමා ආරක්ෂාව පිළිබඳ ජාතික දත්ත පදනම ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාම | ජාතික දත්ත පදනම සංවර්ධනය කර ක්‍රියාත්මක වේ | ජාතික දත්ත පදනමක් තිබීම<br><br>විශ්ලේෂණ වාර්තා | 1.පාර්ශ්වකරුවන් ගේ උපදේශනය<br>2. ජාතික දත්ත පදනම රාමුව සංවර්ධනය කිරීම.<br>3.තොරතුරු කළමනාකරණ පද්ධති (MIS) සංවර්ධනය කිරීම.<br>4. තොරතුරු කලමනාකරණ පද්ධති භාවිතය පිළිබඳ පාර්ශවකරුවන් සමඟ නිරන්තර සමාලෝචන<br>5. තොරතුරු කළමනාකරණ පද්ධති භාවිතා කිරීමට ක්ෂේත්‍ර සඳහා නිරන්තර සහයෝගය ලබා දීම.<br>6. සමාලෝචනය සහ ක්‍රියාව සඳහා නිරන්තර වාර්තා උත්පාදනය කිරීම | | | 2025 - 2029 | ජා.ළ.ආ.අ. | 5.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | | | | 6.1.1.2. ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියට අදාලව යාන්ත්‍රණයේ ජාතික දත්ත පද්ධති ක්‍රියාත්මක කිරීම | ජාතික දත්ත පද්ධති සංවර්ධනය කර ක්‍රියාත්මක වේ | ජාතික දත්ත පදනමක් තිබීම<br><br>විශ්ලේෂණ වාර්තා | 1.පාර්ශ්වකරුවන් ගේ උපදේශනය<br>2. ජාතික දත්ත පදනම රාමුව සංවර්ධනය කිරීම.<br>3.තොරතුරු කළමනාකරණ පද්ධති (MIS) | | | 2025 - 2029 | ප.ළ.ර.සේ. දෙ. | 5.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | සහ පවත්වාගෙන යාම | | | සංවර්ධනය කිරීම.<br>4. තොරතුරු කලමනාකරණ පද්ධති භාවිතය පිළිබඳ පාර්ශවකරුවන් සමඟ නිරන්තර සමාලෝචන<br>5. තොරතුරු කළමනාකරණ පද්ධති භාවිතා කිරීමට ක්ෂේත්‍ර සඳහා නිරන්තර සහයෝගයලබා දීම.<br>6. සමාලෝචනය සහ ක්‍රියාව සඳහා නිරන්තර වාර්තා උත්පාදනය කිරීම | | | | | | |
| | | | 6.1.2. ළමා ආරක්ෂණ ගැටළු සහ ඒවායේ බලපෑම පිළිබඳ ප්‍රමාණවත් නොවන පර්යේෂණ සහ අධ්‍යයන | 6.1.2.1. හඳුනාගත් ප්‍රමුඛතා ක්ෂේත්‍ර පිළිබඳ පර්යේෂණ / අධ්‍යයන පැවැත්වීම | සම්පූර්ණ කරන ලද පර්යේෂණ සංඛ්‍යාව | සම්පූර්ණ කරන ලද පර්යේෂණ වාර්තා | 1. පර්යේෂණ / අධ්‍යයනය සඳහා මාතෘකා සහ ක්‍රමවේදය නිර්ණය කිරීම<br>2. පර්යේෂණ / අධ්‍යයන පැවැත්වීම<br>3. පර්යේෂණ / අධ්‍යයන එළි දැක්වීම | | | 2025 - 2029 | ජා.ළ.ආ.අ.<br>ප.ළ.ර.සේ. දෙ.<br>ජා.කා.ක. | 10.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | | | | 6.1.2. 2. රටේ අවදානමට ලක්විය හැකි, අවදානම් සහිත, ආන්තික සහ ඇස | සංවර්ධනය කරන ලද යාන්ත්‍රණය<br>අවදානම් වර්ගය | ප්‍රගති වාර්තා / නියාමන වාර්තා | 1. අවදානම් සිතියම්කරණ අභ්‍යාසය අවසන් කිරීම<br>2. නියමු | | 2025 - 2027 | | කා.ළ.ක.අ මා. | 0.300 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | නොගැටෙන ළමයින් පිළිබඳ දත්ත රැස් කිරීමට යාන්ත්‍රණයක් සකස් කිරීම. | අනුව හඳුනාගත් ළමුන් සංඛ්‍යාව | | වැඩසටහන ගම් 25 ක සිදු කිරීම<br>3. විශ්ලේෂණ හා ඇගයීම | | | | | | |
| 7. ඇග-යුම් ක්‍රම-වේදය | | 7.1 ළමා ආරක්ෂණය පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රමානුකූලව ක්‍රියාත්මක කිරීම | | 7.1.1.1. කාර්තුමය ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම<br><br>7.1.1.2. වාර්ෂික ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම | නිරන්තර ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම්<br><br>ක්ෂේත්‍ර විශේෂිත නිර්දේශ ඉදිරිපත් කර ඇත | සමාලෝචන වාර්තා | 1.සමාලෝචන රැස්වීම් පැවැත්වීම<br><br>2. ක්ෂේත්‍ර වාර්තා විශ්ලේෂණය<br><br>3. වැඩිදියුණු කිරීම්/ ඉදිරි ක්‍රියාමාර්ග සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම | | | 2025 - 2029 | කා.ළ.ක.අ මා.<br><br>ජා.ළ.ආ.අ. | 0.100 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

# 02. ආපදා කළමනාකරණ ක්ෂේත්‍රය

**ක්ෂේත්‍රය පිළිබඳ අර්ථ දැක්වීම:**

ශ්‍රී ලංකාවේ ස්වභාවිකව සිදුවන හා මිනිසාගේ බලපෑම හේතුවෙන් සිදුවන ආපදාවන් ඵලදායී ලෙස වැළැක්වීම සහ අවම කිරීම තුළින් මිනිස් ජීවිතයේ සමගිය, සමෘද්ධිය සහ අභිමානය සඳහා පහසුකම් සැලසීමේ වගකීම ආපදා කළමනාකරණ ක්ෂේත්‍රයට පැවරී ඇත. ආපදා කළමනාකරණය සඳහා වන ප්‍රධාන ආයතනය ලෙස, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය (ආ.ක.ම.) මඟින් පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සිදු කිරීම, ආපදා අවම කිරීම, සැලසුම් සූදානම් කිරීම, අවදානමට ලක්විය හැකි ජනතාව සඳහා පූර්ව අනතුරු ඇඟවීම් නිකුත් කිරීම, හදිසි ප්‍රතිචාර දැක්වීම, අනෙකුත් ප්‍රධාන ආයතන සමඟ සහයෝගයෙන් සහන සැලසීමේ සහ පශ්චාත් ආපදා කටයුතු සම්බන්ධීකරණය සහතික කරනු ලැබේ. සමස්ත ජනගහනයටම බලපාන ආපදා කළමනාකරණ ක්‍රියාමාර්ගවල අරමුණු සහ මූලධර්ම ආපදා කළමනාකරණ ප්‍රතිපත්තිය තුළ පහත දැක්වෙන පරිදි සඳහන්ව ඇත.

- ආපදා අවදානම් කළමනාකරණය තුළ හැකියා/ධාරිතා වැඩි දියුණු කිරීම සඳහා තිරසාර යාන්ත්‍රණ, ව්‍යුහ, වැඩසටහන් හඳුන්වාදීම
- ආපදා අවදානම් කළමනාකරණය සඳහා ජාතික, කලාපීය සහ ප්‍රාදේශීය මට්ටමේ සම්බන්ධීකරණ යාන්ත්‍රණ ස්ථාපිත කිරීම සහතික කිරීම
- විශේෂ අරමුදලක් තුළින් ආපදා අවදානම් කළමනාකරණ කටයුතු සඳහා අවශ්‍ය සම්පත් සුලබතාව සහතික කිරීම
- ආර්ථික ක්‍රියාකාරකම් කඩාකප්පල්වීම හා පරිසරයට වන හානිය අවම කිරීම
- තිරසර සංවර්ධනයක් සාක්ෂාත් කර ගැනීම සඳහා සම්පත් වෙන් කිරීම ඇතුළු ආංශික සංවර්ධන වැඩසටහන්වලට ආපදා අවදානම අවම කිරීමේ කටයුතු මූලප්‍රවාහකරණය සහ ඒකාබද්ධ කිරීම
- ජීවිත සහ දේපළ සුරැකීමේ අරමුණෙන් යුතුව ශ්‍රී ලංකාවේ සිදුවන ආපදා සහ ආපදා තර්ජන සඳහා මෙන්ම ඒවාට ප්‍රතිචාර දැක්වීම සඳහා සුදුසු ක්‍රියාපටිපාටි සහ මාර්ගෝපදේශ භාවිතා කිරීම සහතික කිරීම
- මධ්‍යකාලීන හා දිගුකාලීන ප්‍රාරම්භක ප්‍රතිනිර්මාණ/ප්‍රතිසංස්කරණ සහ පුනරුත්ථාපන කටයුතුවලදී පෙරට වඩා උසස් ප්‍රමිතීන්ට අනුකූලවීම
- ආපදා අවදානම්වලට නතු ප්‍රදේශවල ඉදිකිරීම් සඳහා සැලසුම් මාර්ගෝපදේශ සහ ගොඩනැගිලි කේතයන් හඳුන්වාදීම සහතික කිරීම
- අවදානමට ලක්විය හැකි ප්‍රජාවන්ගේ ඔරොත්තු දීමේ හැකියාව වැඩිදියුණු කිරීම සඳහා ප්‍රජා මූලික ආපදා කළමනාකරණ සහ ක්ෂුද්‍ර රක්ෂණ කටයුතු ප්‍රවර්ධනය කිරීම

**ළමා ආරක්ෂාව සඳහා අදාළත්වය:**

සමකයට ආසන්නව පිහිටා තිබීම හේතුවෙන්, ශ්‍රී ලංකාව වසර පුරා උණුසුම් දේශගුණයක් අත්විඳින අතර විවිධ දේශගුණික කලාපවල මිශ්‍රණයකට හිමිකම් කියයි. ශ්‍රී ලංකාවට සුනාමි, ගංවතුර, වසංගත, සුළි කුණාටු, නියඟ, අධික වර්ෂාව, නාය යෑම් ආදී බොහෝ දේශගුණික උපද්‍රවවලට සහ ස්වභාවික විපත්වලට මුහුණ දීමට සිදුවේ. ආපදා කළමනාකරණයේදී සහ ප්‍රතිචාර දැක්වීමේදී අවදානමට ලක්විය හැකි කණ්ඩායම් කෙරෙහි අවධානය යොමු කිරීම අත්‍යවශ්‍ය බව ආපදා කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය පිළිගනු ලැබේ. ප්‍රතිපත්තියේ 13 (ඇ) වගන්තියේ සඳහන් වන ආකාරයට ‘ආපදා කළමනාකරණයේ දී ආබාධ සහිත පුද්ගලයින්, ජ්‍යෙෂ්ඨ පුරවැසියන්, රෝගීන්, ගර්භනී කාන්තාවන්, ළමුන් සහ අවතැන් වූවන් ඇතුළුව ආන්තික කණ්ඩායම් සහ විශේෂ අවශ්‍යතා ඇති හෝ වෙනත් අවදානම් සහිත පුද්ගලයින් කෙරෙහි විශේෂ සැලකිල්ලක් දැක්විය යුතුය. ආහාර සුරක්ෂිතතාව, පෝෂණය සහ ළමා ආරක්ෂාව ළමයින්ට සහාය වීමේ ප්‍රමුඛ අංග වේ. එවැනි ආධාර ළමයින්ගේ ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීමට සහ අවදානමට ලක්විය හැකි ළමයින්ට ආපදාවලින් වන බලපෑම අවම කිරීමට ඉතා වැදගත්වේ. ඊට අමතරව, ආපදා වලට ප්‍රතිචාර දැක්වීමේදී ළමයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ ප්‍රතිපත්තිය සලකා බලනු ලැබේ. ප්‍රතිපත්තියේ 21 (A) වගන්තිය මඟින් අධ්‍යාපනයට ඇති විශ්වීය අයිතිය පිළිගන්නා අතර එහිදී ආපදාවෙන් පීඩාවට පත් ළමයින්ට අවශ්‍ය අවස්ථාවලදී අඛණ්ඩ අධ්‍යාපනය සඳහා ප්‍රවේශය තිබිය යුතුය. මීට අමතරව, ආපදා කළමනාකරණ විෂය සම්බන්ධයෙන් ළමයින්ට වඩාත් දැනුවත් කිරීමේ වැදගත්කම ප්‍රතිපත්තියෙන් අවධාරණයකර ඇත.

**ආයතනික රාමුව:**

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව (කා.වි.දෙ.), ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය (ආ.ක.ම.), ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය (ජා.ගො.ප.සං.) සහ ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය (ජා.ආ.ස.සේ.ම.) යන ආයතන ආරක්ෂක අමාත්‍යාංශයේ ආපදා කළමනාකරණ අංශයේ විෂය පථය යටතේ ක්‍රියාත්මක වේ. මෙකී ආයතන විසින් සිය පළාත් සහ දිස්ත්‍රික් මට්ටමේ ක්ෂේත්‍ර නිලධාරීන් මඟින් තම කටයුතු බිම් මට්ටමෙන් ක්‍රියාත්මක වීම සහතික කරනු ලැබේ.

| උපාය මාර්ගය | | උපාය මාර්ගික අරමුණු | ගැටලුව | ප්‍රධාන ක්‍රියාකාරකම් / මැදිහත්වීම් | ප්‍රධාන කාර්ය සාධක දර්ශකය | සත්‍යාපනය කිරීමේ ක්‍රම | උප ක්‍රියාකාරකම් | වසර 1 | වසර 1-3 | වසර 1-5 | ප්‍රධාන වගකිව යුතු ආයතන | ඇස්තමේන්තුගත අයවැය (රු. මිලියන) | අරමුදල් මූලාශ්‍රය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1. නීති ක්‍රියාත්මක කිරීම සහ බලාත්මක කිරීම | 1.1 ප්‍රතිපත්තිය | 1.1.1. ආපදා කළමනාකරණ ප්‍රතිපත්තියට ළමුන් ඇතුළත් කිරීමෙන් ආපදාවකදී ළමයින්ගේ ආරක්ෂාව තහවුරු කිරීම | 1.1.1.1. පවතින ආපදා කළමනාකරණ ප්‍රතිපත්තියේ ළමා ආරක්ෂාව පිළිබඳ ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැත | 1.1.1.1.1. හදිසි අවස්ථාවලදී ළමා ආරක්ෂාව සහ ළමා කේන්ද්‍රීය ආපදා අවදානම අවම කිරීම පිළිබඳ ජාතික ආපදා කළමනාකරණ ප්‍රතිපත්තියට කොටසක් ඇතුළත් කිරීම | ආපදා කළමනාකරණ ප්‍රතිපත්තියේ ළමා ආරක්ෂාව පිළිබඳ ප්‍රමාණවත් ප්‍රතිපාදන ඇතුළත්කර ඇත | ආපදා කළමනාකරණ ප්‍රතිපත්තියේ ළමා ආරක්ෂාව පිළිබඳ විධිවිධාන | 1.ආපදා කළමනාකරණ ප්‍රතිපත්තියට ඇතුළත් කළ යුතු සංශෝධන හඳුනාගැනීම<br>2. සංශෝධන ඇතුළත් කිරීමට කටයුතු කිරීම | | 2025 - 2027 | | ආ.ක.ආ<br>ජා.ළ.ආ.අ | 0.400 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | 1.2 රෙගුලාසි | 1.2.1 ළමා විෂය භාර අමාත්‍යවරයා විසින් ආපදා කළමනාකරණ කවුන්සිලයේ සාමාජිකයකු වශයෙන් ආපදා තත්ත්වයන්හි දී ළමයින්ගේ ආරක්ෂාව සහතික කිරීම. | 1.2.1.1. ළමුන් සම්බන්ධයෙන් ප්‍රමාණවත් නියෝජනයක් නොමැති වීම | 1.2.1.1.1 ළමා විෂය භාර අමාත්‍යවරයා ජාතික ආපදා කළමනාකරණ සභාවේ සාමාජිකයකු ලෙස ඇතුළත් කරන ලෙස ඉල්ලීම | සභාවේ අනුමැතිය ලබා දී ඇත | රෙගුලාසි සකස් කර අනුමැතිය ලබා ගන්නා ලදී<br>රැස්වීම් වාර්තා | 1. විධිමත් ඉල්ලීමක් කිරීම | | 2025 - 2027 | | ආ.ක.ආ<br>කා.ළ.ක.ස.ස.අමා | 0.100 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 1.2.1.1.2. හදිසි අවස්ථා වලදී ළමා ආරක්ෂාව සහ ළමා කේන්ද්‍රගත ආපදා අවදානම් අවම කිරීම [CCDRR] පිළිබඳ තාක්ෂණික උපදේශක කමිටුවක් පත් කිරීම | කමිටුව පත් කිරීම | රැස්වීම් වාර්තා | 1. උපදේශක කමිටුවේ සංයුතිය තීරණය කිරීම<br>2. කමිටුව සඳහා විමර්ශන කොන්දේසි සංවර්ධනය කිරීම<br>3. කමිටුව පත් කිරීම | 2025 | | | ආ.ක.ආ,<br>ජා.ළ.ආ.අ<br>ජා.ගො.ප.ආ.<br>කා.වි.දෙ.<br>ජා.ආ.ස.සේ.ම. . | 0.200 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | | 1.3.2 ආපදාවන්ට ගොදුරු වූ ළමයින්ගේ අනන්‍යතා ආරක්ෂා කිරීම සහතික කිරීම | 1.3.2.1. අනවශ්‍ය ලෙස හෙළිදරව් කිරීම ළමයින් අවදානමට ලක් කරයි | 1.3.2.1.1 බලපෑමට ලක් වූ ළමුන්ගේ සහ පවුල්වල අනාරක්ෂිතතා පිළිබඳ සහඅනන්‍යතාව අනාවරණය නොකිරීම සඳහා ආපදා තත්ත්වයන් පිළිබඳ සදාචාරාත්මක වාර්තාකරණය සඳහා රෙගුලාසි සකස් කිරීම | අදාළ රෙගුලාසි සකස් කර ඇත | සදාචාරාත්මක වාර්තාකරණය පිළිබඳ අනුමත රෙගුලාසි | 1. උපදේශන පැවැත්වීම<br>2. රෙගුලාසි සකස් කිරීම<br>3. රෙගුලාසිවලට අදාළ අනුමැතිය ලබා ගැනීම | | 2025 - 2027 | | ආ.ක.ආ<br>ආ.ක.ම.,<br>ජා.ආ.ස.සේ.ම. .,<br>ජා.ළ.ආ.අ<br>සෞ.ජ.මා.අමා. | 0.300 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | 1.4 ක්‍රියාත්-මක කිරීම | 1.4.1. ආපදා සහන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ හිඩැස් ආමන්ත්‍රණය කිරීමෙන් | I.4.1.1. ආපදා සහන යාන්ත්‍රණවල ළමුන් සඳහා ප්‍රමාණවත් ප්‍රතිචාරයක් නොලැබීම (විශේෂයෙ- | I.4.1.1.1. හදිසි අවස්ථාවලදී ළමා ආරක්ෂාව සහ ළමා කේන්ද්‍රීය ආපදා අවදානම අවම කිරීම ආපදා කළමනාකරණ සැලසුම්වලට | ගැහැණු ළමයින් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින්, හදිසි අවස්ථාවන්හි | ප්‍රගති/නියාමන වාර්තා | 1. ආපදා කළමනාකරණ සැලසුම් සමාලෝචනය කිරීම, හදිසි අවස්-ථාවන්හි ළමා ආරක්ෂාවේ ප්‍රායෝගික සාක්ෂි | 2025 | | | ආ.ක.ආ<br>ආ.ක.ම.,<br>ජා.ආ.ස.සේ.ම. | 1.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ළමයින්ගේ ආරක්ෂාව තහවුරු කිරීම | න්ම ගැහැණු ළමුන්) | ඇතුළත් කිරීම | ළමා අරක්ෂාව සහ ළමා කේන්ද්‍රීය ආපදා අවදානම අවම කිරීම පිළිබිඹු කරමින් යාවත්කාලීන කරන ලද ආපදා කළමනාකරණ සැලසුම් | | සහ සාහිත්‍යය සමාලෝචනය කිරීම<br>2. ආපදා කළමනාකරණ සැලසුම්වලට හදිසි අවස්ථාවන්හි ළමා ආරක්ෂාව අන්තර්ග්‍රහණය කිරීම | | | | ජා.ළ.ආ.අ | | |
| | | | | I.4.1.1.2. හදිසි අවස්ථාවලදී ළමා ආරක්ෂාව සහතික කිරීම සහ ළමා කේන්ද්‍රීය ආපදා අවදානම අවම කිරීම දිරිගැන්වීම සඳහා දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකය සඳහා මාර්ගෝපදේශ සැකසීම සඳහා චක්‍රලේඛයක් නිකුත් කිරීම. | චක්‍රලේඛය නිකුත් කර ඇත | අනුමත චක්‍රලේඛය | 1 චක්‍රලේඛය සංවර්ධනය කිරීම<br>2. අනුමැතිය ලබා ගැනීම<br>3. චක්‍රලේඛය බෙදාහැරීම | | 2025 - 2027 | | ආ.ක.ආ<br>ආ.ක.ම.<br>ජා.ආ.ස.සේ.ම.<br>ජා.ළ.ආ.අ | 0.500 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | | | | 1.4.1.1.3 ළමා හා කාන්තා කාර්යාංශ කාන්තා නිලධාරිනියක් හෝ කාන්තා සංවර්ධන නිලධාරිනියක් පැය 24 පුරාම | සෑම අවස්ථාවකදීම කඳවුරු බිම් සඳහා අනුයුක්ත කරන ලද ළමා හා කාන්තා කාර්යාංශ | වැඩ මුර | 1. පාර්ශ්වකරුවන් සමඟ උපදේශන<br>2. යෝජනාවලියක් සංවර්ධනය කිරීම<br>3. යෝජනාවලිය සඳහා අනුමැතිය ලබා ගැනීම<br>4. යෝජනාවලිය | | | 2025 - 2029 | ආ.ක.අ<br>ආ.ක.ම.<br>ජා.ආ.ස.සේ.ම.<br>ජා.ළ.ආ. | 1.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | සෑම කඳවුරු භූමියකම සිටින බවට තහවුරු කිරීම | කාන්තා නිලධාරිනියක් සහ කාන්තා සංවර්ධන නිලධාරින් රාජකාරී ලැයිස්තුවලට ඇතුළත් කිරීම | | ක්‍රියාත්මක කිරීම | | | | අ.<br>ශ්‍රී. ල. කා.ක<br>කා.ළ.ක. අමා. | | |
| | | | | I.4.1.1.4. කඳවුරු තුළ ළමුන් සහ ළමා හිතකාමී අවකාශයන් ආරක්ෂා කිරීම සඳහා විධිවිධාන ඇතුළත් කිරීම සඳහා පවතින කඳවුරු කළමනාකරණ මාර්ගෝපදේශ සමාලෝචනය කිරීම | සංශෝධිත මාර්ගෝපදේශ පැවතීම | සංශෝධිත මාර්ගෝපදේශ | 1. පවතින මාර්ගෝපදේශ සමාලෝචනය කිරීම<br>2. ප්‍රායෝගික සාක්ෂි සමාලෝචනය කිරීම<br>3. සංශෝධන යෝජනා කිරීම<br>4. සංශෝධන ඇතුළත් කිරීම<br>5. බෙදාහැරීම | | | 2025 - 2029 | ආ.ක.ආ<br>ආ.ක.ම.,<br>ජා.ආ.ස. සේ.ම. .,<br>ජා.ළ.ආ. අ | 1.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | | | | 1.4.1.1.5. ළමා ආරක්ෂාව සහ ආරක්ෂිත අවකාශයන් පිළිබඳ පශ්චාත් ආපදා ආරක්ෂණ මධ්‍යස්ථාන කළමනාකරණය සම්බන්ධයෙන් මාර්ගෝපදේශ සකස් කිරීම | මාර්ගෝපදේශ පැවතීම | පශ්චාත් ආපදා ආරක්ෂණ මධ්‍යස්ථාන කළමනාකරණය පිළිබඳ නව මාර්ගෝපදේශ | 1. ප්‍රායෝගික සාක්ෂි සමාලෝචනය කිරීම<br>2. සාහිත්‍යය විමර්ශනය<br>3. මාර්ගෝපදේශ කෙටුම්පත් කිරීම<br>4. අනුමැතිය ලබාගැනීම සහ බෙදා හැරීම | | 2025 - 2029 | | ජා.ආ.ස. සේ.ම.<br>ජා.ළ.ආ. අ<br>ශ්‍රී.ල.කා. කා. | 0.500 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2. සම්මත-යන් සහ අගයන් | | 2.1 ආපදා කළමනාකර-ණ ක්ෂේත්‍රයේ වෘත්තිකයන් සහ කාර්ය මණ්ඩලය ළමයින් සමඟ කටයුතු කළ යුතු ආකාරය පිළිබඳ ළමා හිතකාමී ආචාර ධර්ම පද්ධතියක් හඳුන්වාදීම | 2.1.1 ආපදාවලදී මතුවන ළමා ආරක්ෂණ ගැටළු | 2.1.1.1. ආපදා කළමනාකරණයට අදාළ වෘත්තිකයන් සහ කාර්ය මණ්ඩලය සඳහා ළමා ආරක්ෂාව පිළිබඳ ආචාර ධර්ම පද්ධතිය හඳුන්වාදීම | ආපදා කළමනාකර-ණයට අදාළ වෘත්තිකයන් සහ කාර්ය මණ්ඩලය සඳහා ළමා ආරක්ෂාව සඳහා වූ ආචාර ධර්ම සංග්‍රහය | අනුමත ආචාර ධර්ම සංග්‍රහයක් තිබීම | 1.පාර්ශ්වකරුවන් සමඟ සාකච්ඡාව<br>2. පාර්ශ්වයන්ගේ එකඟතාව<br>3. ආචාර ධර්ම කෙටුම්පත් කිරීම<br>4. අනුමැතිය ලබා ගැනීම<br>5. ආචාර ධර්ම සංග්‍රහය එළිදැක්වීම | | 2025 - 2029 | | ආ.ක.ආ<br><br>ජා.ළ.ආ.අ | 0.500 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | | 2.2 ළමා ක්ෂේත්‍රයේ නිලධාරීන් ඇතුලත්ව ආපදා කළමනාකර-ණයේදී ළමුන්ගේ ආමන්ත්‍රණයක් තහවුරු කිරීම | 2.2.1. ආපදා වලදී මතුවන ළමා ආරක්ෂණ ගැටළු | 2.2.1.1. ආපදා කළමනාකරණයේ සෑම තරාතිරමකම ජාතික ළමා ආරක්ෂක අධිකාරිය සහ පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තු නිලධාරීන් ඇතුළත් කිරීමට යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම | යාන්ත්‍රණයක් ස්ථාපිත කර ක්‍රියාත්මක වේ<br><br>ආපදා කළමනාකරණයේ සෑම තරාතිරමකම තීරණ ගැනීමේදී ජාතික ළමා ආරක්ෂක අධිකාරිය සහ පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්-තු නිලධාරීන් ඇතුලත් වීම | ප්‍රගති වාර්තා | 1.පාර්ශවකරුවන් ගේ උපදේශන සහ අදහස්<br>2. යාන්ත්‍රණය සංවර්ධනය කිරීම<br>3. යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීම | | | 2024 - 2028 | ජා.ආ.ස.සේ.ම.<br><br>ජා.ළ.ආ.අ<br><br>ආ.ක.ආ<br><br>කා.ළ.ක.ස.ස.අමා<br><br>ආ.ක.ම.<br><br>ප. ළ. ර. සේ. දෙ. | 0.500 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 3. මාපිය සහ රැකවරණ සපයන්නන්ගේ සහයෝගය | | 3.1කාලෝචිත ප්‍රතිචාර දැක්වීම සඳහා පළමු ප්‍රතිචාර දක්වන්නන්, අවදානමට ලක්විය හැකි ප්‍රජාවන්ගේ මාධ්‍ය සහ අනෙකුත් අදාළ පාර්ශවකරුවන් වෙත පූර්ව අනතුරු ඇඟවීම් බෙදා හැරීම සහතික කිරීම | 3.1.1. ආපදා අවදානම් කළමනාකරණය පිළිබඳ ප්‍රජාවන්ගේ ප්‍රමාණවත් සහභාගීත්වයක් නොමැති වීම | 3.1.1.1. හදිසි අවස්ථාවලදී දැනුම හුවමාරුකර ගැනීමට සහ ළමයින් ආරක්ෂා කිරීම සඳහා ඒකාබද්ධ ආපදා අවදානම් කළමනාකරණ මැදිහත්වීම් දිරිගැන්වීම සඳහා ආපදා අවදානම් ප්‍රදේශවල සහ දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකය ජාතික ළමා ආරක්ෂක අධිකාරිය අතර සම්බන්ධතා ඇති කිරීමට යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම. | යාන්ත්‍රණය ස්ථාපිත කර ක්‍රියාත්මක වේ | ආපදා අවදානම් ප්‍රදේශවල දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකය සහ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය අතර සම්බන්ධතා ඇති කිරීමට ක්‍රමවේදයක් ක්‍රියාත්මක වේ | 1. යාන්ත්‍රණය සංවර්ධනය කිරීම<br>2. චක්‍රලේඛ නිකුත් කිරීම<br>3. ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නිලධාරීන් දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකය රැස්වීම්වලට සහභාගී වීම | 2025 | | | ආ.ක.ම.<br><br>ජා.ගො.ප.ආ.<br><br>ජා.ආ.ස.සේ.ම. .<br><br>ජා.ළ.ආ.අ | 0.400 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | | 3.2 පෙර සූදානම් වැඩසටහන් මඟින් ළමයින් සමඟ ආපදාවලට මුහුණ දීම සඳහා මිනිසුන්ගේ ධාරිතා | 3.2.1.ළමයින් සමඟ ආපදා තත්ත්වයන්ට මුහුණ දීම සඳහා ප්‍රමාණවත් කුසලතා නොමැති වීම | 3.2.1.1. ආපදා අවදානම් ප්‍රදේශවල ජාතික ළමා ආරක්ෂක අධිකාරිය සමඟ සහයෝගයෙන් දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකය හරහා හදිසි අවස්ථාවලදී | ප්‍රතිලාභ ලැබූ ළමුන් සංඛ්‍යාව<br><br>ප්‍රතිලාභ ලැබූ මාපියන් සංඛ්‍යාව<br><br>පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව | ක්‍රියාකාරකම් වාර්තා | 1. ළමයින් ඇතුළු පාර්ශවකරුවන්ගේ එකඟතාවයන්<br>2. වැඩසටහන සංවර්ධනය කිරීම<br>3. වැඩසටහන් ක්‍රියාත්මක කිරීම<br>4. වැඩසටහන් ඇගයීම | | | 2025 - 2029 | ආ.ක.ම.<br><br>ජා.ආ.ස.සේ.ම.<br><br>ජා.ළ.ආ.අ<br><br>ජා.ගො.ප.ආ. | 2.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංවර්ධනය කිරීම සහතික කිරීම | | ළමා ආරක්ෂාව පිළිබඳ දෙමාපියන් සහ රැකබලා ගන්නන් සඳහා පෙර සූදානම් කිරීමේ වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම | | | | | | | කා.වි.දෙ.<br><br>සෞ.ජ.මා.අමා.. | | |
| | | | 3.2.2. අකාර්යක්ෂම ආපදා ප්‍රතිචාර | 3.2.2.1. සහන සඳහා දායක වන සියලුම ක්‍රියාකාරීන් අතර ඒකාකාරී බව පවත්වා ගැනීම සඳහා ආපදාවලින් පීඩාවට පත් වූ ළමයින් සඳහා වයසට ගැළපෙන සහන ඇසුරුම් සඳහා මාර්ගෝපදේශය-ක් සකස් කිරීම. (උදා: නැවත පාසල් යාමේ ඇසුරුම්, සනීපාරක්ෂක ඇසුරුම්) | මාර්ගෝපදේශ සකස් කර පාර්ශවකරුවන් සමඟ සන්නිවේදනය කිරීම | ප්‍රකාශිත මාර්ගෝපදේශ<br><br>බෙදා හරින ලද වාර්තා | 1. ප්‍රායෝගික සාක්ෂි සමාලෝචනය කිරීම<br>2. බහු ආංශික උපදේශන<br>3. මාර්ගෝපදේශ සකස් කිරීම<br>4. බෙදා හැරීම | | 2025 - 2027 | | ජා.ආ.ස.සේ.ම. .,<br><br>ජා.ළ.ආ.අ<br><br>ශ්‍රී. ල. කා.කා.<br><br>සෞ.ප්‍ර.කා. | 2.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| 4. ප්‍රතිචාර සහ සහාය සේවා | | 4.1කාලෝචි-ත ප්‍රතිචාර දැක්වීම සඳහා පළමු ප්‍රතිචාර දක්වන්නන්, අවදානම් | 4.1.1. ආපදා අවදානම් අවම කිරීම ගැන ළමයින් අතර ප්‍රමාණවත් අවබෝධයක් | 4.1.1.1. ළමා කේන්ද්‍රීය ආපදා අවදානම් අවම කිරීම හරහා ළමුන් සඳහා පූර්ව අනතුරු ඇඟවීම් බෙදා හැරීමේ | හදිසි අනතුරු ඇඟවීම් බෙදා හැරීමේ යාන්ත්‍රණය ස්ථාපිත කර තිබීම | ළමුන් සඳහා හදිසි අනතුරු ඇඟවීම් බෙදා හැරීමේ යාන්ත්‍රණයක් ළමා කේන්ද්‍රීය ආපදා අවදානම් අවම කිරීමේ ක්‍රමවේදය | 1. පාර්ශ්වකරුවන්ගේ උපදේශන සහ එකඟතාවයන්<br>2. යාන්ත්‍රණය සංවර්ධනය කිරීම<br>3. යාන්ත්‍රණය | | | 2025 - 2029 | ආ.ක.ආ<br><br>ජා.ළ.ආ.අ<br><br>ආ.ක.ම. | 15.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ප්‍රජාවන්<br>මාධ්‍ය සහ<br>අනෙකුත්<br>අදාළ<br>පාර්ශවකරු-<br>වන් වෙත<br>පූර්ව අනතුරු<br>ඇඟවීමේ<br>සංඥා බෙදා<br>හැරීම<br>සහතික<br>කිරීම | නොමැති වීම | යාන්ත්‍රණයක්<br>සංවර්ධනය කිරීම | | හරහා ස්ථාපිතව<br>තිබිම<br>. | ක්‍රියාත්මක කිරීම | | | | ජා.ගො.ප<br>.ආ.<br><br>කා.වි.දෙ.<br><br>වාරිමාර්<br>ග<br>දෙපාර්ත<br>මේන්තුව | | |
| | | 4.2 ළමා<br>කේන්ද්‍රීය<br>ආපදා<br>අවදානම්<br>අවම කිරීමේ<br>ක්‍රමවේදය<br>හරහා<br>අවදානම<br>හඳුනාගැනීම<br>සහ පාසල්<br>සුරක්ෂිත<br>සැලසුම්<br>සංවර්ධනය<br>සහතික<br>කිරීම | 4.2.1.<br>ප්‍රමාණවත්<br>නොවන ළමා<br>කේන්ද්‍රීය<br>ආපදා<br>අවදානම්<br>අවම කිරීමේ<br>යාන්ත්‍රණයන් | 4.2.1.1. සියලු<br>ආකාරයේ ආපදා<br>හේතුවෙන්<br>අවදානමට<br>ලක්විය හැකි<br>ළමයින්<br>හඳුනාගෙන,<br>ආපදාවල<br>අහිතකර බලපෑම<br>අවම කිරීම සඳහා<br>සහ පාසල් ළමා<br>ආරක්ෂක කමිටු<br>සමඟ එක්ව පාසල්<br>සුරක්ෂිත සැලසුම්<br>සකස් කිරීම සඳහා<br>එක් එක්<br>දිස්ත්‍රික්/ප්‍රාදේශීය<br>සභා/ග්‍රාමීය හා<br>පාසල් අවම,<br>මධ්‍යස්ථ සහ ඉහළ<br>අවදානම් ලෙස<br>වර්ගීකරණය<br>කිරීම | 1. පාසල්<br>සංඛ්‍යාව<br>සිතියම්ගත<br>කිරීම<br>2. සකස් කරන<br>ලද පාසල්<br>සුරක්ෂිත<br>සැලසුම්<br>සංඛ්‍යාව | පාසල් සිතියම්<br>වාර්තා<br>සුරක්ෂිත සැලසුම්<br>ප්‍රගති වාර්තා | 1. උපද්‍රව සිතියමක්<br>සකස් කිරීම<br>2.අවදානම් සිතියම්<br>සකස් කිරීම<br>3. පාසල් සුරක්ෂිත<br>සැලසුම් සකස්<br>කරන ලද පාසල්<br>සංඛ්‍යාව<br>4 සැලැස්ම තුළ<br>දැනුවත් කිරීම් සහ<br>පෙරහුරු අභ්‍යාස<br>ඇතුළත් කිරීම | | | 2024<br>-<br>2028 | ආ.ක.ම.<br><br>අ.උ.අ.වෘ<br>.අ. අමා..<br><br>ජා.ළ.ආ.<br>අ<br><br>ජා.ගො.ප<br>.ආ.<br><br>කා.වි.දෙ. | 4.000 | ශ්‍රී ලංකා<br>රජයේ<br>අරමුදල් |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | 4.3 පාසල් සහ ළමුන් සඳහා ආපදා බලපෑම් තක්සේරු කිරීම | 4.3.1. පාසල්වලට ආපදාවේ බලපෑම පිළිබඳ දුර්වල අවබෝධය | 4.3.1.1. පාසල් සහ ළමා අධ්‍යාපනයට ආපදා නිසා සිදුවන බලපෑම පිළිබඳව වාර්තා කිරීමේ යාන්ත්‍රණයක් සකස් කිරීම | වාර්තා කිරීමේ සහ වලංගු කිරීමේ යාන්ත්‍රණය සකස් කර ඇත | වාර්තා කිරීමේ සහ වලංගු කිරීමේ යාන්ත්‍රණය පිළිබඳ ප්‍රගති වාර්තා ලබා ගත හැකි වීම | 1. පාසල්වල කමිටු පිහිටුවීම.<br>2. පාසල, ළමයින්, ඔවුන්ගේ අධ්‍යාපනය, දේපළ, හානි වූ සහ විනාශ වූ සෞඛ්‍ය යනාදී බලපෑම් පිළිබඳ තොරතුරු රැස් කිරීම<br>3. වාර්තා කිරීමේ යාන්ත්‍රණය සංවර්ධනය කිරීම | | 2024<br>-<br>2026 | | ආ.ක.ම.<br><br>අ.උ.අ.ව.අ. අමා.<br><br>ජා.ආ.ස. සේ.ම. . | 2.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | | | | 4.3.1.2. අවදානමට ලක්විය හැකි ආබාධිත ළමයින් සහ ආපදාවලට ගොදුරු වූ ළමුන් පිළිබඳ දත්ත ක්ෂණික ප්‍රතිචාර දැක්වීම සඳහා මධ්‍යම දත්ත රැස් කිරීමේ යාන්ත්‍රණයක් සකස් කිරීම. | යාන්ත්‍රණය සංවර්ධනය කර තිබීම | යාන්ත්‍රණය ලබා ගත හැකි සහ ක්‍රියාත්මක වීම<br><br>මධ්‍යගත කළමනාකරණ තොරතුරු පද්ධතියක් තිබීම | 1.පාර්ශ්වකරුවන් ගේ උපදේශන සහ එකඟතාවන්<br>2. යාන්ත්‍රණය සංවර්ධනය කිරීම<br>3. යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීම | | 2024<br>-<br>2026 | | ආ.ක.ම.<br><br>ජා.ළ.ආ.අ<br><br>ප.ළ.ර. සේ.දෙ.<br><br>ජා.ආ.ස. සේ.ම. .<br><br>ශ්‍රී. ල. කා.කා. | 0.100 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | | 4.4 පාර්ශවකරු-වන් සමඟ සන්නිවේදන පහසුකම් ශක්තිමත් කිරීම මඟින් ආපදා අවදානම් | 4.4.1. ජාතික ළමා ආරක්ෂක අධිකාරිය සමඟ සන්නිවේදන ප්‍රමාදයන් | 4.4.1.1. පවතින සන්නිවේදන ජාලයට ජාතික ළමා ආරක්ෂක අධිකාරිය ඇතුළත් කිරීම | ස්ථාපිත සහ ක්‍රියාකාරී සන්නිවේදන පද්ධතියක් පැවතීම | ජාතික ළමා ආරක්ෂක අධිකාරිය තුළ සන්නිවේදන පද්ධතිය ක්‍රියාත්මක වේ | පවතින සන්නිවේදන පද්ධතියට ජාතික ළමා ආරක්ෂක අධිකාරිය ඇතුළත් කිරීම | 2024 | | | ආ.ක.ම.<br><br>ජා.ළ.ආ.අ<br><br>ජා.ආ.ස. සේ.ම. . | 2.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | අවම කිරීම සන්නිවේද-නය සහතික කිරීම | | | | | | | | | | | |
| | | 4.5 අදාළ යාන්ත්‍රණ සංවර්ධනය කිරීම මඟින් ආපදා වින්දිතයන්-ගේ මනෝ සමාජීය අවශ්‍යතා සපුරාලීම සහතික කිරීම | 4.5.1. දෙමව්පියන්-ගේ සහ ළමයින්ගේ මනෝ සමාජීය අවශ්‍යතා ප්‍රමාණවත් ලෙස ආමන්ත්‍රණය නොවේ | 4.5.1.1. ආපදා තත්ත්වයන්ගෙන් පීඩාවට පත් ළමුන්ගේ සහ පවුල්වල මනෝ සමාජීය අවශ්‍යතා සහ ආපදා අවදානම් ප්‍රදේශවල ජීවත්වන පවුල් සඳහා ළමා ආරක්ෂණ පියවරයන් පිළිබඳව ජාතික ළමා ආරක්ෂක අධිකාරිය, සෞඛ්‍ය අමාත්‍යාංශය සහ අනෙකුත් පාර්ශවකරුවන් සමඟ එක්ව කෙටිකාලීන හා දිගුකාලීන වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම. | සැලසුම් කර ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් සංඛ්‍යාව | ප්‍රගති වාර්තා | ආපදා ප්‍රතිචාර<br>1. ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීම සඳහා ප්‍රජාව පදනම් කරගත් ප්‍රවේශයන්<br>2. මානසික ප්‍රථමාධාර සහ අනෙකුත් අර්බුද සහාය<br>3. විශේෂිත මානසික සෞඛ්‍ය සහ මනෝ සමාජීය සහාය<br><br>ආපදා වැළැක්වීම<br>1. ප්‍රධාන පාර්ශවකරුවන් සමඟ උපදේශනය<br>2. වැඩසටහන්, දළ සටහන්, මෙවලම් කට්ටල, මාර්ගෝපදේශ සංවර්ධනය කිරීම<br>3.තොරතුරු, අධ්‍යාපන, සන්නිවේදන මෙවලම් සංවර්ධනය කිරීම<br>4. වැඩසටහන් පිළිබඳ සැලසුම් අවසන් කිරීම | | | 2024 - 2028 | ආ.ක.ම.<br><br>ජා.ළ.ආ.අ<br><br>ප.ළ.ර. සේ.දෙ.<br><br>සෞ.ජ. මා.අමා.. | 5.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 4.5.1.2. ළමා හිතකාමී අවකාශයන් (භෞතික හා මානව සම්පත්) ක්‍රියාත්මක කිරීම සඳහා මෙවලම් කට්ටලයක් සහ සම්පත් රැස් කිරීමේ සැලැස්මක් සකස් කිරීම | මෙවලම් කට්ටලයක් සංවර්ධනය කිරීම | මෙවලම් කට්ටලය සහ සම්පත් ගැන්වීමේ සැලැස්ම තිබීම | 1. පරිචය සහ සාහිත්‍ය සමාලෝචනය<br>2. පාර්ශවකරුවන්ගේ උපදේශන (ළමයින් ඇතුළුව)<br>3. මෙවලම් කට්ටලය සංවර්ධනය කිරීම | | 2024 - 2026 | | ජා.ආ.ස. සේ.ම.<br>ආ.ක.ම.<br>ජා.ළ.ආ. අ | 4.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| 5. අධ්‍යාප-නය සහ ජීවන කුසලතා | | 5.1 ආපදා අධ්‍යාපනය පිළිබඳ වඩා වැඩි දැනුවත් කිරීමක් තුළින් පෙර සූදානම තහවුරු කිරීම | 5.1.1. ආපදා අවදානම් අවම කිරීම පිළිබඳ ප්‍රමාණවත් දැනුවත් භාවයක් නොමැතිවීම | 5.1.1.1. සියලුම පාසල් සහ සහන මධ්‍යස්ථාන සඳහා ළමා කේන්ද්‍රීය ආපදා අවදානම් අවම කිරීමේ වැඩසටහන් පැවැත්වීම | ප්‍රතිලාභී ළමුන් සංඛ්‍යාව<br>පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව | ප්‍රගති වාර්තා | 1. පාසල් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.<br>2.පාසල් ප්‍රශ්න විචාරාත්මක තරඟ පැවැත්වීම.<br>3. පාසල් විෂය මාලාවට ආපදා අවදානම් අවම කිරීම ඇතුලත් කිරීම | | | 2024 - 2028 | ආ.ක.ම.<br>ජා.ගො.ප .ආ.<br>කා.වි.දෙ.<br>ජා.ළ.ආ. අ<br>අ.උ.අ.වෘ .අ. අමා. | 3.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | | | | 5.1.1.2. පාසල් සිසුන්, පාසල් ප්‍රජාවන් සහ, ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නිලධාරින් සහ අදාළ පාර්ශව-කරුවන්ගේ සහභාගීත්වයෙන් පෙරහුරු අභ්‍යාස පැවැත්වීම | ළමුන් සහ ප්‍රජාවන් සමඟ සිදු කරන ලද පෙරහුරු අභ්‍යාස වැඩසටහන් සංඛ්‍යාව | ප්‍රගති වාර්තා | 1. ගංවතුර නාය යෑම් අවස්ථාවලදී ඉවත් කිරීමේ අභ්‍යාස.<br>2. ගිනි ගැනීමේදී ඉවත් කිරීමේ අභ්‍යාස.<br>3. සුනාමි අවස්ථාවලදී ඉවත් කිරීමේ අභ්‍යාස. | | | 2024 - 2028 | ආ.ක.ම.<br>අ.උ.අ.වෘ .අ. අමා.<br>ජා.ළ.ආ. අ | 7.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 5.1.1.3. ආපදා අවදානම් අවම කිරීමෙහි පාසල් සහ තරුණ ස්වේච්ඡා කණ්ඩායම් ඇති කිරීම සඳහා පාසල් සහ යොවුන් සේනාංක සඳහා ආපදා කළමනාකරණ පුහුණු පැවැත්වීම. | පුහුණු වැඩසටහන් සංඛ්‍යාව<br><br>ප්‍රතිලාභී ළමුන් සංඛ්‍යාව | පුහුණු අත්පොත් සහ වාර්තා | 1. පාසල් පුහුණු වැඩසටහන්<br>2. යොවුන් සේනාංක පුහුණුවීම්<br>3. බාලදක්ෂ පොතක පෝතිකාවන් පුහුණු කිරීම | | | 2024 - 2028 | ආ.ක.ම.<br><br>ජා.ළ.ආ.අ<br><br>අ.උ.අ.ව.අ. අමා.<br><br>බාල දක්ෂිකා හා බාලදක්ෂ සංගමය<br><br>යොවුන් සේනාංකය | 4.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | | | | 5.1.1.4. ආපදාවට ලක් වූ කඳවුරු හා අවදානම් සිටින ප්‍රජාව සඳහා කඳවුරු තුළ පවත්වාගෙන යා යුතු විනය පිළිබඳ මාර්ගෝපදේශ පිළිබඳ සාමාන්‍ය ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් සැලසුම් කිරීම සහ පැවැත්වීම. | පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව<br><br>ප්‍රතිලාභී පුද්ගලයින් සංඛ්‍යාව | ප්‍රගති / අධීක්ෂණ වාර්තා | 1. උද්දේශන රාමුව සංවර්ධනය කිරීම<br>2. සමාජ හැසිරීම වෙනස් කිරීමේ සන්නිවේදන ක්‍රමය සංවර්ධනය කිරීම<br>3. වැඩසටහන් සංවර්ධනය කිරීම<br>4. වැඩසටහන් පැවැත්වීම<br>5. වැඩසටහන් ඇගයීම | | | 2024 - 2028 | ආ.ක.ම.<br><br>ජා.ආ.ස.සේ.ම. . | 2.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 5.1.1.5. හදිසි අවස්ථාවලදී ළමා ආරක්ෂාව සහ ළමා කේන්ද්‍රීය ආපදා අවදානම අවම කිරීම සඳහා දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකය සාමාජිකයින් සඳහා ධාරිතා ගොඩනැගීමේ වැඩසටහන් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම | පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව<br><br>ප්‍රතිලාභී පුද්ගලයින් සංඛ්‍යාව | ප්‍රගති / අධීක්ෂණ වාර්තා | 1. පුහුණු අන්තර්ගතය සංවර්ධනය කිරීම<br>2. සම්පත් දායකයින් හඳුනා ගැනිම<br>3. පුහුණු සැසි පැවැත්වීම | | | 2024<br>-<br>2028 | ආ.ක.ම.<br><br>ජා.ළ.ආ.අ.<br><br>ශ්‍රී. ල. කා.කා. | 5.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | | | | 5.1.1.6. ආපදා කළමනාකරණ ක්‍රියාවලියට සම්බන්ධ අනෙකුත් පාර්ශ්වකරුවන්ට හදිසි අවස්ථාවලදී ළමා ආරක්ෂාව සඳහා ධාරිතාව ගොඩනැගීමේ වැඩසටහන් පැවැත්වීම | පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව<br><br>ප්‍රතිලාභී පුද්ගලයින් සංඛ්‍යාව | පුහුණු වාර්තා | 1. පුහුණු අන්තර්ගතය සංවර්ධනය කිරීම<br>2. සම්පත් දායකයින් හඳුනා ගැනීම<br>3. පුහුණු සැසි පැවැත්වීම | | | 2024<br>-<br>2028 | ආ.ක.ම.<br><br>ජා.ළ.ආ.අ. | 5.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 6. සාක්ෂි ජනනය කිරීම | | 6.1 සාක්ෂි පදනම් උපාය මාර්ග සහ ක්‍රියාමාර්ග සැකසීමට සාක්ෂි ගොඩනැගීම-ට හා සාක්ෂි ඇති කර ගැනීම | 6.1.1. ප්‍රමාණවත් නොවන පර්යේෂණ සහ අධ්‍යනය | 6.1.1.1. ආපදා අවදානම් ප්‍රදේශවල ජීවත්වන ළමයින්ගේ (වයස, ස්ත්‍රී පුරුෂ භාවය, ආබාධිතභාවය) වෙන් කළ දත්ත රැස් කිරීමට යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම | යාන්ත්‍රණය ස්ථාපිත කර ක්‍රියාත්මක වීම | වෙන් කළ දත්ත රැස් කිරීම සඳහා දත්ත කළමනාකරණ පද්ධතිය | 1.පාර්ශ්වකරුවන් ගේ උපදේශනය<br>2. රාමුව සංවර්ධනය කිරීම<br>3. තොරතුරු කළමනාකරණ පද්ධති සංවර්ධනය කිරීම | | | 2024 - 2028 | ආ.ක.ම.<br>ජා.ආ.ස. සේ.ම. .<br>ජා.ළ.ආ. අ | 5.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | | | | 6.1.1.2. පර්යේෂණ / අධ්‍යයනය පැවැත්වීම | පර්යේෂණ / අධ්‍යයන වාර්තා | පර්යේෂණ / අධ්‍යයනය වාර්තා | 1. පර්යේෂණ / අධ්‍යයන මාතෘකා සහ ක්‍රමවේද නිර්ණය කිරීම<br>2. පර්යේෂණ / අධ්‍යයනය පැවැත්වීම<br>3. පර්යේෂණ / අධ්‍යයන එළි දැක්වීම | | | 2024 - 2028 | ආ.ක.ආ<br>ආ.ක.ම.<br>ජා.ගො.ප .ආ. | 2.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| 7. ඇගයුම් ක්‍රමවේ-දය | | 7.1 ළමා ආරක්ෂාව පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රමානුකූලව ක්‍රියාත්මක කිරීම | | 7.1.1.1. කාර්තුමය ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම<br>7.1.1.2. වාර්ෂික ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම | නිරන්තර ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම<br>ක්ෂේත්‍ර විශේෂිත නිර්දේශ ඉදිරිපත් කිරීම | සමාලෝචන වාර්තා | 1.සමාලෝචන රැස්වීම් පැවැත්වීම<br>2. ක්ෂේත්‍ර වාර්තා විශ්ලේෂණය<br>3. වැඩිදියුණු කිරීම්/ ඉදිරි ක්‍රියාමාර්ග සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම | | | 2024 - 2028 | ජා.ළ.ආ. අ | 0.100 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

# 03. ආරක්ෂාව සහ නීතිය බලාත්මක කිරීමේ ක්ෂේත්‍රය

**ක්ෂේත්‍රය පිළිබඳ අර්ථ දැක්වීම:**

'ආරක්ෂිත සහ සාමකාමී රටක්' සඳහා දැක්මක් ඇතිව සහ 'භෞමික අඛණ්ඩතාවයෙන් යුත් සුරක්ෂිත, ආරක්ෂිත සහ ස්වෛරී රටක් උදෙසා උපාය මාර්ගික සැලසුම් සහ ප්‍රතිපත්ති සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම' යන මෙහෙවර සමගින් ක්‍රියාත්මක වන ආරක්ෂක ක්ෂේත්‍රය ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික ආරක්ෂාව සහතික කිරීම, රාජ්‍ය අමාත්‍යාංශ සඳහා ප්‍රතිපත්ති මාර්ගෝපදේශ සැපයීම සහ ජාතික අයවැය යටතේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ රාජ්‍ය ආයෝජන සහ ජාතික සංවර්ධන වැඩසටහන සම්බන්ධයෙන් වගකීම භාර ගෙන කටයුතු කරනු ලැබේ. මෙම ක්ෂේත්‍රය මඟින් හමුදා ආරක්ෂාව මෙන්ම රාජ්‍ය ආරක්‍ෂාව, සයිබර් ආරක්‍ෂාව සහ ආහාර සුරක්‍ෂිතතාව තහවුරු කරන අතරම අපරාධ, මත්ද්‍රව්‍ය, මුදල් විශුද්ධිකරණය සහ දූෂණයෙන් රට මුදවා ගැනීමට අවශ්‍ය සියලුම ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කරන අතර රට තුළ ආරක්‍ෂිත පරිසරයක් නිර්මාණය කිරීමට ද කටයුතු කරයි. විශේෂ ප්‍රමුඛතා ලෙස අභ්‍යන්තර කැරලි පාලනය, ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් සහ බාහිර බලපෑම්වලින් ආරක්ෂා කිරීම, සමුද්‍ර සීමා උල්ලංඝනය කරමින් නීතිවිරෝධී ලෙස භාණ්ඩ හා සේවා ප්‍රවාහනය වැළැක්වීම සහ මත්ද්‍රව්‍ය රට තුළට ගලා ඒම වැළැක්වීම සඳහා අදාළ ජනාධිපති කාර්ය සාධක බලකාය සමඟ ඒකාබද්ධව කටයුතු කිරීම, මත්ද්‍රව්‍ය උවදුර පාලනය කිරීම, මත්ද්‍රව්‍යවලට ගොදුරුවීම වැළැක්වීම, මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය කිරීම කෙරෙහි ආරක්ෂක ක්ෂේත්‍රය සිය අවධානය යොමු කරනු ලැබේ. මීට අමතරව, මෙම ක්ෂේත්‍රය ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සමඟ සහයෝගයෙන් කටයුතු කරමින් පළමු ප්‍රතිචාර දක්වන්නන් ලෙස ප්‍රධාන ආපදා සහන සපයයි.

**ළමා ආරක්ෂාව සඳහා අදාළත්වය:**

ආරක්‍ෂක ක්ෂේත්‍රය, ළමයින් සියලු ආකාරයේ අපයෝජනයන්ගෙන් ආරක්‍ෂා කරන අතරම ඔවුන්ට සුරක්‍ෂිත සහ ආරක්‍ෂිත පරිසරයක් නිර්මාණය කිරීමට තමන් දක්වන කැපවීම සහ අවශ්‍යතාව යළි යළිත් අවධාරණය කර ඇත.ඵලදායී ලෙස නීතිය බලාත්මක කිරීම, ළමුන් අතර මත්ද්‍රව්‍ය භාවිතයට එරෙහිව සටන් කිරීම සහ ළමා ආරක්ෂාව පිළිබඳ ප්‍රතිපත්ති සහ ක්‍රියාකාරී සැලසුම් ක්‍රියාත්මක කිරීමේ තාක්ෂණික විශේෂඥතාව, ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් ආරක්ෂක අමාත්‍යාංශය විසින් ප්‍රකාශ කරන ලද ප්‍රධාන ප්‍රමුඛතා ක්ෂේත්‍ර කිහිපයකි. ළමා ආරක්ෂාව සක්‍රීය කරන ප්‍රධාන ආයතනවන ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව සහ එහි ළමා හා කාන්තා හා අපයෝජන නිවාරණ කාර්යාංශය මඟින් නීතිය බලාත්මක කිරීමට අදාළ වන සහ කාන්තාවන්ට හා ළමයින්ට එරෙහි අපරාධ පිළිබඳ විමර්ශනවලට අදාළ වන ප්‍රධාන කාර්යභාරය ඉටු කරති. මීට අමතරව, සන්නද්ධ හමුදා සාමාජිකයින්ගේ පවුල්වල ළමයින්ගේ අධ්‍යාපනය, ආරක්ෂාව සහ යහපැවැත්ම සහතික කිරීම සඳහාද ආරක්ෂක ක්ෂේත්‍රය ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි.

**ආයතනික රාමුව:**

ආරක්ෂක අමාත්‍යාංශයට සිය විෂය පථය යටතේ පුළුල් පරාසයක පැතිරුණු දෙපාර්තමේන්තු සහ ආයතන ඇත. මෙම ක්‍රියාකාරී සැලැස්මට අනුව ළමා ආරක්‍ෂාව සම්බන්ධයෙන් සෘජු කාර්යභාරයක් ඉටු කරන ආයතන අතරට ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධානී කාර්යාලය, ශ්‍රී ලංකා යුද, නාවික හා ගුවන් හමුදා, ශ්‍රී ලංකා වෙරළාරක්‍ෂක දෙපාර්තමේන්තුව, ජාතික ශිෂ්‍යභට බළකාය සහ සිවිල් ආරක්‍ෂක දෙපාර්තමේන්තුව, රණවිරු සේවා අධිකාරිය, ආගමන දෙපාර්තමේන්තුව සහ ආරක්ෂක සේවා විද්‍යාලය ඇතුළත් වේ. ඊට අමතරව මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය, ශ්‍රී ලංකා පොලිසිය, අන්තරායකර ඖෂධ පාලක මණ්ඩලය සහ ශ්‍රී ලංකා පොලිස් විශේෂ කාර්ය බළකාය ළමයින්ගේ ආරක්‍ෂාව සඳහා ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.

| උපාය මාර්ගය | | උපාය මාර්ගික අරමුණු | ගැටලු | ප්‍රධාන ක්‍රියාකාරකම් / මැදිහත්වීම් | ප්‍රධාන කාර්ය සාධක දර්ශකය | සත්‍යාපනය කිරීමේ ක්‍රම | උප ක්‍රියාකාරකම් | වසර 1 | වසර 1-3 | වසර 1-5 | ප්‍රධාන වගකිව යුතු ආයතන | ඇස්තමේන්තුගත අයවැය (රු. මිලියන) | අරමුදල් මූලාශ්‍රය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1. නීති ක්‍රියාත්මක කිරීම සහ බලාත්මක කිරීම | 1.1 ප්‍රතිපත්ති | 1.1.1. ජාත්‍යන්තර ප්‍රමිතීන් සහිත ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීමෙන් හමුදාවන් තුළ ළමා අයිතිවාසිකම් සහ ළමා ආරක්ෂාව පිළිබඳ පිළිවෙත් සහතික කිරීම. | 1.1.1.1. සන්නද්ධ ගැටුම්වලින් පීඩාවට පත් ළමයින් සමඟ සම්බන්ධ වීමට ප්‍රමාණවත් යාන්ත්‍රණයක් නොමැත. | 1.1.1.1.1 ළමුන් සමඟ වැඩ කිරීමේදී ආරක්ෂක අංශයේ නිලධාරීන්ට මඟ පෙන්වීම සඳහා ළමා ආරක්ෂණ ප්‍රතිපත්තියක් සකස් කිරීම | ප්‍රතිපත්ති ලේඛනය සකස් කර ඇත | අමාත්‍ය මණ්ඩල අනුමත ප්‍රතිපත්තියක් තිබීම | 1. කමිටුවක් පත් කිරීම<br>2. සාහිත්‍ය විචාරය<br>3. සංකල්ප පත්‍රය<br>4. පාර්ශවකරුවන්ගේ සාකච්ඡාව<br>5. පාර්ශවකරුවන්ගේ එකඟතාව<br>6. කෙටුම්පත් සකස් කිරීම<br>7. අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කිරීම<br>8. ප්‍රතිපත්තිය එළි දැක්වීම | | 2025 - 2027 | | ආර.අමා<br><br>ම.ආ.පා. ක.අමා. | 0.050 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | 1.1.2. පොලිස් දෙපාර්ත-මේන්තුවේ ළමා හා කාන්තා කාර්යාංශ-යේ පරිපාලනය, වගවීම සහ විශේෂඥතා-ව ශක්ති-මත් කිරීම සඳහා ප්‍රතිපත්තිම-ය තීරණ ගැනීම තුළින් ළමා ආරක්ෂාව තහවුරු කිරීම. | 1.1.2.1. සාමාන්‍ය පොලිස් නිලධාරියෙකුට එහා ගොස් ක්‍රියාත්මක විය හැකි සහ විශේෂ පුහුණුව ලද විශේෂිත නිලධාරීන් හෝ විශේෂිත ලක්ෂණ නොමැතිව ළමා හා කාන්තා කාර්යංශය ක්‍රියා කරයි | 1.1.2.1.1.ළමයින් සමඟ වැඩ කිරීමට ඔවුන්ගේ කාර්යභාරය සහ බලතල ශක්තිමත් කිරීම සඳහා පොලිස් ළමා හා කාන්තා කායීංශය සඳහා ප්‍රතිපත්තියක් හඳුන්වා දීම | ප්‍රතිපත්ති ලේඛනය සකස්කර ඇත | අමාත්‍ය මණ්ඩල අනුමත ප්‍රතිපත්තියක් තිබීම | 1. කමිටුවක් පත් කිරීම<br>2. සාහිත්‍ය විචාරය<br>3. සංකල්ප පත්‍රය<br>4. පාර්ශවකරුවන්ගේ සාකච්ඡාව<br>5. පාර්ශවකරුවන්ගේ එකඟතාව<br>6. කෙටුම්පත් සකස් කිරීම<br>7. අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කිරීම<br>8. ප්‍රතිපත්ති එළි දැක්වීම | | 2025 - 2027 | | ශ්‍රී. ල. පො. | 0.100 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | 1.1.3 ජාතික ශිෂ්‍යභට බල-කායේ ලියාපදිංචි ශිෂ්‍ය භට ඒකක සහිත රජයේ සහ පෞද්ගලික පාසල් සඳහා ළමා ආරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා "ජාතික ශිෂ්‍යභට බලකායේ ළමා ආරක්ෂණ ප්‍රතිපත්තිය-ක්" හඳුන්වාදීම. | 1.1.3.1. පාසල් පද්ධතිය තුළ ළමා ආරක්‍ෂාව පිළිබඳ ඍජු හඬක් ළමයින්ට ලබාදීමට ළමා පෞරුෂයන් නොමැතිකම. | 1.1.3.1.1. ළමා ආරක්ෂණ වැඩසටහන් පිළිබඳ ජාතික ශිෂ්‍යභට බළකායේ මාර්ගෝපදේශ සැකසීම. | ජාතික ශිෂ්‍යභට බළකායේ සංවර්ධිත ළමා ආරක්ෂණ ප්‍රතිපත්තිය | ජාතික ශිෂ්‍යභට බළකායේ ළමා ආරක්ෂණ ප්‍රතිපත්තිය ලබා ගැනීමේ හැකියාව | 1. කමිටුවක් පත් කිරීම<br>2. ළමා ආරක්ෂාව පිළිබඳ වත්මන් වැඩසටහන් සහ මූල පිරීම් සමාලෝචනය<br>3. සංකල්පය සකස් කිරීම<br>4. පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා කිරීම<br>5. පාර්ශ්වයන්ගේ එකඟතාව<br>6. කෙටුම්පත කිරීම<br>7. අනුමැතිය ලබා ගැනීම<br>8. එළි දැක්වීම | | 2025 - 2027 | | ජා.ශි.භ.බ<br><br>ජා.ළ.ආ.අ.<br><br>අ.උ.අ.වa.අ.අමා.<br><br>අදාළ පාසල් | 0.500 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | 1.1.4 ළමුන් සමඟ, ළමුන් අතර මත්ද්‍රව්‍ය භාවිතය වැළැක්වීම ආමන්ත්‍රණය කිරීම. | 1.1.4.1. ළමුන් අතර මත්ද්‍රව්‍ය භාවිතය වැළැක්වීම සඳහා ජාතික ප්‍රතිපත්තියක් නොතිබීම | 1.1.4.1.1.ජා.ළ.ආ.අ. සමඟ එක්ව ළමුන් අතර මත්ද්‍රව්‍ය භාවිතය වැළැක්වීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම | ප්‍රතිපත්ති ලේඛනය සකස්කර ඇත | අමාත්‍ය මණ්ඩල අනුමත ප්‍රතිපත්තියක් තිබීම | 1. කමිටුවක් පත් කිරීම<br>2. ළමා ආරක්ෂාව පිළිබඳ වත්මන් වැඩසටහන් සහ මුල පිරීම් සමාලෝචනය<br>3. සංකල්පය සකස් කිරීම<br>4. පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා කිරීම<br>5. පාර්ශ්වයන්ගේ එකඟතාව<br>6. ප්‍රතිපත්ති කෙටුම්පත් කිරීම<br>7. අනුමැතිය ලබා ගැනීම<br>8. ප්‍රතිපත්තිය එළි දැක්වීම | 2025 | | | අ.ඔ.පා.ජා.ම.<br><br>ජා.ළ.ආ.අ. | 0.500 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | 1.3 රෙගුලාසි | 1.3.1. ළමා අපයෝජන සහ ළමුන් විසින් සිදු කරන ලද අපරාධ සම්බන්ධයෙන්වන විමර්ශන පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව ක්‍රියාත්මක කිරීම සඳහා පරිපාලන ප්‍රතිපාදන ක්‍රියාත්මක වන බවට සහතික වීම | 1.3.1.1.ළමා අපයෝජන සහ ළමුන් විසින් සිදු කරන ලද අපරාධ පිළිබඳ විමර්ශනය පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව ක්‍රියාත්මක කර නොමැත. | 1.3.1.1.1. ළමා අපයෝජන සහ ළමුන් විසින් සිදු කරන ලද අපරාධ පිළිබඳ විමර්ශනය සඳහා මාර්ගෝපදේශයක් සකස් කිරීම<br><br>1.3.1.1.2. මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීම සඳහා චක්‍රලේඛයක් නිකුත් කිරීම | මාර්ගෝපදේශ සකස් කර ඇත<br><br>චක්‍රලේඛය නිකුත් කර ඇත | මාර්ගෝපදේශ ලබා ගැනීමේ හැකියාව<br><br>චක්‍රලේඛය ලබා ගැනීමේ හැකියාව | 1. උපදේශන පැවැත්වීම.<br>2. මාර්ගෝපදේශ සකස් කිරීම<br>3. මාර්ගෝපදේශ සඳහා අදාළ අනුමැතිය ලබා ගැනීම<br>4. මාර්ගෝපදේශ බෙදා හැරීම | | 2025 - 2027 | | ශ්‍රී. ල. පො. | 0.100 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | 1.3.2 "පාසල් ළමා ආරක්ෂක කමිටු" ව්‍යුහය සඳහා ශිෂ්‍යභට බළකාය සහ නිලධාරි මුල පිරීම් වැඩසටහ-නක් හඳුන්වාදීම. | 1.3.2.1. සම වයසේ මිතුරන් අතර ළමා ආරක්ෂාව පිළිබඳ දැනුම ප්‍රමාණවත් ලෙස හුවමාරු නොවීම. | 1.3.2.1.1. "පාසල් ළමා ආරක්ෂක කමිටු" සමඟ කටයුතු කිරීමට අවශ්‍ය චක්‍රලේඛය හඳුන්වා දීම. | චක්‍රලේඛය සකස් කර බෙදා හැර ඇත | අනුමත චක්‍රලේඛය<br><br>ප්‍රගති වාර්තා | 1.විදුහල්පති, ප්‍රාදේශීය නිලධාරින්, ශිෂ්‍යභට අංශයේ සැරයන්වරුන් "පාසල් ළමා ආරක්ෂක කමිටු" පිළිබඳ අදහස් ලබා ගැනීම<br>2. චක්‍රලේඛය සකස් කිරීම<br>3. චක්‍රලේඛයට අදාළ අනුමැතිය ලබාගැනීම<br>4. චක්‍රලේඛය බෙදා හැරීම සහ බලාත්මක කිරීම | | 2025 - 2027 | | ජා.ශි.හ. බ<br><br>ජා.ළ.ආ. අ.<br><br>අ.උ.අ. වෘ.අ.අ මා.<br><br>අදාළ පාසල් | 1.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | | 1.3.3 පොලිස් ළමා හා කාන්තා කාර්යාංශ-යේ පරිපාලනය ශක්තිමත් කිරීම | 1.3.3.1. කොට්ඨාස ළමා හා කාන්තා කාර්යංශය ඒකක සහ පොලිස් ස්ථාන-වල ළමා හා කාන්තා කාර්-යාංශය මේස, ළමා හා කාන්තා කාර්යංශය අධ්‍යක්ෂ යටතේ ක්‍රියාත්මක නොවන අතර, නිලධාරීන්ට මඟපෙන්වීම සහ වගකීම පැවරීමට මධ්‍යම අධිකාරිය සීමා කරයි. | 1.3.3.1.1. . කොට්ඨාස ළමා හා කාන්තා කාර්යංශය ඒකක සහ පොලිස් ස්ථානවල ළමා හා කාන්තා කාර්යංශය මේස, පරිපාලනය සහ විනය සඳහා බලතල ළමා හා කාන්තා කාර්යංශය වෙත පැවරීම. | අභ්‍යන්තර චක්‍රලේඛය නිකුත් කර ඇත | චක්‍රලේඛය පවතී | 1. උපදේශන පැවැත්වීම.<br>2. චක්‍රලේඛය සකස් කිරීම<br>3. චක්‍රලේඛයට අදාළ අනුමැතිය ලබා ගැනීම<br>4. චක්‍රලේඛය බෙදා හැරීම සහ බලාත්මක කිරීම | | 2025 - 2027 | | ශ්‍රී. ල. පො. | 0.100 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

| | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | 1.3.4. ළමුන් මුහුණ දෙන මත්ද්‍රව්‍ය භාවිතය සහ ලිංගික, කායික සහ චිත්තවේගී-ය අපයෝජ-නයන් අතර සම්බන්-ධකම් ග්‍රහණයකර ගැනීමට සහ බහු-ආංශික වශයෙන් ප්‍රතිචාර දැක්විය හැකි යාන්ත්‍රණය-ක් සංවර්ධනය කිරීම | 1.3.4.1.මෙම සම්බන්ධව ආවරණයවනසේ වාර්තාකරණ පද්ධති නොමැති වීම | 1.3.4.1.1. අදාළ රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධාන පාර්ශවකරුවන් සමඟ ඒක්ව කළමනාකරණ තොරතුරු පද්ධතියක් සහ ඒ ආශ්‍රිත රෙගුලාසි/චක්‍රලේඛ සංවර්ධනය කිරීම | සංවර්ධිත යාන්ත්‍රණය<br><br>රෙගුලාසි සකස් කර ඇත<br><br>වාර්තාකරණ යාන්ත්‍රණය හරහා හඳුනාගත් ළමුන් සංඛ්‍යාව | පවතින යාන්ත්‍රණය පිළිබඳ චක්‍රලේඛය පවතී | 1. උපදේශන පැවැත්වීම.<br>2. යාන්ත්‍රණය සංවර්ධනය කිරීම<br>3. රෙගුලාසි / චක්‍රලේඛය සකස් කිරීම<br>3. යාන්ත්‍රණය සහ චක්‍රලේඛය සඳහා අදාළ අනුමැතිය ලබා ගැනීම | 2025 | | | අ.ඔ.පා. ජා.ම. | 0.100 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
ළමා අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතියට අත්සන්කරුවෙකු ලෙස, ශ්‍රී ලංකාව ළමයින්ගේ තොරතුරු දැනගැනීමේ අයිතිය ප්‍රවර්ධනය කිරීමට සහ විවිධ මූලාශ්‍රවලින් තොරතුරු වෙත ප්‍රවේශවීම සඳහා පහසුකම් සැලසීමට බැඳී ඇත. එසේ කිරීමේදී, ළමයින්ගේ කායික හා මානසික සුභසිද්ධිය ආරක්‍ෂා කිරීමට මාධ්‍ය අංශයට සිදුවේ. ඩිජිටල් මාධ්‍ය ළමයින්ගේ ජීවිතවල අත්‍යවශ්‍ය අංගයක් වන අතරම, ළමයින්ගේ ආරක්ෂාවට එරෙහිව වර්ධනය වෙමින් පවත්නා තර්ජනයක් ලෙස ද ඉස්මතු වී තිබේ. ළමුන් සඳහා ආරක්ෂිත ඩිජිටල් පරිසර සක්‍රීය කිරීම සඳහා මාධ්‍ය අංශයට විශාල කාර්යභාරයක් ඉටු කළ හැකිය. ළමා අයිතිවාසිකම් සම්මුතියෙහි 12 සහ 13 වගන්ති මගින් නිශ්චිතව දක්වා ඇති පරිදි, රාජ්‍ය පාර්ශවයන් ළමයින්ගේ භාෂණයේ නිදහස වෙත ඇති අයිතියට ගරු කළ යුතු අතර ළමයින්ගේ සහභාගීත්ව අයිතිවාසිකම් ප්‍රවර්ධනය කරමින් ඊට ගරු කළ යුතුය. ළමයින්ගේ පෞද්ගලිකත්වය, ආරක්ෂාව සහ අනන්‍යතාවය සඳහා වන අයිතිවාසිකම් තහවුරු කරමින් ළමා අයිතිවාසිකම් උල්ලංඝනය වන අවස්ථා හෙළිදරව් කිරීම සහ වාර්තා කිරීම සඳහා මාධ්‍ය අංශය ද ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරනු ලැබේ.

**ආයතනික රාමුව:**

මාධ්‍ය අංශයට අමාත්‍යාංශ කිහිපයක් යටතේ ඇති ආයතන කිහිපයක් විසින් කටයුතු කරනු ලබන පුළුල් ක්‍රියාකාරී බලසීමාවක් ඇත. ළමා ආරක්ෂණය සම්බන්ධයෙන් ගත් කල, ක්‍රියාකාරී සැලැස්මට සෘජුවම දායක වී ඇති එමෙන්ම එය ක්‍රියාත්මක කිරීමේදී ප්‍රධාන භූමිකාවන් ඉටු කිරීමට ඇති ආයතන වන්නේ සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය, විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය සහ බුද්ධ ශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය සමග මෙම අමාත්‍යාංශයන්ට අදාළ ආයතන විසිනි.

| උපාය මාර්ගය | | උපාය මාර්ගික අරමුණු | ගැටලු | ප්‍රධාන ක්‍රියාකාරකම් / මැදිහත්වීම් | ප්‍රධාන කාර්ය සාධක දර්ශකය | සත්‍යාපනය කිරීමේ ක්‍රම | උප ක්‍රියාකාරකම් | වසර 1 | වසර 1-3 | වසර 1-5 | ප්‍රධාන වගකිව යුතුආයතන | ඇස්ත-මේන්තුගත අයවැය (රු. මිලියන) | අරමුදල් මූලාශ්‍රය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1. නීති ක්‍රියාත්-මක කිරීම සහ බලාත්-මක කිරීම | 1.1 ප්‍රති-පත්ති | 1.1.1 ජන මාධ්‍ය සහ සමාජ මාධ්‍ය ඇතුළු මාධ්‍ය ආශ්‍රිත ක්‍රියාකාරකම්වල ළමුන් සම්බන්ධ වීමේ සියලු මට්ටම් නියාමනය කිරීම සඳහා ප්‍රතිපත්තියක් සකස් කිරීම මගින් ළමා ආරක්ෂාව ශක්තිමත් කිරීම | 1.1.1.1.ළමා ගැටළු වාර්තා කිරීමේදී සහ ළමයින් සම්බන්ධකර ගැනීමේදී මාධ්‍ය වගකීම් විරහිත හැසිරීම | 1.1.1.1.1. ජනමාධ්‍ය හා නව මාධ්‍ය තුළ ළමුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා නව මාධ්‍ය ප්‍රතිපත්තියක් හඳුන්වා දීම | සකස් කරන ලද ප්‍රතිපත්ති ලේඛනය | අමාත්‍ය මණ්ඩල අනුමත ප්‍රතිපත්තියක් පවතී<br>: | 1. කමිටුවක් පත් කිරීම<br>2. සාහිත්‍ය විමර්ශනය<br>3. සංකල්ප පත්‍රය<br>4.පාර්ශවකරුවන්ගේ සාකච්ඡාව<br>5.පාර්ශවකරුවන්ගේ එකඟතාව<br>6.ප්‍රතිපත්තිය කෙටුම්පත් කිරීම<br>7.අමාත්‍යමණ්ඩලයට ඉදිරිපත් කිරීම<br>8.ප්‍රතිපත්තිය එළිදැක්වීම | | 2025 – 2027 | | සෞ.ජ. මා.අමා..<br>ජා.ළ.ආ. අ. | 0.100 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | | 1.1.2 ළමා හිතකාමී මාධ්‍යවේදීන් (පාසල් මට්ටමේ සිට උසස් අධ්‍යාපනය සහ වෘත්තීය පුහුණුව දක්වා) බිහි කිරීම සඳහා මාධ්‍ය හා සම්බන්ධ විවිධ අධ්‍යාපනික සහ පුහුණු වැඩසටහන් සම්බන්ධ කිරීම සඳහා ප්‍රතිපත්තියක් | 1.1.2.1. සදාචාරාත්මක සහ ආරක්ෂිත මාධ්‍ය භාවිතයන් පිළිබඳ අවබෝධයක් නොමැතිකම | 1.1.2.1.1 ජනමාධ්‍ය හා සම්බන්ධ විවිධ අධ්‍යාපනික සහ පුහුණු වැඩසටහන් මෙහෙයවීමට සහ සම්බන්ධ කිරීමට පාසල් මාධ්‍ය සමාජ සඳහා ප්‍රතිපත්තියක් සකස් කිරීම | සකස් කරන ලද ප්‍රතිපත්ති ලේඛනය | අමාත්‍ය මණ්ඩල අනුමත ප්‍රතිපත්තියක් පවතී | 1. කමිටුවක් පත් කිරීම<br>2. සාහිත්‍ය විමර්ශනය<br>3. සංකල්ප පත්‍රය<br>4.පාසල් සිසුන් ඇතුළු පාර්ශවකරුවන්ගේ සාකච්ඡාව<br>5.පාර්ශවකරුවන්ගේ එකඟතාව<br>6. ප්‍රතිපත්තිය කෙටුම්පත් කිරීම<br>7. අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කිරීම | | 2025 - 2027 | | සෞ.ජ. මා.අමා..<br>ජා.ළ.ආ. අ.<br>අ.උ.අ.වෘ .අ.අමා. | 0.500 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සැකසීමෙන් ළමා ආරක්ෂාව ශක්තිමත් කිරීම. | | | | | 8. ප්‍රතිපත්තිය එළිදැක්වීම | | | | | | |
| | | 1.1.3 ළමයින්ට එරෙහි මාර්ගගත සහසිකත්වය මැඩලීමට සහාය වීම සඳහා අන්තර්ජාල සේවා සපයන්නන්, සමාජ මාධ්‍ය, දත්ත ආරක්ෂණය යනාදිය සම්බන්ධ රෙගුලාසි නියාමනය, අධීක්ෂණය සහ මඟ පෙන්වීම සඳහා ප්‍රතිපත්තියක් සකස් කිරීම. | 1.1.3.1. ළමුන් සඳහා ප්‍රමාණවත් අන්තර්ජාල ආරක්ෂාවක් නොමැත | 1.1.3.1.1. අන්තර්ජාල ආරක්ෂාව/ සයිබර් අපරාධ වැලැක්වීම පිළිබඳ ප්‍රතිපත්තියක් සකස් කිරීම | සකස් කරන ලද ප්‍රතිපත්ති | අමාත්‍ය මණ්ඩල අනුමත ප්‍රතිපත්තියක් පවතී | 1. කමිටුවක් පත් කිරීම<br>2. සාහිත්‍ය විමර්ශනය<br>3. සංකල්ප පත්‍රය<br>4.පාර්ශවකරුවන්ගේ සාකච්ඡාව<br>5.පාර්ශවකරුවන්ගේ එකඟතාව<br>6. ප්‍රතිපත්ති කෙටුම්පත් කිරීම<br>7. අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කිරීම<br>8. ප්‍රතිපත්ති එළිදැක්වීම | | 2025 - 2027 | | ජා.ළ.ආ.අ.<br><br>සෞ.ජ. මා.අමා..<br><br>ශ්‍රී.ල.වි.ස .නි.කො. ස.<br><br>ශ්‍රී .ල.ප.හ.ප්‍ර .ස. | 0.400 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | 1.2 නීති | 1.2.1 ළමා වින්දිතයන්, වැරදිකරුවන්, සාක්ෂිකරුවන් අධිකරණ පද්ධතිය තුළ සෑම අදියරකදීම (සිවිල් සහ අපරාධ අනාවරණයකර ගැනීම, විමර්ශන, සම්මුඛ පරීක්ෂණ, පුද්ගලයන්ගේ නඩු විභාගය, දඬුවම් නියම කිරීම සහ රඳවා තබා ගැනීම) අනන්‍යතාවය හෙළිදරව් කිරීම වැළැක්වීම සඳහා | 1.2.1.1. මාධ්‍ය හරහා හෙළිදරව් කිරීමෙන් අධිකරණ පද්ධතියේ ළමුන් අපයෝජනයට වඩාත් අනාරක්ෂිත වේ | 1.2.1.1.1. පුවත්පත්, විද්‍යුත් සහ නව මාධ්‍ය අධීක්ෂණය සහ නියාමනය සඳහා පවතින පුවත්පත් මණ්ඩල පනත සංශෝධනය කිරීම | සංශෝධිත පුවත්පත් මණ්ඩල පනත | මුද්‍රිත, විද්‍යුත් සහ නව මාධ්‍ය අධීක්ෂණය සහ නියාමනය සඳහා සංශෝධිත පුවත්පත් මණ්ඩල පනත ලබා ගත හැකි වීම | 1. කමිටුවක් පත් කිරීම<br>2. සාහිත්‍ය විමර්ශනය<br>3. සංකල්ප පත්‍රය<br>4.පාර්ශවකරුවන්ගේ සාකච්ඡාව<br>5.පාර්ශවකරුවන්ගේ එකඟතාවය<br>6. සංශෝධිත නීති කෙටුම්පත් කිරීම<br>7.අධිකරණ අමාත්‍යාංශයට ඉදිරිපත් කිරීම<br>8.නීති කෙටුම්පත් සම්පාදක වෙත ඉදිරිපත් කිරීම<br>9. ගැසට් කිරීම<br>10. පනත් කෙටුම්පත | | 2025 - 2027 | | ජා.ළ.ආ.අ.<br><br>සෞ.ජ. මා.අමා. | 0.600 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | නීතිමය ප්‍රතිපාදනයක් හඳුන්වා දීම. | | | | | පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම | | | | | | |
| | | 1.2.2 නීති ශක්තිමත් කිරීම මගින් අසභ්‍ය ප්‍රකාශනවලට ප්‍රවේශ වීම අවම කිරීම | 1.2.2.1. ළමුන් සම්බන්ධ අසභ්‍ය ප්‍රකාශන පිළිබඳව ප්‍රමාණවත් නියාමනයක් නොමැති වීම | 1.2.2.1.1. අසභ්‍ය ප්‍රකාශන සම්බන්ධ නීති සමාලෝචනය කිරීම සහ සංශෝධනය කිරීම | අසභ්‍ය ප්‍රකාශන පනතට කරන ලද සංශෝධන | සංශෝධිත නීතිය | 1. කමිටුවක් පත් කිරීම.<br>2. සමාලෝචනය සිදු කිරීම.<br>3.නීති කෙටුම්පත් කිරීම .<br>4.අධිකරණ අමාත්‍යාංශයට ඉදිරිපත් කිරීම.<br>5.ගැසට් කිරීම<br>6. පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම . | | 2025 - 2027 | | ජා.ළ.ආ.අ.<br>සෞ.ජ.මා.අමා. .<br>අධි.ජා.ඒ. අමා. | 0.100 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | 1.3 රෙගු-ලාසි | 1.3.1. ළමුන් සම්බන්ධ සිද්ධි වාර්තා කිරීමේ ක්‍රියාවලිය මෙහෙයවන රෙගුලාසියක් නිකුත් කිරීම. | .1.3.1.1. මාධ්‍ය සඳහා නිසි නියාමන මාර්ගෝපදේශ-යක් නොමැති වීම . | 1.3.1.1.1. අධිකරණ අමාත්‍යාංශය සමඟ සාකච්ඡාකර වින්දිත ළමා සිද්ධීන් වාර්තා කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ රෙගුලාසි සකස් කිරීම | සකස් කරන ලද රෙගුලාසි | අනුමත රෙගුලාසි | 1. උපදේශන පැවැත්වීම<br>2. රෙගුලාසි / චක්‍රලේඛය සකස් කිරීම<br>3. රෙගුලාසි / චක්‍රලේඛය සඳහා අදාළ අනුමැතිය ලබා ගැනීම | | 2025 - 2027 | | ජා.ළ.ආ.අ.<br>සෞ.ජ.මා.අමා.<br>අ.වි.සා.ආ.කි.ජා.අ. | 0.600 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | 1.3.2<br>මාධ්‍ය තුළ වාණිජ අරමුණු සඳහා ළමුන් යොදා ගැනීම (වෙළඳ දැන්වීම්, රියැලිටි වැඩසටහන්, ටෙලි නාට්‍ය, සහ අනෙකුත් වැඩසටහන්) ඉලක්ක කර ළමුන් සම්බන්ධ කර ගැනීම නියාමනය කිරීම සඳහා රෙගුලාසි නිකුත් කිරීම. | 1.3.2.1. මාධ්‍ය තුළ ළමුන් භාවිතා කිරීම සහ අපයෝජනයට ලක් වීම | 1.3.2.1.1.. මාධ්‍ය තුළ වාණිජ අරමුණු සඳහා ළමුන් යොදා ගැනීමට අදාළ රෙගුලාසි සමාලෝචනය කිරීම සහ සංශෝධනය කිරීම | සකස් කරන ලද රෙගුලාසි | අනුමත රෙගුලාසි | 1. කමිටුවක් පත් කිරීම.<br>2. සමාලෝචනය සිදු කිරීම .<br>3. රෙගුලාසි / චක්‍රලේඛය සකස් කිරීම<br>4. රෙගුලාසි / චක්‍රලේඛය සඳහා අදාළ අනුමැතිය ලබා ගැනීම | | 2025 - 2027 | | ජා.ළ.ආ.අ.<br><br>සෞ.ජ.මා.අමා.<br><br>අධි.ජා.ඒ.අමා. | 0.500 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | | 1.3.3 පාසල් මාධ්‍ය සමාජ සහ සිසුන්ට පහසුකම් සැලසීම සඳහා සම්පත් දායකයින් විසින් පවත්වනු ලබන සියලුම වැඩසටහන් සඳහා ඒකමිතික රෙගුලාසි මාලාවක් හඳුන්වා දීම (මාධ්‍ය සදාචාරාත්මක භාවිතය පිළිබඳ පැතිකඩ ආවරණය කිරීම) | 1.3.3.1. පාසල් සිසුන්ට මාධ්‍ය ඉගැන්වීම සඳහා මාධ්‍ය ආයතන භාවිත කරන ක්‍රමවේදවල ඒකමිතික බවක් නොමැතිකම | 1.3.3.1.1. පාසල් මාධ්‍ය සමාජවල පවත්වන වැඩසටහන් සඳහා රෙගුලාසි හඳුන්වාදීම | රෙගුලාසි සකස් කිරීම, සහ ක්‍රියාත්මක කිරීම | රෙගුලාසි පවතී | 1. උපදේශන පැවැත්වීම<br>2. රෙගුලාසි සකස් කිරීම<br>3. අනුමත කරන ලද රෙගුලාසි<br>4රෙගුලාසි බෙදා හැරීම | 2025 | | | සෞ.ජ.මා.අමා.<br><br>ර.ප්‍ර.දෙ.<br><br>ශ්‍රී.ල.පු.ම<br><br>ජා.ළ.ආ.අ.<br><br>බු.ශා.ආ.සං.ක.අමා.<br><br>අ.උ.අ.වෘ.අ.අමා. | 0.100 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1.4 ක්‍රියා-ත්මක කිරීම | 1.4.1. ක්ෂේත්‍රයේ විෂය පථය තුළ ළමා අපයෝජන වැළැක්වීම සහ ප්‍රතිචාර දැක්වීම සඳහා රාජ්‍ය සහ පෞද්ගලික ආයතන අතර සබඳතා වැඩිදියුණු කිරීමේ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම | 1.4.1.1. ළමා ආරක්ෂාව සඳහා මාධ්‍ය තුළ ප්‍රමාණවත් ඉඩක් නොමැති වීම | 1.4.1.1.1. සමාජ සත්කාරක වගකීමක් ලෙස ළමා ආරක්ෂාව සඳහා ඉඩකඩ වෙන් කිරීමේ යාන්ත්‍රණයක් හඳුන්වා දීම | සංවර්ධනය කරන ලද යාන්ත්‍රණය | නියාමන වාර්තා | 1.පාර්ශවකරුවන් සමඟ සාකච්ජාව<br>2. පාර්ශවකරුවන් අතර එකඟතාවය<br>3. සමාජ සත්කාරක වගකීම සංවර්ධනය කිරීම<br>4. සමාජ සත්කාරක වගකීම ක්‍රියාත්මක කිරීම | | 2025 - 2027 | | සෞ.ජ. මා.අමා.<br><br>ජා.ළ.ආ. අ. | 0.200 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| 2. සම්මත-යන් සහ අගයන් | | 2.1 සියලුම මාධ්‍යවල සිදුවන සියලු ආකාරයේ අපයෝජනයන්-ගෙන් සහ සූරාකෑම්වලින් ළමයින් ආරක්ෂා කිරීම ආවරණය වන පරිදි ආචාර ධර්ම පද්ධතියක් සකස් කිරීම. | 2.1.1 ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් සියලුම මාධ්‍ය ආවරණය වන ආචාර ධර්ම පද්ධතියක් නොමැති වීම | 2.1.1.1. සියලුම මාධ්‍ය සඳහා ළමා ආරක්ෂාව පිළිබඳ ආචාර ධර්ම පද්ධතිය හඳුන්වාදීම. | මාධ්‍ය සඳහා නව ආචාර ධර්ම පද්ධතියක් | සියලුම මාධ්‍ය සඳහා ළමා ආරක්ෂාව පිළිබඳ නව ආචාර ධර්ම පද්ධතියක් පවතී<br><br>මාධ්‍ය ආයතන මඟින් ආචාර ධර්ම සංග්‍රහය පෙළගැස්වීම පිළිබඳ නියාමන වාර්තා | 1. කමිටුවක් පත් කිරීම<br>2. සාහිත්‍ය විමර්ශනය<br>3. සංකල්ප පත්‍රිකා සකස් කිරීම<br>4. පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා කිරීම<br>5. පාර්ශ්වයන්ගේ එකඟතාව<br>6. ආචාර ධර්ම සංග්‍රහය කෙටුම්පත් කිරීම<br>7. අනුමැතිය ලබා ගැනීම<br>8. ආචාර ධර්ම සංග්‍රහය එළිදැක්වීම | 2025 | | | සෞ.ජ. මා.අමා.<br><br>ජා.ළ.ආ. අ.<br><br>බු.ශා.ආ. සං.ක.අ මා.<br><br>ජා.වි.ස. | 1.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | 2.2 මාධ්‍ය ක්ෂේත්‍රයේ වෘත්තිකයන් හා කාර්යය මණ්ඩලය ළමයින් සමඟ කටයුතු කළ යුතු ආකාරය ගැන ළමා ආරක්ෂාව පිළිබඳ ආචාර ධර්ම පද්ධතියක් හඳුන්වා දීම | 2.2.1. ළමුන් ජනමාධ්‍යය වැඩසටහන් සඳහා සහභාගී වීමේදී ඇතිවන ළමා ආරක්ෂණ ගැටළු | 2.2.1.1. මාධ්‍ය ක්ෂේත්‍රයට අදාළ වෘත්තිකයන් සහ කාර්ය මණ්ඩලය සඳහා ළමුන් ආරක්ෂා කිරීම පිළිබඳ ආචාර ධර්ම සංග්‍රහය හඳුන්වාදීම | මාධ්‍ය ක්ෂේත්‍රයට අදාළ වෘත්තිකය-න් සහ කාර්ය මණ්ඩලය සඳහා ළමා ආරක්‍ෂාව සඳහා වූ සකස් කරන ලද ආචාර ධර්ම සංග්‍රහය | මාධ්‍ය ක්ෂේත්‍රයට අදාළ වෘත්තිකයන් සහ කාර්ය මණ්ඩලය සඳහා ළමා ආරක්ෂණය පිළිබඳ නව ආචාර ධර්ම පද්ධතියක් පවතී<br><br>මාධ්‍ය මගින් ආචාර ධර්ම සංග්‍රහය පෙළගැස්වීම පිළිබඳ නියාමන වාර්තා | 1. කමිටුවක් පත් කිරීම<br>2. සාහිත්‍ය විමර්ශනය<br>3. සංකල්ප පත්‍රිකා සකස් කිරීම<br>4. පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා කිරීම<br>5. පාර්ශ්වයන්ගේ එකඟතාව<br>6. ආචාර ධර්ම කෙටුම්පත් කිරීම<br>7. අනුමැතිය ලබා ගැනීම<br>8. ආචාර ධර්ම සංග්‍රහය එළි දැක්වීම | | 2025 - 2027 | | සෞ.ජ. මා.අමා.<br><br>ජා.ළ.ආ. අ.<br><br>බු.ශා.ආ. සං.ක.අ මා. | 1.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | | 2.3 ඩිජිටල් පුරවැසිභාවය පිළිබඳ සංකල්පය ප්‍රවර්ධනය කිරීම සඳහා වැඩසටහන් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම මඟින් මාර්ගගත අරක්ෂාව සහතික කිරීම | 2.3.1. සයිබර් අවකාශයේ ළමුන් සඳහා ප්‍රමාණවත් ආරක්ෂාවක් නොමැති වීම | 2.3.1.1. ඊ-තක්සලාව සහ ඊ-වේදිකා භාවිතා කරමින් ඩිජිටල් පුරවැසිභාවය පිළිබඳ අධ්‍යාපන මුලපිරීම් ක්‍රියාත්මක කිරීම | පවත්වන ලද වැඩමුළු සංඛ්‍යාව<br><br>ප්‍රතිලාභි ළමුන් සංඛ්‍යාව<br><br>පවත්වනු ලැබූ වැඩසටහන් /පාඨමාලා සංඛ්‍යාව | වැඩමුළු වාර්තා<br><br>පාඨමාලා නිම කිරීමේ සංඛ්‍යාව (ඊ-වේදිකා)<br><br>පැමිණීමේ වාර්තා | 1. දැනුවත් කිරීම සඳහා බහු-ආංශික කමිටුවක් පිහිටුවීම<br>2. මාර්ගගත ආරක්ෂාව සහ ඩිජිටල් පුරවැසිභාවය පිළිබඳ පාඨමාලා සංවර්ධනය කිරීම<br>3. මාර්ගගත ආරක්ෂාව පිළිබඳ ජන මාධ්‍ය වැඩසටහන් | | | 2025 - 2029 | සෞ.ජ. මා.අමා..<br><br>වි.තා.අ මා.<br><br>අ.උ.අ.වෘ .අ.අමා. | 1.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 3. මාපිය සහ රැකවරණ සපයන්නන්ගේ සහාය | | 3.1 ළමා ආරක්ෂාව, ළමා මානසික සෞඛ්‍යය, ඩිජිටල් සාක්ෂරතාවය සහ මාධ්‍ය හරහා මාපිය කුසලතා ප්‍රවර්ධනය කිරීම සඳහා වැඩසටහන් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම මඟින් පවුල ශක්තිමත් කිරීම. | 3.1.1. ඩිජිටල් සාක්ෂරතාවය, ළමා මානසික සෞඛ්‍යය සහ මාපිය කුසලතා පිළිබඳ දැනුවත්භාවය නොමැතිකම | 3.1.1.1. ළමා ආරක්ෂාව, ඩිජිටල් සාක්ෂරතාවය සහ මාපියන් පිළිබඳ සියලු මාධ්‍ය හරහා ජනතාව දැනුවත් කිරීමේ ව්‍යාපාරය | පවත්වන ලද දැනුවත් කිරීමේ ව්‍යාපාර සංඛ්‍යාව<br><br>ප්‍රතිලාභ ලැබූ පුද්ගල සංඛ්‍යාව | ප්‍රගති වාර්තා<br><br>නියාමන වාර්තා<br><br>ව්‍යාපාරය පිළිබඳ උපායමාර්ගය | 1.විශේෂයෙන් අවදානමට ලක්විය හැකි කණ්ඩායම් හඳුනා ගැනීම<br><br>2. අවශ්‍යතා අනුව වැඩසටහන් සැලසුම් කිරීම<br><br>3.වැඩසටහන්/ ව්‍යාපාර ක්‍රියාත්මක කිරීම | | | 2025 - 2029 | සෞ.ජ. මා.අමා.<br><br>ජා.ළ.ආ.අ.<br><br>ශ්‍රී.ල.රූ.ස.<br>ශ්‍රී.ල.ගු.වි.ස.<br><br>ස්.රූ.සේ. | 3.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| 4. ප්‍රතිචාර සහ සහාය සේවා | | 4.1 සියලුම මාධ්‍යවල ළමා අපයෝජනවලට ගොදුරු වූවන්ගේ ආරක්ෂාව සහතික කිරීම | 4.1.1. අපයෝජනයට ලක්වූවන් ආරක්ෂා කිරීමට නිසි යාන්ත්‍රණයක් සියලුම මාධ්‍ය තුළ නොමැත | 4.1.1.1. ළමා අපයෝජන පිළිබඳ මාධ්‍ය වාර්තාකරණයට එරෙහි පැමිණිලි සම්බන්ධයෙන් පවතින යාන්ත්‍රණය සමාලෝචනය කර අවශ්‍ය වැඩිදියුණු කිරීම් සිදු කිරීම | පැමිණිලි භාර ගැනීමේ සහ ප්‍රතිචාර දැක්වීමේ යාන්ත්‍රණය වැඩිදියුණු කිරීම | පැමිණිලි යාන්ත්‍රණය වැඩිදියුණු කිරීම පිළිබඳ ප්‍රධාන නිර්දේශ සහිත සමාලෝචන වාර්තාව වැඩිදියුණු කළ යාන්ත්‍රණය | 1.පාර්ශවකරුවන්ගේ උපදේශන<br>2. පවතින වාර්තාකරණ යාන්ත්‍රණයන් සමාලෝචනය කිරීම<br>3. වැඩි දියුණු කිරීම් හඳුනා ගැනීම<br>4. යාන්ත්‍රණය වැඩි දියුණු කිරීම | 2025 | | | සෞ.ජ. මා.අමා.<br><br>ශ්‍රී.ල.පු.ම.<br>ජා.ළ.ආ.අ. | 0.700 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 4.1.1.2. සියලුම මාධ්‍ය තුළ පැමිණිලි භාර ගැනීමේ සහ ප්‍රතිචාර දැක්වීමේ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම | සියලුම මාධ්‍ය තුළ පැමිණිලි භාරගැනී-මේ සහ ප්‍රතිචාර දැක්වීමේ යාන්ත්‍රණ-යක් ක්‍රියාත්මක වේ<br><br>ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව<br><br>ප්‍රතිචාර දක්වා ඇති පැමිණිලි සංඛ්‍යාව | පැමිණිලි දත්ත පද්ධතිය තිබීම | 1. සියලුම මාධ්‍ය මඟින් කරනු ලබන ළමා අයිතිවාසිකම් උල්ලංඝණය කිරීම් සහ සාවද්‍ය වාර්තාකරණය පිළිබඳ පැමිණිලි භාර ගැනීම<br>2. පැමිණිලි විමර්ශනය කර ප්‍රතිචාර දැක්වීම | | 2025 - 2027 | | සෞ.ජ. මා.අමා.<br><br>ජා.ළ.ආ. අ. | 3.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | | 4.2 සෞන්දර්ය කලාව හරහා ළමා ආරක්ෂාව ප්‍රවර්ධනය කිරීම | 4.2.1. දැනුවත් කිරීමේ මෙවලමක් ලෙස රංග කලාව ප්‍රමාණවත් ලෙස භාවිතා නොකිරීම | 4.2.1.1. ළමා ආරක්ෂාව ප්‍රවර්ධනය කිරීම සඳහා වේදිකාවක් ලෙස රංග ශාලාව භාවිතා කිරීමට වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ සැලසුම් කිරීම | ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් සංඛ්‍යාව<br><br>ප්‍රතිලාභි ළමුන් සංඛ්‍යාව<br><br>ප්‍රතිලාභී වැඩිහිටි සංඛ්‍යාව | වැඩසටහන් සැලසුම්<br><br>වැඩසටහන් ආවරණය පිළිබඳ ප්‍රගති වාර්තා | 1.වැඩසටහන් සංවර්ධනය කිරීම<br>2. වැඩසටහන් පැවැත්වීම | | | 2025 - 2029 | සෞ.ජ. මා.අමා.<br><br>බු.ශා.ආ. සං.ක.අ මා.<br><br>අ.උ.අ.වෘ .අ.අමා.<br><br>ජා.ළ.ආ. අ. | 3.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 5. අධ්‍යාපනය සහ ජීවන කුසලතා | | 5.1 ළමයා සහ මාධ්‍ය සම්බන්ධ විෂය මාලාවක් සහ විෂයසමගාමී ක්‍රියාකාරකම් හඳුන්වා දීමෙන් ළමයාගේ ආරක්ෂණ අයිතීන් තහවුරු කිරීම | 5.1.1. ළමයාගේ පෞද්ගලිකත්වය සහ මානසික යහපැවැත්ම සම්බන්ධ ගැටළු නොසලකා ළමා අපයෝජන සාවද්‍ය ලෙස වාර්තා කිරීම මෑත කාලීනව ඉහළ ගොස් ඇත. | 5.1.1.1.පාසල්වලට සහ මාධ්‍ය පුහුණු ආයතන /විශ්ව විද්‍යාලවල පාඨමාලාවල පවතින මාධ්‍ය විෂය සඳහා "ළමයා සහ මාධ්‍ය" විෂය මාලාව හඳුන්වා දීම.<br><br>5.1.1.2. පාසල්වල 6 සිට 8 ශ්‍රේණිය දක්වා මාධ්‍ය හා සන්නිවේදන සහ මාධ්‍ය සමාජ හඳුන්වා දීම | සංවර්ධිත විෂයමාලා<br><br>මාධ්‍ය සහ සන්නිවේදන සමාජ ස්ථාපිත කිරීම | ළමයා හා මාධ්‍ය පිළිබඳ විෂයමාලා ලබා ගැනීමේ හැකියාව | 1. අදාළ බලධාරීන් සමඟ සාකච්ඡා කිරීම<br>2. විෂයමාලා සංවර්ධනය | | 2025 - 2027 | | සෞ.ජ. මා.අමා.<br><br>අ.උ.අ.වෘ.අ.අමා.<br><br>ජා.අ.ආ<br><br>ජාතික විශ්ව විද්‍යාල<br><br>ශ්‍රී.ල.ප.ආ.<br><br>ජා.ළ.ආ.අ. | 2.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | | | | 5.1.1.2. ළමා ආරක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය පිළිබඳව මාධ්‍යවේදීන් දැනුවත් කිරීම | පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව<br><br>ප්‍රතිලාභී මාධ්‍යවේදීන් සංඛ්‍යාව | පුහුණු අත්පොත පුහුණු වාර්තා/ ප්‍රගති වාර්තා | 1. මෙම වැඩසටහන සඳහා සමාජ හැසිරීම් වෙනස් කිරීමේ සන්නිවේදන උපාය හඳුනා ගැනීම<br>2. වැඩසටහන සංවර්ධනය කිරීම<br>3. වැඩසටහන පැවැත්වීම | 2025 | | | සෞ.ජ. මා.අමා.<br><br>ජා.ළ.ආ.අ. | 2.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | | | | 5.1.1.3. ළමා ආරක්ෂාව පිළිබඳව ජාතික ප්‍රතිපත්තිය පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම | පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව<br><br>ප්‍රතිලාභී පුද්ගලයන් සංඛ්‍යාව | ප්‍රගති වාර්තා දැනුවත් කිරීමේ මෙවලම් තිබීම | 1. මෙම වැඩසටහන සඳහා සමාජ හැසිරීම් වෙනස් කිරීමේ සන්නිවේදන උපාය හඳුනා ගැනීම<br>2. වැඩසටහන සංවර්ධනය කිරීම<br>3. වැඩසටහන පැවැත්වීම | 2025 | | | සෞ.ජ. මා.අමා.<br><br>ජා.ළ.ආ.අ. | 2.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | 5.2. භාරකරුවන් සහ රැකවරණය සපයන්නන් දැනුවත් කිරීම මඟින් ඩිජිටල් වේදිකාවල ළමා ආරක්ෂාව සහතික කිරීම. | 5.2.1. අන්තර්ජාලය තුළ ළමයාගේ ආරක්ෂාව පිළිබඳ දෙමාපියන් සහ රැකබලාගන්නන්-න් අතර දුර්වල දැනුවත්භාවය | 5.2.1.1. මාර්ගගත සාහසිකත්වය සහ ඩිජිටල් භාවිතය සම්බන්ධ ගැටළු පිළිබඳව දෙමාපියන් සහ ගුරුවරුන් සඳහා අඛණ්ඩ දැනුවත් කිරීමේ වැඩසටහන් සැලසුම් කිරීම සහ පැවැත්වීම. | පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව<br><br>ප්‍රතිලාභී දෙමාපියන් සංඛ්‍යාව<br><br>ප්‍රතිලාභී ගුරුවරුන් සංඛ්‍යාව | දැනුවත් කිරීමේ ව්‍යාපාර සඳහා වැඩසටහන් උපායමාර්ගික සටහන මාධ්‍ය නියාමන වාර්තා | 1.සහභාගී කණ්ඩායම් හඳුනාගැනීම.<br>2. වැඩසටහන් සංවර්ධනය කිරීම.<br>3.පුහුණුවීම් පැවැත්වීම | 2025 | | | සෞ.ජ. මා.අමා.<br><br>ජා.ළ.ආ. අ.<br><br>වි.තා.අ මා.<br><br>අ.උ.අ.වෘ .අ.අමා. | 2.500 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | | 5.3 මාධ්‍ය සංවේදීකරණය මඟින් ළමා අයිතිවාසිකම් සහ ළමා ආරක්ෂාව පිළිබඳ දැනුම තහවුරු කිරීම | 5.3.1.ළමා අයිතිවාසිකම් සහ ළමා ආරක්ෂාව පිළිබඳව මාධ්‍යවේදීන්ගේ දුර්වල දැනුවත්භාවය | 5.3.1.1. ළමා අයිතිවාසිකම් සම්මුතිය යටතේ ළමා ආරක්ෂණ අයිතිවාසිකම් සම්බන්ධ මූලධර්ම පිළිබඳව මාධ්‍ය සහ තොරතුරු තාක්ෂණ විෂය යටතේ සියලුම නිලධාරීන් සඳහා සංවේදීකරණ වැඩසටහන් | පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව<br><br>ප්‍රතිලාභී නිලධාරීන් සංඛ්‍යාව | වැඩසටහන් වාර්තා | 1.මොඩියුලය සංවර්ධනය කිරීම.<br>2. සහභාගීත්ව කණ්ඩායම් හඳුනා ගැනීම.<br>3.පුහුණුවීම් පැවැත්වීම | | | 2025 - 2029 | සෞ.ජ. මා.අමා.<br><br>වි.තා.අ මා.<br><br>ජා.ළ.ආ. අ.<br><br>ප.ළ.ර. සේ.දෙ | 3.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | | | | 5.3.2. මාර්ගගත සාහසිකත්වය සහ ඩිජිටල් භාවිතය සම්බන්ධ ගැටළු පිළිබඳව ළමුන් සඳහා අඛණ්ඩ දැනුවත් කිරීමේ වැඩසටහන් | පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව<br><br>ප්‍රතිලාභී ළමුන් සංඛ්‍යාව | ප්‍රගති වාර්තා | 1.මොඩියුල සංවර්ධනය කිරීම.<br>2. සහභාගිත්ව කණ්ඩායම් හඳුනා ගැනීම.<br>3.පුහුණුවීම් පැවැත්වීම | | | 2025 - 2029 | සෞ.ජ. මා.අමා.<br><br>ජා.ළ.ආ. අ.<br><br>වි.තා.අ මා. | 10.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | සැලසුම් කිරීම සහ පැවැත්වීම. | | | | | | | අ.උ.අ.වෘ .අ.අමා. | | |
| | | | | 5.3.3. පාසල් මාධ්‍ය සමාජවලට සහ සිසුන්ට සදාචාරාත්මක මාධ්‍ය භාවිතය පිළිබඳ හැකියාව ඇති කිරීම සඳහා ඒකමිතික වැඩසටහනක් පැවැත්වීම | පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව<br><br>ප්‍රතිලාභී ළමුන් සංඛ්‍යාව. | ප්‍රගති වාර්තා | 1. අධ්‍යාපන අමාත්‍යාංශය විසින් චක්‍රලේඛයක් සකස් කිරීම.<br>2.බහු ආංශික කමිටුවක් පිහිටුවීම<br>3. විෂය සමගාමී විෂයමාලා අන්තර්ගතය සංවර්ධනය කිරීම<br>4.සහභාගීත්ව කණ්ඩායම් හඳුනා ගැනීම.<br>5.වැඩසටහන් ක්‍රියාත්මක කිරීම<br>. | | | 2025 - 2029 | සෞ.ජ. මා.අමා.<br><br>ජා.ළ.ආ. අ.<br><br>වි.තා.අ මා.<br><br>අ.උ.අ.වෘ .අ.අමා.<br><br>(පෞද්ග ලික පාසල් සඳහා) | 5.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| 6. සාක්ෂි ජනනය කිරීම | | 6.1 ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් මාධ්‍ය ක්ෂේත්‍රයේ විවිධ අංශ පිළිබඳව සාක්ෂි මත පදනම් වූ තීරණ ගැනීම සහතික කිරීම | 6.1.1. ප්‍රමාණවත් පර්යේෂණ සහ අධ්‍යයනයන් නොමැතිවීම. | 6.1.1.1. පර්යේෂණ / අධ්‍යයන පැවැත්වීම | අවසන් කරන ලද පර්යේෂණ / අධ්‍යයනය | පර්යේෂණ /අධ්‍යයනවාර්තා | 1. පර්යේෂණ / අධ්‍යයනය සඳහා මාතෘකා සහ ක්‍රමවේදය නිර්ණය කිරීම<br>2. පර්යේෂණ / අධ්‍යයනය පැවැත්වීම<br>3. පර්යේෂණ / අධ්‍යයන එළිදැක්වීම. | | 2025 - 2027 | | සෞ.ජ. මා.අමා.<br><br>ශ්‍රී..ල.ප. ආ.<br><br>ජා.ළ.ආ. අ.<br><br>ශ්‍රී.ල.පු.ම .<br><br>ජාතික විශ්ව විද්‍යාල | 5.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 7. ඇගයුම් ක්‍රමවේ-දය | | 7.1 ළමා ආරක්ෂාව පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රමානුකූලව ක්‍රියාත්මක කිරීම | | 7.1.1.1. කාර්තුමය ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම<br><br>7.1.1.2. වාර්ෂික ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම | නිරන්ත-යෙන් ප්‍රගති සමාලෝච-න රැස්වීම් පවත්වන ලදී<br><br>ක්ෂේත්‍ර විශේෂිත නිර්දේශ ඉදිරිපත් කර ඇත | සමාලෝචන වාර්තා | 1.සමාලෝචන රැස්වීම් පැවැත්වීම<br>2. ක්ෂේත්‍ර වාර්තා විශ්ලේෂණය<br>3. වැඩිදියුණු කිරීම්/ ඉදිරි මාර්ග සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම | | | 2025 - 2029 | සෞ.ජ. මා.අමා.<br><br>අ.උ.අ.වෘ .අ.අමා.<br><br>බු.ශා.ආ. සං.ක.අ මා.<br><br>වි.තා.අ මා.<br><br>ජා.ළ.ආ. අ. | 0.100 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

# 06.සෞඛ්‍ය ක්ෂේත්‍රය

**ක්ෂේත්‍රය පිළිබඳ අර්ථ දැක්වීම:**

ශ්‍රී ලංකාවේ රාජ්‍ය සෞඛ්‍ය සේවාවන් ජාතික සෞඛ්‍ය ප්‍රතිපත්තිය (1996 – 2025) මගින් මෙහෙයවනු ලැබේ .එහි සඳහන් වන ආකාරයට සෞඛ්‍ය අංශය පහත සඳහන් සංරචක වලින් සමන්විත වේ. නිවාරණීය/නිරෝධක සෞඛ්‍ය සේවා ශක්තිමත් කිරීම; සැමට සුදුසු සහ ලබා ගත හැකි උසස් තත්ත්වයේ සුව කිරීමේ සත්කාර; ගුණාත්මක පුනරුත්ථාපන සත්කාර සඳහා සාධාරණ ප්‍රවේශය; සාක්ෂි  මත පදනම් වූ සේවා සැපයීම; රෝගීන් සඳහා මූල්‍ය අවදානම අවම කිරීම පිණිස උපාය මාර්ග; සෞඛ්‍ය පද්ධතිය වඩා හොඳ ප්‍රතිව්‍යුහගත කිරීමකට ලක් කිරීම; සහ සියලුම සෞඛ්‍ය සේවා සපයන්නන් සමඟ උපායමාර්ගික හවුල්කාරිත්වය සහතික කිරීම.

**ළමා ආරක්ෂාව සඳහා අදාළත්වය:**

ළමා සෞඛ්‍ය සහ යහපැවැත්ම ළමා ආරක්ෂාව සමඟ නිසඟයෙන්ම සම්බන්ධවන්නේ ඒවා අන්‍යෝන්‍ය වශයෙන් පරායත්ත වන බැවිනි. ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සේවාව පිළිබඳ ඉහත නිර්වචනය තුළ ප්‍රධාන සේවා ක්ෂේත්‍ර තුනක් හඳුනාගෙන ඇත; ඒවා නම් නිවාරක සෞඛ්‍ය රැකවරණය, ප්‍රතිකාරක සෞඛ්‍ය රැකවරණය සහ පුනරුත්ථාපනකාරී සෞඛ්‍ය රැකවරණයයි. ජාතික සෞඛ්‍ය ප්‍රතිපත්තිය තුළ ළමා ආරක්ෂණය, එනම් අපයෝජනය, සූරාකෑම, ප්‍රචණ්ඩත්වය සහ නොසලකා හැරීම් වලින් ළමයින් ආරක්ෂා කිරීම සඳහා ජාතික යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම පුනරුත්ථාපනකාරී සෞඛ්‍ය සේවාව තුළ පමණක් පැහැදිලිව සඳහන් කර ඇතත්, එය සේවා වර්ග තුනටම ඒකාබද්ධ වේ. නිවාරක සෞඛ්‍ය රැකවරණය තුළ, ධනාත්මක මාපිය කටයුතු සහ ලිංගික හා ප්‍රජනක සෞඛ්‍ය ඇතුළු ආරක්ෂිත සෞඛ්‍ය භාවිතයන් පිළිබඳව පවුල් සහ ළමයින් දැනුවත් කිරීම සහ අදාල සේවා සැපයීම සඳහා සෞඛ්‍ය අංශය ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. ප්‍රතිශක්තිකරණ සහ මාතෘ හා ළමා සෞඛ්‍ය සේවා වැනි මූලික සේවාවන් ළමයින්ගේ සහ මව්වරුන්ගේ කායික සෞඛ්‍ය අධීක්ෂණය කිරීම සහතික කරයි. මීට අමතරව, නව යොවුන් මානසික සෞඛ්‍ය සේවාවන් මඟින් ළමුන් අතර මානසික සෞඛ්‍ය ගැටලු කළමනාකරණය සහ වැළැක්වීම සඳහා ප්‍රජා මට්ටමින් ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. ප්‍රතිකාරක ළමා රැකවරණය ලබාදීම රාජ්‍ය ළමා ආරක්ෂණ පද්ධතියේ කොටසක් වන අතර එම ක්‍රියාවලියේදී සෑම වින්දිත ළමයෙකුම සුදුසුකම්ලත් සෞඛ්‍ය සේවා වෘත්තිකයන් විසින් පරීක්ෂාකර තක්සේරු කිරීම නීත්‍යානුකූලව අවශ්‍ය වේ; එමඟින් වින්දිතයින්ට චිත්තවේගී ප්‍රකම්පනය/මානසික ආතතිය සහ පීඩාව යටපත් කර ගැනීම පිණිස වන පෞද්ගලික අවශ්‍යතා සපුරා ගැනීමට අවශ්‍ය සේවාවන් පිරිනමනු ලැබේ.

**ආයතනික රාමුව:**

සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය සහ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව සියලුම රාජ්‍ය සෞඛ්‍ය රැකවරණ සේවා සඳහා පුළුල් නායකත්වයක් සපයයි. පවුල් සෞඛ්‍ය කාර්යාංශය, සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශය, පෝෂණ අංශය, වසංගත රෝග විද්‍යා අංශය සහ මහජන සෞඛ්‍ය සේවා තුළ ජාතික ලිංගාශ්‍රිත රෝග/ඒඩ්ස් මර්දන වැඩසටහන මෙන්ම මානසික සෞඛ්‍ය අධ්‍යක්ෂ කාර්යාලය සහ ප්‍රාථමික රැකවරණ සේවා, ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් මෙන්ම ළමයින්ගේ යහපැවැත්ම සහ ළමා අපයෝජන වැළැක්වීම සම්බන්ධයෙන් සෞඛ්‍ය අංශයෙන් ගන්නා සියලුම ක්‍රියාමාර්ග සඳහා ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. මීට අමතරව, ශ්‍රී ලංකා වෛද්‍ය සභාව (ශ්‍රී.ල.වෛ.ස.), ශ්‍රී ලංකා වෛද්‍ය සංගමය  (ශ්‍රී.ල.වෛ.සං) සහ ශ්‍රී ලංකා ළමා රෝග විශේෂඥවරුන්ගේ විද්වත් සංගමය වැනි ව්‍යවස්ථාපිත සහ වෘත්තීය ආයතන ළමා අපයෝජනවලට මුහුණ දීම සඳහා තමන් විසින් ම කටයුතු ආරම්භ කරමින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ.

| උපාය මාර්ගය | | උපාය මාර්ගික අරමුණු | ගැටලු | ප්‍රධාන ක්‍රියාකාරකම් / මැදිහත්වීම් | ප්‍රධාන කාර්ය සාධක දර්ශකය | සත්‍යාපනය කිරීමේ ක්‍රම | උප ක්‍රියාකාරකම් | වසර 1 | වසර1 -3 | වසර 1-5 | ප්‍රධාන වගකිව යුතුආයතන | ඇස්තමේන්තුගත අයවැය (රු. මිලියන) | අරමුදල් මූලාශ්‍රය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1. නීති ක්‍රියාත්මක කිරීම සහ බලාත්මක කිරීම | 1.2 ප්‍රතිපත්ති | 1.2.1.ළමයින්ට එරෙහි සාහසිකත්වය වැලැක්වීම සහ ප්‍රතිචාර දැක්වීම සඳහා සෞඛ්‍ය සේවා වෙතින් විධිමත් කැපවීම සහ උපාය මාර්ගික මඟ පෙන්වීම | 1.1.1 ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් සෞඛ්‍ය අංශයේ කාර්යභාරයේ ප්‍රතිපත්තිමය අනුකූලතාවයක් නොමැතිකම | 1.1.1.1.1.1. පවතින ජාතික සෞඛ්‍ය ප්‍රතිපත්තිය සමාලෝචනය කර සෞඛ්‍ය අංශය විසින් සපයනු ලබන පුළුල් සේවා විෂය පථය තුළ ළමුන්ට එරෙහි සාහසිකත්වය වැළැක්වීම සහ ප්‍රතිචාර දැක්වීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම. | අවසන් ප්‍රතිපත්ති සමාලෝචන වාර්තාව | සමාලෝචන රැස්වීම්<br><br>ප්‍රතිපත්ති සමාලෝචන වාර්තාව | 1. කමිටුවක් පත් කිරීම<br>2.පාර්ශ්වකරුවන්ගේ උපදේශන<br>3.ප්‍රතිපත්තිය සමාලෝචන කිරීම.<br>4. වාර්තාව සකස් කිරීම<br>5. සොයාගැනීම් බෙදා හැරීම<br>6. නිර්දේශ ක්‍රියාත්මක කිරීමට සැලැස්මක් සකස් කිරීම | | | 2025 - 2029 | සෞ.ජ. මා.අමා. . | 0.100 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | | 1.2.1 මානසික සෞඛ්‍ය පිළිබඳ ප්‍රතිපත්තිය සමාලෝචනය කිරීමෙන් ළමයාගේ අවශ්‍යතා සපුරාලීම සඳහා සපයනු ලබන සේවාවන් තවදුරටත් ශක්තිමත් කිරීම. | 12.1.1. ළමයා සඳහා ප්‍රමාණවත් මැදිහත්වීමක් මානසික සෞඛ්‍ය ප්‍රතිපත්තියට ඇතුළත් නොවේ | 1.2.1.1.1.1. අනුමත මානසික සෞඛ්‍ය ප්‍රතිපත්තිය යටතේ ළමා මානසික සෞඛ්‍යය සඳහා වෙනම උපාය මාර්ගික සැලැස්මක් සකස් කිරීම | ළමා මානසික සෞඛ්‍යය, මානසික සෞඛ්‍ය ප්‍රතිපත්තියේ කොටසක් ලෙස පිළිගෙන ඇති බව සහතික කිරීම සඳහා උපාය | ප්‍රධාන නිර්දේශය පිළිබඳ සමාලෝචන වාර්තාව එළිදැක්වීම සඳහා උපාය මාර්ගික සැලැස්ම පවතී | 1. මානසික සෞඛ්‍ය ප්‍රතිපත්තියේ ළමා මානසික සෞඛ්‍යය සංරචකය සමාලෝචනය කිරීමට කමිටුවක් පත් කිරීම<br>2. අනුමත මානසික සෞඛ්‍ය ප්‍රතිපත්තිය යටතේ ළමා මානසික සෞඛ්‍යය සඳහා | | 2025 - 2027 | | මා.සෞ. අ.කා. | 2.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | මාර්ගික සැලැස්මක් සකස් කර ඇත. | | වෙනම උපාය මාර්ගික සැලැස්මක් සකස් කිරීම<br>3. උපාය මාර්ග යටතේ ක්‍රියාකාරකම් සැලැස්මක් සකස් කිරීම | | | | | | |
| | | 1.2.1 ප්‍රජනක සෞඛ්‍ය පිළිබඳ ප්‍රතිපත්තිය සමාලෝචනය කිරීමෙන් ළමයාගේ අවශ්‍යතා සපුරාලීම සඳහා සපයනු ලබන සේවාවන් තවදුරටත් ශක්තිමත් කිරීම. | 1.2.2.1. ළමයා සම්බන්ධයෙ-න් ප්‍රජනක සෞඛ්‍ය පිළිබඳ ප්‍රමාණවත් මැදිහත්වීමක් සිදු නොවේ | 12.2.1.1. ප්‍රජනක සෞඛ්‍ය ප්‍රතිපත්තිය සමාලෝචනය කර අවශ්‍ය සංශෝධන සිදු කිරීම | ළමුන් සඳහා ලිංගික ප්‍රජනක සෞඛ්‍ය පිළිබඳ අධ්‍යාපනය ඇතුළත් ප්‍රතිපත්තිය | නිර්දේශ සහිත සමාලෝචන වාර්තාව<br><br>ළමුන් සඳහා ලිංගික ප්‍රජනන සෞඛ්‍යය අධ්‍යාපනය ඇතුළුව සංශෝධිත ප්‍රතිපත්තිය<br><br>එළිදැක්වීම සඳහා ක්‍රියාකාරී සැලැස්ම | 1. 12 ශ්‍රේණියේ පන්ති සඳහා පවත්වන ලද නියමු ව්‍යාපෘතියේ ප්‍රතිඵල සමාලෝචනය කිරීම<br>2. අනෙකුත් ශ්‍රේණි සඳහා වත්මන් ලිංගික ප්‍රජනන සෞඛ්‍යය අධ්‍යාපනය ඇගයීම;<br>3.www.yowunpiyasa.lk හි ඇති මාර්ගගත තොරතුරු හරහා ලිංගික ප්‍රජනන සෞඛ්‍යය අධ්‍යාපනය ලබා දීම.<br>5. අනෙකුත් ශ්‍රේණිවලට දීර්ඝ කිරීම | | 2025 - 2027 | | අ.උ.අ.වෘ .අ.අමා.<br><br>සෞ.ජ. මා.අමා. . | 0.500 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1.2 රෙගු-ලාසි | 1.2.1 ආයතනගත ළමයාගේ සෞඛ්‍යය සහතික කිරීම සඳහා ළමා සෞඛ්‍ය තක්සේරු කිරීම් වෙනුවෙන් ළමා රෝග වෛද්‍යවරුන් විසින් සියලුම ළමා ආරක්ෂණ ආයතන වෙත වරින් වර පැමිණීම. | 1.2.1.1. ආයතනයක ළමයින් නිරන්තරයෙ-න් සෞඛ්‍ය පරීක්ෂාවට ලක් නොවේ | 1.2.1.1.1. ආයතන සමඟ සහයෝගයෙන් අදාළ තක්සේරු කිරීම් සඳහා නිසි යාන්ත්‍රණයක් සඳහා අවශ්‍ය රෙගුලාසි / චක්‍රලේඛ සකස් කිරීම. | නිල චක්‍රලේඛය අත්සන් කර නිකුත් කර ඇත | ආයතන සමඟ සහයෝගයෙන් අදාළ තක්සේරු කිරීම් සඳහා නිසි යාන්ත්‍රණයක් සඳහා අනුමත රෙගුලාසි / චක්‍රලේඛය පවතී | 1. ආයතනික ළමුන් සඳහා ඒකාබද්ධ වෛද්‍ය ආවරණය සඳහා යාන්ත්‍රණයක් කෙටුම්පත් කිරීමට තාක්ෂණික කමිටුවක් පත් කිරීම<br>2. රෙගුලාසි / චක්‍රලේඛය සකස් කිරීම<br>3. රෙගුලාසි / චක්‍රලේඛයට අදාළ අනුමැතිය ලබා ගැනීම<br>4. ළමා රැකවරණ සේවා සපයන ආයතන නියාමනය | | | 2025 - 2029 | ප.සෞ. කා.<br><br>මා.සෞ. අ.කා. | 0.300 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | | | 1.2.1.2. අපයෝජනය-ට ලක් වූ ළමයින්ට රෝහලේදී අනිවාර්ය මානසික සෞඛ්‍ය තක්සේරුවක් නොලැබේ | 1.2.1.2.1 අධිකරණ වෛද්‍ය පරීක්ෂාවේ කොටසක් ලෙස සෑම ළමයෙකුටම අනිවාර්ය මානසික සෞඛ්‍ය තක්සේරුවක් සඳහා රෙගුලාසි/ මාර්ගෝපදේශ සකස් කිරීම. | රෙගුලාසි සංවර්ධනය කර බලාත්මක කර ඇත | බලාත්මක කරන ලද රෙගුලාසි | 1පාර්ශවකරුවන්-ගේ සාකච්ඡා<br>2. රෙගුලාසි / චක්‍රලේඛය සකස් කිරීම<br>3. රෙගුලාසි / චක්‍රලේඛයට අදාළ අනුමැතිය ලබා ගැනීම<br>4. රෙගුලාසි ක්‍රියාත්මක කිරීම. | | 2025 - 2027 | | සෞ.ජ. මා.අමා. .<br><br>මා.සෞ. අ.කා.<br><br>ජා.ළ.ආ. අ. | 0.100 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1.3 ක්‍රියා-ත්මක කිරීම | 1.3.1. වින්දිත ළමයින් සඳහා විසඳුම් සෙවීම පිණිස බහු-ආංශික ප්‍රතිචාරය ශක්තිමත් කිරීම | 1.3.1.1. ළමා අපයෝජනය-ට ගොදුරු වුවන්ට වින්දිතභාව-යේ මූලික හේතුව අනුව නිවැරදි විසඳුම් සෙවීමට පවතින ක්‍රමයේ ලුහුඬුතා තිබේ | 1.3.1.1.1. රෝහල් සිද්ධි සම්මන්ත්‍රණ යාන්ත්‍රණයන් සහ සමාලෝචන ශක්තිමත් කිරීම.<br><br>1.3.1.1.2. වින්දිත ළමයින්ට විසඳුම් සෙවීමේදී බහු-ආංශික ප්‍රතිචාර සමාලෝචනය කිරීම<br><br>1.3.1.1.3. විස්තීර්ණ නිවැරදි පුහුණු ආකෘතියක් දිස්ත්‍රික්කයක නියමු වැඩ ස්ථානයක් ලෙස කිරීම | යහපත් පරිචය පිළිබඳ ආකෘතිය සමාලෝච-නය කර ප්‍රචලිත කිරීම | යහපත් පරිචය පිළිබඳ ආකෘතිය සහ ප්‍රචලිත කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම ලබා ගත හැකි වීම | 1. බහු විධ ප්‍රතිචාරය සමාලෝචනය කිරීමට විශේෂඥ කමිටුවක් පත් කිරීම<br>2. සමාලෝචනය පැවැත්වීම සහ දත්ත විශ්ලේෂණය කිරීම<br>3. යහපත් පරිචය පිළිබඳ ආකෘතිය හඳුනාගැනීම<br>4. නියමු ව්‍යාපෘතිය සඳහා සම්පත් සැලසුම් කිරීම සහ මූල්‍ය ප්‍රතිපාදන යෙදීම<br>5. හඳුනාගත් දිස්ත්‍රික්කවල යහපත් පරිචය පිළිබඳ නියමු ව්‍යාපෘතිය පැවැත්වීම | | | 2025 - 2029 | ජා.ළ.ආ.අ.<br><br>ප.සෞ.කා. | 3.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| 2. සම්-මත-යන් සහ අග-යන් | | 2.1 සෞඛ්‍ය ක්ෂේත්‍රයේ වෘත්තිකයන් සහ කාර්ය මණ්ඩලය ළමයින් සමඟ හැසිරිය යුතු ආකාරය පිළිබඳව ළමා හිතකාමී ආචාර ධර්ම පද්ධතියක් හඳුන්වා දීම | 2.1.1. වෛද්‍ය ප්‍රතිකාර අතරතුර ඇති-වන ළමා ආරක්ෂණ ගැටළු | 2.1.1.1. වෛද්‍ය ක්ෂේත්‍රයට අදාළ වෘත්තිකයන් සහ කාර්ය මණ්ඩලය සඳහා ළමා ආරක්ෂාව පිළිබඳ ආචාර ධර්ම සංග්‍රහය හඳුන්වාදීම | වෛද්‍ය ක්ෂේත්‍රයට අදාළ වෘත්තිකයන් සහ කාර්ය මණ්ඩලය සඳහා ළමා ආරක්ෂාව සඳහා ආචාර ධර්ම සංග්‍රහය | වෛද්‍ය ක්ෂේත්‍රයට අදාළ වෘත්තිකයන් සහ කාර්ය මණ්ඩලය සඳහා ළමා ආරක්ෂාව පිළිබඳ අනුමත ආචාර ධර්ම පද්ධතිය | 1. කමිටුවක් පත් කිරීම<br>2. සාහිත්‍ය විචාරය<br>3. සංකල්ප පත්‍රිකා සකස් කිරීම<br>4. පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා කිරීම<br>5. පාර්ශ්වයන්ගේ එකඟතාවය | | 2025 - 2027 | | ශ්‍රී.ල. වෛ.ස.<br><br>ප.සෞ.කා. | 1.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | ආචාර ධර්ම පද්ධතිය සම්මත කිරීම පිළිබඳ නියාමන වාර්තා | 6. ආචාර ධර්ම කෙටුම්පත් කිරිම<br>7. අනුමැතිය ලබා ගැනීම<br>8. ආචාර ධර්ම සංග්‍රහය එළිදැක්වීම. | | | | | | |
| 3. මාපි-ය සහ රැක-වරණ සප-යන්-නන්-ගේ සහා-ය | | 3.1 ළමා ආරක්ෂාව සඳහා සහාය වීම පිණිස සමස්ත දෙමාපිය කුසලතා වැඩි දියුණු කිරීම | 3.1.1. ළමයින්ගේ හැසිරීම් ගැටළු ආමන්ත්‍රණය සඳහා ප්‍රමාණවත් දෙමාපියන් තුළ කුසලතා නොමැති වීම | 3.1.1.1. ඒකාබද්ධ කළ සත්කාර පිළිබඳ දෙමාපියන් දැනුවත් කිරීමේ වැඩසටහන් (උදා. අලුත විවාහ වූ යුවල සඳහා උපදේශන සැසි, පූර්ව ප්‍රසව රැකවරණය, ළමා සංවර්ධන සායනය, පශ්චාත් ප්‍රසව කාලය තුළ නිවෙස් බැලීම්, පෙර පාසල් සැසි, පාසල් දෙමාපිය රැස්වීම්)<br><br>3.1.1.2 ළමා ආරක්ෂාව පිළිබඳ නව යොවුන් වියේ ළමයින් සිටින දෙමාපියන් දැනුවත් කිරීමේ වැඩසටහන | වැඩසටහ-න් මොඩියුල සංවර්ධනය කර ඇත.<br><br>සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී ප්‍රදේශය අනුව පවත්වනු ලබන වැඩසටහන්-වල ප්‍රතිශතය ආවරණය කිරීම | වැඩසටහන් අත්පොත ලබා ගැනීමේ ඇති හැකියාව<br><br>ආවරණය පිළිබඳ ප්‍රගති වාර්තා | 1. ක්‍රියාකාරකම් 1 සහ 2 සඳහා මොඩියුල සැලසුම් කිරීම<br>2. සම්පත් දායකයින් පුහුණු කිරීම<br>3. වැඩසටහන් පැවැත්වීම<br>4. ප්‍රතිඵල ඇගයීම; ගෝලීය පාසල් සෞඛ්‍ය සමීක්ෂණය | | | 2025 - 2029 | සෞ.ජ. මා.අමා.<br><br>අ.උ.අ.වa .අ.අමා. | 2.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | 3.2 අපයෝජනයට ලක් වූ ළමයින්ගේ, වර්ධනයේ ප්‍රමාද වූ ළමයින්ගේ සහ හඳුනාගත් අවශ්‍යතා සහිත හා ආබාධ සහිත ළමයින්ගේ දෙමාපියන්ගේ දෙමාපිය කුසලතා ශක්තිමත් කිරීම. | 3.2.1. බලපෑමට ලක් වූ දෙමාපියන් තුළ ප්‍රමාණවත් කුසලතා නොමැති වීම | 3.2.1.1. අපයෝජනයට ලක් වූ ළමයින්ගේ, වර්ධනයේ ප්‍රමාද වූ ළමයින්ගේ, හඳුනාගත් අවශ්‍යතා සහිත සහ ආබාධ සහිත ළමයින්ගේ පවුල් සඳහා මාපිය පුහුණු වැඩසටහන් | වැඩසටහන් මොඩියුල සංවර්ධනය කර ඇත<br><br>සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී ප්‍රදේශය අනුව පවත්වනු ලබන වැඩසටහන්-වල ප්‍රතිශතය ආවරණය කිරීම | වැඩසටහන් අත්පොත ලබා ගැනීමේ හැකියාව<br><br>ආවරණය පිළිබඳ ප්‍රගති වාර්තා | 1. ලෝක සෞඛ්‍ය සංවිධානයේ භාරකාර කුසලතා පුහුණු මොඩියුලය ශ්‍රී ලංකාවට අනුවර්තනය කිරීම<br>2. බෙදා හැරීමේ ක්‍රමවේදය හඳුනා ගන්න<br>3. පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන්<br>4. ඊ-මොඩියුල සංවර්ධනය බෙදා හැරීමේ නියෝජිතයන් හඳුනා ගැනීම<br>5. රැකවරණ කුසලතා පුහුණු වැඩසටහන ක්‍රියාත්මක කිරීම | | 2025 - 2027 | | ප.සෞ. කා. | 2.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | | | | 3.2.1.2. සංවර්ධනයේ ප්‍රමාදයන් සහ ගැටලු ඇති ළමයින් සඳහා පවුල පදනම් කරගත් මුල් ළමාවිය මැදිහත්වීම් සිදු කිරීම | අදාළ මැදිහත්වීම් නියමු සහ ප්‍රචලිත කර ඇත | ප්‍රගති වාර්තා<br><br>අයවැය සහ කාල රාමුව සමඟ සැලැස්ම ප්‍රචලිත කිරීම | 1. ආබාධ සහිත ළමයින් සඳහා මුල් ළමාවිය මැදිහත්වීම් ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම<br>2. හඳුනාගත් දිස්ත්‍රික්කවල වැඩසටහන ක්‍රියාත්මක කිරීම<br>3. ජාතික මට්ටමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම | | | 2025 - 2029 | ප.සෞ. කා. | 5.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 3.2.1.3. වර්ධන ප්‍රමාදයන් සහ ගැටලු සහිත ළමයින්සඳහා රජයේ අනුග්‍රහයෙන් මුල් ඉගෙනුම් අවස්ථා ලබාදීම | ප්‍රතිලාභී ළමුන් සංඛ්‍යාව<br><br>ප්‍රචලිත කිරීම පිළිබඳ නිර්දේශ වාර්තාව | ප්‍රගති වාර්තා | 1. පද්ධතිය සැලසුම් කිරීම<br>2. නියමු වැඩසටහන් පැවැත්වීම.<br>3. අදාළ මැදිහත්වීම්<br>4. ඇගයීම | | | 2025 - 2029 | සෞ.ජ. මා.අමා.<br><br>අ.උ.අ.වෘ .අ.අමා. | 10.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| 4. ප්‍රති-චාර සහ සහා-ය සේවා | | 4.1 ලිංගික ප්‍රජනක සෞඛ්‍යය පිළිබඳව ළමයා දැනුවත් කිරීමේ යාන්ත්‍රණයක් පිහිටුවීම මඟින් අනවශ්‍ය ගැබ් ගැනීම් වැළැක්වීම. | 4.1.1. නව යොවුන් ප්‍රජාවට නව යොවුන් වියේ ලිංගික හා ප්‍රජනක සෞඛ්‍ය සේවාවන් සඳහා විධිමත් ප්‍රවේශයක් නොමැතිකම | 4.1.1.1. ප්‍රජාව තුළ පවතින නව යොවුන් වියේ ලිංගික හා ප්‍රජනක සෞඛ්‍ය සේවාවන් පිළිබඳ දැනුවත්භාවය වැඩි කිරීම | අවශ්‍ය වූ විට නව යොවුන් වියේ ලිංගික හා ප්‍රජනක සෞඛ්‍ය සේවාවන් වෙත ළඟා වූ තරුණ සංඛ්‍යාව (සේවා වල මධ්‍ය කාලීන ඇගයීමක් මත පදනම්ව | වැඩසටහන් අත්පොත්<br><br>ප්‍රතිලාභී තරුණ සංඛ්‍යාව පිළිබඳ ප්‍රගති වාර්තාව | 1. දැනටමත් සංවර්ධනය කර ඇති මෙවලම් භාවිතයෙන් දැනුවත් කිරීම ක්‍රියාත්මක කිරීම<br>2. මාර්ගගත දැනුවත් කිරීමේ මෙවලම් සංවර්ධනය කිරීම.<br>3.අහඹු ලෙස තෝරාගත් ප්‍රදේශවල නව යොවුන් වියේ පුද්ගලයින් විසින් සේවා භාවිතය පිළිබඳ මධ්‍ය කාලීන ඇගයීම<br>4. ප්‍රතිපලඇගයීම<br>5. ජාතික යෞවන සෞඛ්‍ය සමීක්ෂණය | | | 2025 - 2029 | ප.සෞ. කා. ,<br><br>මා.සෞ. අ.කා.<br><br>ත.ක.ක්‍රී. අමා. | 4.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | 4.2 සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී, යොවුන් පියස සහ මිතුරු පියස යන රෝහල් මධ්‍යස්ථාන හරහා අපයෝජනයට ලක් වූ ළමයින් සහ පවුල් සඳහා උපකාරක සත්කාර ලබාදීමේ යාන්ත්‍රණය ශක්තිමත් කිරීම. | 4.2.1. රෝහලේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී, යොවුන් පියස සහ මිතුරු පියස මධ්‍යස්ථාන හරහා සපයනු ලබන සේවාව ඌන ප්‍රයෝජනයට ගැනීම. | 4.2.1.1. යොවුන් පියස මධ්‍යස්ථාන හරහා නව යොවුන් වියේ ලිංගික හා ප්‍රජනක සෞඛ්‍ය සේවා සැපයීම ශක්තිමත් කිරීම | යොවුන් / මිතුරු පියස ක්‍රියාත්මක වන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී ප්‍රදේශවලින් සේවා සැපයීම ප්‍රතිශතයක් ලෙස. | යොවුන් / මිතුරු පියස ක්‍රියාත්මක වේ.<br><br>කාර්තුමය සමාලෝචනය | 1. නව යොවුන් වියේ ලිංගික හා ප්‍රජනක සෞඛ්‍ය පිළිබඳවත් පුහුණුකරුවන් පුහුණු කිරීම.<br>2. විගණන සඳහා ප්‍රොටෝකෝලය සංවර්ධනය කිරීම.<br>3. විගණන පැවැත්වීම සඳහා පුහුණුකරුවන් පුහුණු කිරීම.<br>4.සෞ.අමා. තුළ අවම වශයෙන් එක් යොවුන් පියස මධ්‍යස්ථානයක් ශක්තිමත් කිරීම.<br>5. මිතුරු සහ යොවුන්පියස සේවා වැඩිදියුණු කිරීමේ විගණන පැවැත්වීම.<br>6. යොවුන් පියස ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම ජාතික මට්ටමේ සමාලෝචනය | | | 2025 - 2029 | ප.සෞ. කා. | 5.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 4.2.1.2. සියලුම නව යොවුන් සහ තරුණ හිතකාමී සෞඛ්‍ය සේවා මධ්‍යස්ථාන නව යොවුන් හිතකාමී මධ්‍යස්ථාන බවට පත් කිරීමෙන් යොවුන් පියස මධ්‍යස්ථානවල නව යොවුන් සහභාගීත්වය වැඩි කිරීම | සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී/ යොවුන් පියස / මිතුරු පියසහි සේවාවන් ලබා ගත් අපයෝජන-යට ලක් වූ ළමුන්ගෙන් ප්‍රතිශතයක් ලෙස.<br><br>යොවුන් සහ මිතුරු පියස මධ්‍යස්ථාන-හි කාර්යයන් සම්බන්ධ-යෙන් සිදු කරන ලද විගණනවලි-න් ප්‍රතිශතයක් ලෙස. | ප්‍රගති වාර්තා<br><br>කාර්තුමය ප්‍රගති සමාලෝචන | 1. තරුණ ක්‍රියාකාරී කණ්ඩායම හරහා දැනුවත්භාවය වැඩි කිරීම<br>2. විෂයමාලා හරහා පාසල් යන නව යොවුන් වියේ දැනුවත් කිරීම<br>3. අනෙකුත් දිස්ත්‍රික්කවල පද්ධතිය සමාලෝචනය කිරීම සහ අඛණ්ඩව පවත්වාගෙන යාම | | | 2025 - 2029 | ප.සෞ. කා. ,<br><br>සෞ.ප්ර. කා. ,<br><br>අ.උ.අ.වa .අ.අමා.<br><br>ත.ක.ක්‍රී. අමා. | 2.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | | | | 4.2.1.3. යොවුන් වියේ ගැබිනි ළමයින් සඳහා රැකවරණය සහ ආරක්ෂාව සැපයීම ශක්තිමත් කිරීම | නිවසින් බැහැරව ආරක්ෂාව අවශ්‍ය නව යොවුන් වියේ ගැබිනි | සෑම පළාතකම නිවසින් බැහැරව ආරක්ෂාව අවශ්‍ය යොවුන් වියේ ගැබිනි ළමයින් සඳහා | 1. යහපත් පරිචයක් ලබා ගැනීමේ මධ්‍යස්ථානයක් සඳහා ප්‍රොටෝකෝලය-ක් සකස් කිරීම | | | 2025 - 2029 | සෞ.ජ. මා.අමා.<br><br>අ.උ.අ.වa .අ.අමා.<br><br>කා.ළ.කා. අමා. | 10.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | (උදා: ප්‍රසව පූර්ව රැකවරණය/පශ්-චාත් ප්‍රසව රැකවරණය සහ මව සඳහා නේවාසිකාගාර පහසුකම්, ළමා රැකවණ පහසුකම්) | තත්වයෙන් පසුවන්නන් සඳහා සෑම පළාතකම වෙන් වූ පහසුකමක් තිබීම | වෙන්වූ පහසුකම් ලබාගත හැකි වීම. | 2. අධ්‍යාපනයේ අඛණ්ඩ පැවැත්ම සහතික කිරීම<br>3. ළමයින්ගේ රැකවරණය සහතික කිරීම සඳහා පැහැදිලි ප්‍රොටෝකෝලය-ක් සකස් කිරීම<br>4. අපයෝජනයට ලක්වීම සඳහා අවදානම් සහිත නව යොවුන් වියේ පසුවන්නන් සඳහා පාසල් නේවාසිකාගාර සංවර්ධනය කිරීම මඟින් හඳුනාගත් වැඩසටහන පළාත් කිහිපයක් පුරා ක්‍රියාත්මක කිරීම සහ කැපකරු මාපිය ක්‍රමයක් සඳහා යාන්ත්‍රණයක් සංවර්ධනය කිරීම.<br>5. අනෙකුත් දිස්ත්‍රික්කවල පද්ධතිය සමාලෝචනය කිරීම සහ අඛණ්ඩව පවත්වාගෙන යාම | | | | ජා.ළ.ආ.අ. | | |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | 4.3 දැඩි දෙමාපිය නොසලකා හැරීමෙන් පීඩාවට පත් වූ ළමයින් සඳහා පාසල හා සම්බන්ධ රජයේ අනුග්‍රහය ඇති ආරක්ෂිත ජීවත්වීමේ පරිසරයක් නිර්මාණය කිරීම | 4.3.1. හඳුනාගත් භූගෝලීය ස්ථානවල දැඩි මාපිය නොසැලකිල්-ල ඇතිව වින්දිත ළමයින් ජීවත්වීම.(මෙම ගැටලුව ඇතැම් විශේෂිත ප්‍රාදේශීයකර-ණය වූ ප්‍රජාවන් තුළ ඇති වේ) | 4.3.1.1. වින්දිත ළමයින් සඳහා හඳුනාගත් පාසල්වල නේවාසිකාගාර ඇති කිරීම | ස්ථාන 15ක නේවාසිකා-ගාර පිහිටුවා ඇත | වින්දිත ළමුන් සඳහා වෙන් කරන ලද ස්ථාන 15ක් තිබීම<br><br>නේවාසිකාගාර පාලිකාවන් සඳහා පුහුණු අත්පොත | 1. වින්දිත ප්‍රජාවේ ළමුන් සඳහා නේවාසිකාගාර පද්ධතිය සංවර්ධනය කිරීම සඳහා විශේෂඥ කමිටුවක් පත් කිරීම.<br>2. තිරසාර අරමුදල් ලබා ගැනීම.<br>3. ස්ථාන 15 ක් ක්‍රියාත්මක කිරීම | | | 2025 - 2029 | ජා.ළ.ආ.අ.<br><br>අ.උ.අ.වෘ.අ.අමා.<br><br>සෞ.ජ.මා.අමා. | 20.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | | 4.4 අපයෝජනයට ලක් වූ ළමුන් සඳහා "ළමා පියස" සංකල්පය පිළිබඳ යාන්ත්‍රණ ශක්තිමත් කිරීම | 4.4.1. අපයෝජනය-ට ලක්වන ළමයාට පහසුකම් සැලසීමට වෙනම ඒකකයක අවශ්‍යතාවය | 4.4.1.1. එක් පළාතකට එක් "ළමා පියස" මධ්‍යස්ථානයක් පිහිටුවීම මඟින් ළමා පියස මධ්‍යස්ථාන පුළුල් කිරීම | සෑම පළාතකටම "ළමා පියස" මධ්‍යස්ථාන-යක් | සෑම පළාතකම ළමා පියස මධ්‍යස්ථානයක් ක්‍රියාත්මක වේ | 1. යෝජනාවක් සකස් කිරීම සඳහා ශ්‍රී ලංකා ළමා රෝග විශේෂ වෛද්‍යවරුන්ගේ විද්‍යායතනය සහ අනෙකුත් පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා කිරීම<br>2. ස්ථානය හඳුනා ගැනීම.<br>3.ජාතික සැලසුම් අනුමැතිය<br>4.ධාරිතාව ගොඩනැගීමේ සැලැස්ම<br>5. ක්‍රියාත්මක කිරීම ආරම්භ කිරීම | | | 2025 - 2029 | සෞ.ජ.මා.අමා. . | 10.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | 4.5 අනවශ්‍ය ළදරුවන් භාරකරු හඳුනා නොගෙන රෝහලට භාරදීමේ ක්‍රමයක් හඳුන්වා-දීමෙන් ළමයා ආරක්ෂා කිරීම. | 4.5.1. ළදරු ඝාතනය, හා අත්හැර දැමීම අවම කිරීම සඳහා යාන්ත්‍රණයක අවශ්‍යතාවය. | 4.5.1.1. ළදරුවන් භාර ගැනීම සඳහා හඳුනාගත් රෝහල් පද්ධතියක බිළිඳු කවුළු ස්ථාපිත කිරීම | සෑම දිස්ත්‍රික්කය-කම ළදරුවන් භාරගැනීමේ කවුළු සහිත රෝහල් සංඛ්‍යාව<br><br>භාරගත් ළදරුවන් සංඛයාව | ප්‍රගති වාර්තා | 1. ළදරුවන් භාර ගැනීම සඳහා රෝහල්වල පද්ධතිය සංවර්ධනය කිරීම සඳහා විශේෂඥයන් සමඟ සාකච්ඡා කිරීම<br>2. එක පළාතක නියමු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම<br>3. සෞඛ්‍ය සේවකයින් සඳහා දැනුවත් කිරීමේ මෙවලමක් සංවර්ධනය කිරීම<br>4. හඳුනාගත් රෝ-හල්වල බිළිඳුන් භාරගැනීමේ කවුළු ස්ථාපිත කිරීම | | | 2025 - 2029 | සෞ.ජ. මා.අමා.<br><br>කා.ළ.ක. අමා. | 15.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | | | | 4.5.1.2. අපයෝජනයට ලක් වූ ළමයින්ට, පවුල්වලට සහ වරදකරුවන්ට මනෝ සමාජීය සහය ලබා දීමේ යාන්ත්‍රණය හඳුනා ගැනීම | මනෝ සමාජීය ආධාරක පියවරයන් වර්ධනය විය<br><br>මානසික සෞඛ්‍ය සහාය ලබන වැරදිකරුව-න් සංඛ්‍යාව<br><br>ප්‍රතිලාභි | වැඩසටහන් වාර්තා | 1. ප්‍රධාන පාර්ශවකරුවන් සඳහා උද්දේශනය<br>2. ජාතික එස්.ටී.ඩී/ඒඩ්ස් මර්දන වැඩසට-හනෙන් උගත් පාඩම් සමාලෝ-චනය කිරීම<br>3. සාමාන්‍ය තත්ත්වයට ඇතුළත් කර ගැනීම සඳහා අවශ්‍ය ලුහුඬුතා හා | | | 2025 - 2029 | සෞ.ජ. මා.අමා.<br><br>ජා.ළ.ආ. අ. | 0.100 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | වින්දිත ළමයින් සංඛ්‍යාව<br><br>ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව | | ක්‍රමෝපායන් හඳුනාගැනීම.<br>4. නියමු අධ්‍යාපනයේ ඇගයීම මඟින් පරිමාණය කළ හැකි විභවය හඳුනාගැනීම | | | | | | |
| | | 4.6 ළමයින්ගේ ආරක්ෂාව සඳහා ඔවුන්ගේ මානසික යහපැවැත්ම ඉතා වැදගත් වන බැවින්, සියලුම ළමාරක්ෂක වෘත්තිකයන් සඳහා මානසික සෞඛ්‍ය පරීක්ෂණ පහසුකම් සැපයීම සඳහා යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම. | 4.6.1. ළමයින් සමඟ වැඩ කරන පුද්ගලයින්ගේ මානසික යහපැවැත්ම තක්සේරු නොකෙරේ | 4.6.1.1. ළමුන් සමඟ වැඩ කරන පුද්ගලයින් සඳහා මානසික යහපැවැත්ම පරීක්ෂා කිරීම (මනෝමිතික ඇගයීම්) සඳහා යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම | ළමුන් සමඟ වැඩ කරන සියලුම පුද්ගලයින්ට මානසික යහපැවැත්ම පරීක්ෂා කිරීමේ මෙවලම හඳුන්වාදීම පිළිබඳ ප්‍රතිපත්තිමය තීරණය<br><br>පිරික්සුම් මෙවලම හඳුන්වාදී ඇත. | ප්‍රතිපත්ති තීරණය ලබා ගැනීමේ හැකියාව<br><br>පිරික්සුම් මෙවලමක් තිබීම | 1.යහපරිචයන් පිළිබඳ සමාලෝචනය<br>2. ළමුන් සමඟ වැඩකරන සියලුම පුද්ගලයින් සඳහා පිරික්සුම් මෙවලමක් හඳුන්වාදීම පිළිබඳ විශේෂඥ කණ්ඩායම් උපදේශනය<br>3. ළමයින් සමඟ වැඩකරන පුද්ගලයින් සඳහා පැකේජයක් සංවර්ධනය කිරීම<br>4.යාන්ත්‍රණය සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම | | | 2025 - 2029 | මා.සෞ. අ.කා.<br><br>මා.ළ. සෞ. වෛ.නි.<br><br>ප.ළ.ර. සේ.දෙ. | 2.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | 4.7 පුනරුත්ථාපනය කිරීමේ සහ නැවත වැරදි සිදුකිරීම වැළැක්වීමේ මාධ්‍යයක් ලෙස ලිංගික අපරාධකරුවන්ට මානසික සෞඛ්‍ය සහය ලබාදීමේ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම | 4.7.1. වැරදිකරුවන් ඉලක්ක කරගත් මැදිහත්වීම්වල අවධානය යොමු නොවීම, නැවත වැරදි කිරීමේ රටාවන් ඇති කරයි. | 4.7.1.1. සැක සහිත සහ වරදකරුවන් වූ ලිංගික අපරාධකරුවන්ට මානසික සෞඛ්‍ය සේවා සැපයීම සඳහා යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම | යාන්ත්‍රණය ස්ථාපිත කර ඇත<br><br>මානසික සෞඛ්‍ය ආධාර ලබන පුද්ගලයින් සංඛ්‍යාව | ක්‍රියාකාරී යාන්ත්‍රණය වෛද්‍යවාර්තා | 1. ගෝලීය යහපරිචයන් සමාලෝචනය කිරීම<br>2.පාර්ශ්වකරුවන්-ගේ උපදේශන<br>3. යාන්ත්‍රණය සංවර්ධනය කිරීම<br>4. සැක සහිත සහ වරදකරුවන් සම්බන්ධ කර ගැනීම<br>5. සේවාවන් ලබාදීම. | | | 2025 - 2029 | මා.සෞ. අ.කා.<br><br>ජා.ළ.ආ. අ.<br><br>බ.දෙ. | 0.100 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | | | | 4.7.1.2. විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාවේ වෙසෙන ළමයින් සඳහා නව යොවුන් ලිංගික හා සෞඛ්‍ය වැඩසටහන් හරහා ප්‍රජා පාදක සෞඛ්‍ය සහය ලබාදීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම. | නියමු වැඩසටහන් ඇති කිරීම<br><br>ප්‍රතිලාභී ළමුන් සංඛ්‍යාව | සේවා බෙදාහැරීමේ වාර්තා | 1.පාර්ශ්වකරුවන්-ගේ උපදේශන<br>2. පරිචය සහ සාහිත්‍ය සමාලෝචනය<br>3. ක්‍රමය සංවර්ධනය කිරීම.<br>4. පරිමාණය කිරීම සඳහා නියමු, වැඩසටහන සමාලෝචනය සහ සංශෝධනය කිරීම. | | | 2025 - 2029 | ප.සෞ. කා.<br><br>සෞ.ප්‍ර. කා. | 0.100 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 5. අ-ධ්‍යා-පනය සහ ජීවන කුස-ලතා | | 5.1 ළමයින්ගේ ආරක්ෂාව සඳහා ජීවන කුසලතා සංවර්ධනය අධ්‍යාපන පද්ධතියට ඒකාබද්ධ කිරීම | 5.1.1. ළමයින්ගේ ආරක්ෂාව සඳහා ඔවුන් බලගැන්වීම සඳහා පාසල් අධ්‍යාපන ක්‍රමයේ ඇති හැකියාව ප්‍රමාණවත් ලෙස ප්‍රයෝජනයට නොගැනීම | 5.1.1.1. ජීවන කුසලතා අධ්‍යාපනය විෂය මාලාවට ඒකාබද්ධ කිරීම<br><br>5.1.1.2. නව යොවුන්විය ලිංගික ප්‍රජනක සෞඛ්‍ය පිළිබඳ දෙමාපියන්ගේ දැනුවත්භාවය වැඩි කිරීමෙන් ආධාරක පරිසරයක් නිර්මාණය කිරීම | පාසල් අධ්‍යාපන ක්‍රමයේ ඒකාබද්ධ ජීවන කුසලතා පුහුණුව<br><br>ප්‍රතිලාභි ළමුන් සංඛ්‍යාව | නිපුණතා පුහුණු අත්පොත<br><br>ප්‍රගති වාර්තා | 1. විෂයමාලා, විෂය බාහිර හා කාර්ය මණ්ඩල සංවර්ධන අවස්ථා හඳුනාගැනීම<br>2. පවතින විෂයමාලාවලට ජීවන කුසලතා අධ්‍යාපන ක්‍රියාකාරකම් ඇතුළත් කිරීම<br>3. ජීවන කුසලතා පුහුණුව වැඩි දියුණු කිරීම සඳහා ක්‍රියාකාරකම් පදනම් කරගත් විෂයමාලා සැලසුම් කිරීම<br>4. සැලසුම් කර ඇති විෂයමාලාව නියමු කිරීම සහ ක්‍රියාත්මකකිරීම<br>5.පාසල් තුළ මාපිය ධාරිතාව ගොඩනැගීමේ වැඩසටහන් | | | 2025 - 2029 | ප.සෞ. කා.<br><br>ජා.අ.ආ.<br><br>අ.උ.අ.වa .අ.අමා. | 8.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | | 5.2 සමස්ත සමාජ ප්‍රවේශයක් හරහා ළමා ආරක්ෂාව සඳහා සංස්කෘතියක් නිර්මාණය කිරීම | 5.2.1. ළමා ආරක්ෂාව සම්බන්ධයෙ-න් සමාජය තුළ ඇති අහිතකර ආකල්ප | 5.2.1.1මහජන සහභාගීත්වය සක්‍රීය කිරීම සඳහා බහු පාර්ශ්වකරුවන්-ගේ සමස්ත සමාජයේ සංවාදයක්. සමාජ | ප්‍රචාරණ ව්‍යාපාරය සාර්ථකව සිදු කරන ලදී | මහජන ප්‍රතිපෝෂණය<br><br>ප්‍රගති වාර්තා | 1 පාර්ශ්වකරුවන් සිතියම්ගත කිරීම<br>2.පාර්ශවකරුවන්-ගේ සංවාදය<br>3.ළමා ආරක්ෂාව පිළිබඳ සමාජ ආකල්පය සඳහා දර්ශකයක් | | | 2025 - 2029 | ජා.ළ.ආ. අ.<br><br>ප.සෞ. කා.<br><br>අ.උ.අ.වa .අ.අමා. | 0.500 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | අලෙවිකරණය ඉලක්ක කරගත් පුළුල් ප්‍රචාරක ප්‍රවේශයක් - සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම | | | වර්ධනය කිරීම | | | | ප.ළ.ර. සේ.දෙ.<br><br>සෞ.ජ. මා.අමා. . | | |
| | | 5.3 මුල් ළමාවිය සංවර්ධනය සැකසුම් හරහා මුල් ළමාවිය සංවර්ධනය ශක්තිමත් කිරීම මඟින් ළමා ආරක්ෂාව සහතික කිරීම | 5.3.1. ප්‍රශස්ත මුල් ළමාවිය සංවර්ධනය සඳහා පෙර පාසල් ගුරුවරුන් පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් නොමැති වීම | 5.3.1.1. ප්‍රශස්ත මුල් ළමාවිය සංවර්ධනය සඳහා පෝෂණ සත්කාර මැදිහත්වීම් සැපයීම සඳහා පෙර පාසල් ගුරු පුහුණුව | පවත්වන ලද පුහුණු වැඩසටහන් සංඛ්‍යාව ප්‍රතිලාභී ගුරුවරුන් සංඛ්‍යාව | පුහුණු අත්පොත<br><br>පුහුණු වාර්තා | 1. පූර්ව ප්‍රසව අවධියේදී මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ පන්තිය ශක්තිමත් කිරීම<br>2. පවුල් සෞඛ්‍ය සේවා නිලධාරී නිවාස චාරිකා/ පෙරපාසල් චාරිකා හරහා මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ දැනුවත් කිරීම<br>3. මුල් ළමාවිය සංවර්ධන නිලධාරීන් විසින් පෙර පාසල් ගුරුවරුන් පුහුණු කිරීම<br>4. තොරතුරු , අධ්‍යාපන හා සන්නිවේදන මෙවලම් සංවර්ධනය<br>5. දැනුම අලුත් කිරීම සඳහා පුහුණු | | | 2025 - 2029 | ප.සෞ. කා.<br><br>මු.ළ.ස.පි .ජා.ලේ. කා. | 1.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | 6. පසු විපරම් සහ ඇගයීම | | | | | | |
| | | 5.4 පාසල් උපදේශන සේවාව ශක්තිමත් කිරීම මඟින් ළමයින්ගේ මනෝ සමාජීය යහපැවැත්ම සහතික කිරීම. | 5.4.1. පාසලේ මනෝ සමාජීය යහපැවැත්ම කළමනාකරණය කිරීම සඳහා කාර්ය මණ්ඩලය තුළ ප්‍රමාණවත් කුසලතා නොමැති වීම | 5.4.1.1. අපයෝජනයට ලක් වූ ළමයෙකු හඳුනාගැනීම සහ කළමනාකරණය ඇතුළුව ළමයින්ගේ මනෝ සමාජීය යහපැවැත්ම පිළිබඳ පාසල් ගුරුවරුන්ගේ සහ උපදේශකයින්ගේ ධාරිතාව ගොඩනැඟීම | පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව<br><br>පුහුණුව ලැබූ ගුරුවරුන් සංඛ්‍යාව | පුහුණු අත්පොත්<br><br>පුහුණු වාර්තා<br><br>පැමිණීමේ වාර්තා | 1. පුහුණු මොඩියුල සංවර්ධනය කිරීම<br>2. පුහුණු මෙවලම් සංවර්ධනය<br>3.පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් පැවැත්වීම<br>4. පුහුණු වැඩසටහන් පැවැත්වීම | | | 2025 - 2029 | ප.සෞ. කා.<br><br>අ.උ.අ.වෘ .අ.අමා. | 5.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | | | | 5.4.1.2. උපදේශනයේ මූලික ආචාර ධර්ම සහතික කරමින් ළමා හිතකාමී ආකාරයෙන් උපදේශනය සැපයීම පිළිබඳ දැනුම අලුත් කිරීමේ පුහුණුව. | පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව<br><br>පුහුණුව ලැබූ ගුරුවරුන් සංඛ්‍යාව | පුහුණු අත්පොත්<br><br>පුහුණු වාර්තා<br><br>පැමිණීමේ වාර්තා | 1. පුහුණු මොඩියුල සංවර්ධනය කිරීම<br>2. පුහුණු ද්‍රව්‍ය සංවර්ධනය<br>3. පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් පැවැත්වීම<br>4. පුහුණු වැඩසටහන පැවැත්වීම | | | 2025 - 2029 | කා.ළ.ක. අමා.<br><br>ප.සෞ. කා. | 5.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| 6. සාක්ෂි ජනනය කිරීම | | 6.1 ළමා ආරක්ෂණය තුළ සෞඛ්‍ය සේවා වැඩිදියුණු කිරීම සඳහා හඳුනාගත් දැනුම් හිඩැස් | 6.1.1. සේවා සංවර්ධනයට සහාය වීම සඳහා ප්‍රමාණවත් නොවන | 6.1.1.1. නව සාක්ෂි අවශ්‍යවන දැනුම් ලුහුඬුතා හඳුනාගැනීම<br><br>6.1.1.2. | ලුහුඬුතා විශ්ලේෂණය අවසන්කර ඇත<br><br>පර්යේෂණ | ලුහුඬුතා විශ්ලේෂණ වාර්තා සමාලෝචනය කිරීම | 1. පර්යේෂණ න්‍යාය පත්‍රය හඳුනා ගැනීම පිළිබඳ විශේෂඥ කමිටුව<br>2. විද්වත් | | | 2025 - 2029 | ප.සෞ. කා. ,<br><br>ජා.ළ.ආ. අ. , | 10.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | පිළිබඳ පර්යේෂණ පැවැත්වීම | පර්යේෂණ | පර්යේෂණ / අධ්‍යයනය පැවැත්වීම<br><br>6.1.1.3. පර්යේෂණ සොයාගැනීම් මධ්‍යකාලීනව බෙදා හැරීම (උදා. සම්මන්ත්‍රණය) | අවසන්<br><br>සම්මන්ත්‍ර-ණය පවත්-වන ලදී | පර්යේෂණ සහ අධ්‍යයනය වාර්තා<br><br>සම්මන්ත්‍රණ වාර්තාව | කමිටුවේ වාර්තාව<br>3. පර්යේෂණ සඳහා අරමුදල් හඳුනා ගැනීම<br>4. හඳුනාගත් පර්යේෂණ ලුහුඬුතා සපුරාලීම සඳහා පර්යේෂණ යෝජනා කැඳවීම<br>5. ළමා ආරක්ෂාව සහ රැකවරණය ඉලක්ක කරගත් අධ්‍යයන පිළිබඳව පශ්චාත් උපාධි සිසුන් වෙනුවෙන් පෙනී සිටීම<br>6. ඉදිරිපත් කළ යෝජනා විශ්ලේෂණය කිරීම<br>7. අරමුදල් ලබා ගැනීමේ හැකියාව මත අධ්‍යයන සඳහා නිෂ්කාශනය<br>8. පර්යේෂණ සොයාගැනීම් මධ්‍යකාලීනව බෙදා හැරීම<br>9. පර්යේෂණ අධ්‍යයන සහ ප්‍රකාශන සම්පාදනය කිරීම | | | | අ.උ.අ.වෘ .අ.අමා.<br><br>විශ්ව විද්‍යාල<br><br>ප.වෛ. උ.ආ. | | |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 7. ඇග-යුම් ක්‍රම-වේද-ය | | 7.1 ළමා ආරක්ෂාව පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රමානුකූලව ඇගයීම | | 7.1.1.1. කාර්තුමය ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම<br><br>7.1.1.2. වාර්ෂික ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම | නිරන්තර ප්‍රගති සමාලෝච-න රැස්වීම් පවත්වන ලදී<br><br>ක්ෂේත්‍ර විශේෂිත නිර්දේශ ඉදිරිපත් කර ඇත | සමාලෝචන වාර්තා | 1.සමාලෝචන රැස්වීම් පැවැත්වීම<br>2. ක්ෂේත්‍රවාර්තා විශ්ලේෂණය<br>3. වැඩිදියුණු කිරීම්/ ඉදිරි මාර්ග සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම | | | 2025 - 2029 | සෞ.ජ. මා.අමා.<br><br>ජා.ළ.ආ. අ. | 10.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

# 07. කම්කරු සහ රැකියා ක්ෂේත්‍රය

**ක්ෂේත්‍රය පිළිබඳ අර්ථ දැක්වීම:**

'කාර්මික සාමය සහ සමගිය, සමාජ සුරක්ෂිතතාවය, කම්කරු අයිතිවාසිකම් හා ඵලදායිතාව ප්‍රවර්ධනය කිරීම තුළින් සමාජ ආර්ථික සංවර්ධනයට දායක වීම' යන මෙහෙවර සමගින් කම්කරු අමාත්‍යාංශය කම්කරු අංශයට නායකත්වය ලබාදේ. ත්‍රෛපාර්ශවික සබඳතා, ජාත්‍යන්තර කම්කරු සබඳතා සහ අධ්‍යාපනය, පුහුණුව, පර්යේෂණ සහ සංවර්ධනයට සම්බන්ධ වීම තුළින් සමාජ ආරක්ෂණය, කම්කරු අයිතිවාසිකම් සහ කාර්මික සාමය හා සමගිය පවත්වා ගැනීම එහි ප්‍රධාන විෂය ක්ෂේත්‍ර වේ. ළමා ශ්‍රමය තුරන් කිරීම කම්කරු දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛතා අතර ඇත.

**ළමා ආරක්ෂාව සඳහා අදාළත්වය:**

1956 අංක 47 දරණ ස්ත්‍රීන්, තරුණ අය හා ළමයින් සේවයේ යෙදවීමේ (සංශෝධිත) පනත ශ්‍රී ලංකාවේ ළමා ශ්‍රමය සම්බන්ධ ප්‍රධාන පනතයි.දණ්ඩ නීති සංග්‍රහයේ 1995, 1998 සහ 2006 සංශෝධනයන්හි ඇතුළත් විධිවිධාන. ජාත්‍යන්තර තලයේදී, කම්කරු ශ්‍රමයේ ළමා ශ්‍රමය සම්බන්ධ නීතිවලට සහ ඒ ඒ අංශ නියාමනය කරනු ලබන රටේ අනෙකුත් නීති සම්පාදනයට දායක වී ඇති පහත සඳහන් සම්මුති සහ වෛකල්පිත සන්ධානවලට ශ්‍රී ලංකාව අත්සන් කර ඇත.

1) ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ අංක 138 දරන අවම වයස් සම්මුතිය

2) ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ අංක 182 දරන අතිශයින් අනර්ථකාරී ළමා ශ්‍රමය පිළිබඳ සම්මුතිය

3) ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ **අංක** 29 දරන බලහත්කාර ශ්‍රමය පිළිබඳ සම්මුතිය

4) බලහත්කාර ශ්‍රමය පිළිබඳ සම්මුතියේ 2014 වෛකල්පිත සන්ධානය

5) ළමා අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය

6) ළමා අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතියට සන්නද්ධ ගැටුම් හා සම්බන්ධ I වන වෛකල්පිත සන්ධානය

7) ළමා අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතියේ ළමුන් විකිණීම, ළමා ගණිකා වෘත්තිය සහ ළමා කාමුක දර්ශන හා සම්බන්ධ II වන වෛකල්පිත සන්ධානය

8) දේශාන්තර සංවිධානාත්මක අපරාධවලට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතිය

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය සහ ඒ තුළ ඇති විශේෂිත ආයතන කීපයක්වන නීතිපති දෙපාර්තමේන්තුව, නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව, සමථ මණ්ඩල කොමිෂන් සභාව, ශ්‍රී ලංකා විනිශ්වයකාරවරයන්ගේ ආයතනය, අපරාධයක වින්දිතයින් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ ජාතික අධිකාරිය, බන්ධනාගාර දෙපාර්තමේන්තුව, පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාලය, සහ නීති ආධාර කොමිෂන් සභාව ළමුන් සඳහා යුක්තිය පසිඳලීමේ දී ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරයි. අධිකරණ සේවා කොමිෂන් සභාව යනු බාලවයස්කාරයින් සම්බන්ධයෙන් යුක්තිය පසිඳලීමේදී අධිකරණ කටයුතු කරන ආකාරය කෙරෙහි ඍජු බලපෑමක් ඇති කළ හැකි තවත් ආයතනයකි. අමාත්‍යාංශයට සහ අධිකරණ සේවා කොමිෂන් සභාවට පරිබාහිරව ළමයින් සම්බන්ධයෙන් නිසි ලෙස යුක්තිය පසිඳලිමට අධිකරණ ක්ෂේත්‍රය හැකි බව සහතික කිරීමට කටයුතු කරන තවත් බොහෝ ආයතන ඇත. ශ්‍රී ලංකා පොලීසිය, ජාතික ළමා ආරක්ෂක අධිකාරිය, පරිවාස සහ ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව සහ සෞඛ්‍ය සේවා එසේ ඵලදායි ලෙස යුක්තිය පසිඳලිමේ දී අධිකරණ ක්ෂේත්‍රය සිය විශ්වාසය රඳවන එවැනි ප්‍රධාන සේවා සපයන ආයතන කිහිපයකි

| උපාය මාර්ගය | | උපාය මාර්ගික අරමුණු | ගැටලුව | ප්‍රධාන ක්‍රියාකාරකම් / මැදිහත්වීම් | ප්‍රධාන කාර්ය සාධක දර්ශකය | සත්‍යාපනය කිරීමේ ක්‍රම | උප ක්‍රියාකාරකම් | වසර 1 | වසර 1-3 | වසර 1-5 | ප්‍රධාන වගකිව යුතු ආයතන | ඇස්ත-මේන්තු-ගත අයවැය (රු. මිලියන) | අරමුදල් මූලාශ්‍රය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1. නීති ක්‍රියා-ත්මක කිරීම සහ බලා-ත්මක කිරීම | 1.1 ප්‍රතිප-ත්ති | 1.1.1. අධිකරණ පරිපාලනයේ සියලුම අදියරයන් ආවරණය වන පරිදි ළමා අයිතිවාසිකම් සම්මුතියෙහි මූලධර්ම මත පදනම් වූ ප්‍රතිපත්තියක් සකස් කිරීම මගින් ළමා හිතකාමී අධිකරණ පද්ධතියක් සහතික කිරීම | 1.1.1.1. අධිකරණ පද්ධතිය තුළ ළමා හිතකාමී ප්‍රතිපත්ති නොමැත | 1.1.1.1.1. අධිකරණ පද්ධතියට ප්‍රවේශ වන සියලුම ළමයින්ට අදාළවන ළමා හිතකාමී ක්‍රියා පටිපාටි හඳුන්වාදීම සඳහා ප්‍රතිපත්තියක් සකස් කිරීම | ප්‍රතිපත්ති ලේඛනය සකස් කර ඇත. | අමාත්‍ය මණ්ඩල අනුමත ප්‍රතිපත්තියක් පවතී | 1. කමිටුවක් පත් කිරීම<br>2. සාහිත්‍ය විචාරය<br>3. සංකල්ප පත්‍රය<br>4.පාර්ශවකරුවන්ගේ සාකච්ඡාව<br>5.පාර්ශවකරුවන්ගේ එකඟතාව<br>6. ප්‍රතිපත්තිය කෙටුම්පත් කිරීම<br>7. අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කිරීම<br>8. ප්‍රතිපත්ති එළි දැක්වීම | | 2025 – 2027 | | අ.සේ. කො.ස. ලේ.කා.<br>අධි.ජා.ඒ. අමා.<br>.<br>කා.ළ.ක. අමා<br>නී.දෙ.<br>ජා.ළ.ආ. අ. | 0.400 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | | | | 1.1.1.1.2. ළමා අපයෝජන සිද්ධීන් සහ ළමා වැරදිකරුවන් සම්බන්ධයෙන් දඬුවම් නියම කිරීම පිළිබඳ ප්‍රතිපත්තියක් සකස් කිරීම | ප්‍රතිපත්ති ලේඛනය සකස් කර ඇත. | අමාත්‍ය මණ්ඩල අනුමත ප්‍රතිපත්තියක් පවතී | 1. කමිටුවක් පත් කිරීම<br>2. සාහිත්‍ය විචාරය<br>3. සංකල්ප පත්‍රය<br>4. පාර්ශවකරුවන්ගේ සාකච්ඡාව<br>5. පාර්ශවකරුවන්ගේ එකඟතාව<br>6. ප්‍රතිපත්තිය කෙටුම්පත් කිරීම | | 2025 - 2027 | | අ.සේ. කො.ස. ලේ.කා.<br>අධි.ජා.ඒ. අමා.<br>කා.ළ.ක | 0.400 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | 7. අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කිරීම<br>8. ප්‍රතිපත්ති එළි දැක්වීම | | | | අමා.<br>නී.දෙ.<br>ජා.ළ.ආ.අ. | | |
| | | | | 1.1.1.1.3. අධිකරණ අංශයේ විෂය පථය යටතේ "පරිවාසය" පුද්ගලයින් නිවැරදි කිරීමේ ක්‍රමයක් ලෙස සමාලෝචනය කිරීම | ප්‍රතිපත්ති ලේඛනය සකස් කර ඇත. | අමාත්‍ය මණ්ඩල අනුමත ප්‍රතිපත්තියක් පවතී | 1. කමිටුවක් පත් කිරීම<br>2. සාහිත්‍ය විචාරය<br>3. සංකල්ප පත්‍රය<br>4. පාර්ශවකරුවන්ගේ සාකච්ඡාව<br>5.පාර්ශවකරුවන්ගේ එකඟතාව<br>6. ප්‍රතිපත්තිය කෙටුම්පත් කිරීම<br>7. අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කිරීම<br>8. ප්‍රතිපත්ති එළි දැක්වීම | 2025 | | | ශ්‍රී.ල.නී. කො.ස.<br>අධි.ජා.ඒ. අමා.<br>කා.ළ.ක. අමා<br>නී.දෙ<br>ජා.ළ.ආ.අ.<br>ප.ළ.ර. සේ.දෙ. | 0.400 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | 1.2 නීති | 1.2.1 ළමුන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජයේහි ගිවිසුම් බැඳීම් ඉටු කිරීම සඳහා අදාළ නීතිමය ප්‍රතිපාදන සහතික කිරීම | 1.2.1.1. යල් පැන ගිය විධිවිධාන හේතුවෙන් නීති සම්පාදනයේ හිඩැස්, ජාත්‍යන්තර ගිවිසුම් බැඳීම්වලට අනුකූල නොවීම සහ ළමයින්ට නීතියේ බලපෑම පිළිබඳ නවතම පර්යේෂණ | 1.2.1.1.1. ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රමිතීන් පවත්වා ගැනීම සඳහා අවලංගු කළ යුතු, සංශෝධනය කළ යුතු හෝ හඳුන්වා දිය යුතු නිශ්චිත නීතිමය ප්‍රතිපාදන හඳුනාගැනීම සඳහා ගිවිසුම් ආයතනවලට ශ්‍රී ලංකාවේ ඇති කැපවීමට එරෙහිව ළමුන් සම්බන්ධ නීති පිළිබඳ හිඩැස් විශ්ලේෂණයක් | සමාලෝච-න වාර්තාව | නිර්දේශ සහිත සමාලෝචන වාර්තාව පවතී . | 1. කමිටුවක් පත් කිරීම.<br>2. සමාලෝචනය සිදු කිරීම.<br>3. සමාලෝචන වාර්තාව සකස් කිරීම<br>4. වාර්තාව එළි දැක්වීම.<br>5. නිර්දේශ ක්‍රියාත්මක කිරීම | | 2025 - 2027 | | ජා.ළ.ආ.අ.<br>කා.ළ.ක. අමා<br>අධි.ජා.ඒ. අමා.<br>නී.දෙ.<br>ප.ළ.ර. සේ.දෙ. | 0.100 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | වාර්තාව. | සිදු කිරීම. | | | | | | | | | |
| | | | | 1.2.1.1.2.<br>ළමා වැරදිකරුවන් දණ්ඩන ක්‍රමයෙන් හරවා යැවීමේ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම සඳහා නීතිමය ප්‍රතිපාදනයක් හඳුන්වාදීම. | සමාලෝච-න වාර්තාව<br><br>නීතිමය විධිවිධාන සකස් කර ඇත | නිර්දේශ සහිත වාර්තාව සමාලෝචනය කිරීම | 1. කමිටුවක් පත් කිරීම.<br>2. සමාලෝචනය කිරීම.<br>3. සමාලෝචන වාර්තාව සකස් කිරීම<br>4. අමාත්‍ය මණ්ඩල අනුමැතිය<br>5. නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කිරීම.<br>6. ගැසට් කිරීම සහ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම | | 2025<br>-<br>2027 | | අධි.ජා.ඒ. අමා. | 0.100 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | | | | 1.2.1.1.3. පිරිමි ළමා ලිංගික අපයෝජන වැරදි සම්බන්ධයෙන් ඇති නීතිමය ප්‍රතිපාදනවල හිඩැස් සමාලෝචනය කිරීම සහ ආමන්ත්‍රණය කිරීම | සමාලෝච-න වාර්තා වේදී හිඩැස් ආමන්ත්‍ර-ණය කිරීම සඳහා නීති ප්‍රතිසංස්ක-රණ පිළිබ-ඳව අධිකර-ණ අමා-ත්‍යාංශය වෙත කරන ලද නිර්-දේශ | හඳුනාගත් නිර්දේශ සහිත සමාලෝචනය කරන ලද වාර්තාව | 1. කමිටුවක් පත් කිරීම.<br>2. සමාලෝචනය කිරීම.<br>3. සමාලෝචන වාර්තාව සකස් කිරීම<br>4. අමාත්‍ය මණ්ඩල අනුමැතිය<br>5. නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කිරීම.<br>6. ගැසට් කිරීම සහ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම | 2025 | | | අධි.ජා.ඒ. අමා. | 0.300 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | | | . | 1.2.1.1.4. අධිකරණ ක්‍රියාවලියට සම්බන්ධ ළමුන්ගේ රැකවරණය පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ සම්මත කර ගැනීමට ඉදිරිපත් | පාර්ලිමේ-න්තුව විසින් සම්මත කරන ලද පනත් කෙටුම්පත | පනත් කෙටුම්පත පිළිබඳ පාර්ලිමේන්තු වාර්තා | 1. කමිටුවක් පත් කිරීම.<br>2. සමාලෝචනය කිරීම.<br>3. සමාලෝචන වාර්තාව සකස් කිරීම<br>4. අමාත්‍ය මණ්ඩල අනුමැතිය<br>5. නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කිරීම.<br>6. ගැසට් කිරීම සහ | | 2025<br>-<br>2027 | | අධි.ජා.ඒ. අමා.<br><br>ජා.ළ.ආ. අ.<br><br>ප.ළ.ර. සේ.දෙ. | 0.200 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | කර නීතිගත කිරීමට කටයුතු කිරීම. | | | පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම | | | | | | |
| | | 1.2.2 ළමා අපයෝජන නඩු වල සාක්ෂිකරුවන් වන ළමයින්ගේ ආරක්ෂාව සහතික කිරීම | 1.2.2.1. අධිකරණ-යේදී ළමා අපයෝජන සිදුවීම් පිළිබඳ සාක්ෂි ලබාදීමේදී ළමා සාක්ෂිකරුව-න්ට ප්‍රමාණවත් ආරක්ෂාවක් නොලැබීම. | 1.2.2.1.1. 1999 අංක 32 සාක්ෂි විශේෂ විධිවිධාන පනත සංශෝධනය කරමින් ද.නි.ස 345 ලිංගික හිරිහැරය වරද ඇතුළත් කිරීමේ යෝග්‍යතාව විමසීම. | සමාලෝච-න වාර්තාව | සාක්ෂි ආඥා පනත සංශෝධනය | 1. කමිටුවක් පත් කිරීම.<br>2. සමාලෝචනය කිරීම.<br>3. සමාලෝචන වාර්තාව සකස් කිරීම<br>4. අමාත්‍ය මණ්ඩල අනුමැතිය<br>5. නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කිරීම.<br>6. ගැසට් කිරීම සහ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම | | 2025 - 2027 | | ශ්‍රී. ල.පො.<br><br>අ.සා.වි. ආ.කි.ජා. අ. | 0.100 | |
| | 1.3 රෙගු-ලාසි | 1.3.1. රෙගුලාසි නිකුත් කිරීම මඟින් අධිකරණ පද්ධතිය තුළ සිටින ළමුන්ගේ ආරක්ෂාව සහතික කිරීම | 1.3.1.1. නීති ක්ෂේත්‍රයේ රෙගුලාසි ප්‍රමාණවත් නොවන බව | 1.3.1.1.1. ළමා සාක්ෂිකරු සම්බන්ධයෙන් රෙගුලාසි හඳුනාගෙන සකස් කිරීම | රෙගුලාසි සකස් කර ඇත | ළමුන් සාක්ෂි ලබා දීමේ ක්‍රියාවලිය විධිමත් කිරීම සඳහා රෙගුලාසි පැවතීම | 1.කමිටුවක් පත් කිරීම.<br>2. සමාලෝචනය කිරීම.<br>3. සමාලෝචන වාර්තාව සකස් කිරීම<br>4. අමාත්‍ය මණ්ඩල අනුමැතිය<br>5. නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කිරීම.<br>6. ගැසට් කිරීම සහ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම | 2025 | | | අධි.ජා.ඒ. අමා.<br><br>නී.දෙ<br><br>ජා.ළ.ආ. අ. | 0.100 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | | | | 1.3.1.1.2. ජාතික ළමා ආරක්ෂක අධිකාරිය නීති ප්‍රතිසංස්කරණ කමිටුව විසින් කෙටුම්පත් කරන ලද මාර්ගෝපදේශ මත පදනම්ව | රෙගුලාසි සකස් කර ඇත | රෙගුලාසි පවතී | 1.කමිටුවක් පත් කිරීම.<br>2. සමාලෝචනය කිරීම.<br>3. සමාලෝචන වාර්තාව සකස් කිරීම<br>4. අමාත්‍ය මණ්ඩල අනුමැතිය<br>5. නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කිරීම. | 2025 | | | අ.උ.අ.වෘ.අ.අමා.<br><br>අධි.ජා.ඒ. අමා.<br><br>ජා.ළ.ආ. අ. | 0.300 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | අධිකරණය වෙත සහ ආපසු ළමුන් ප්‍රවාහනය කිරීම සම්බන්ධ රෙගුලාසි සකස් කිරීම. | | | 6. ගැසට් කිරීම සහ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම | | | | ප.ළ.ර. සේ.දෙ. | | |
| | | | | 1.3.1.1.3. ජාතික ළමා ආරක්ෂක අධිකාරිය නීති ප්‍රතිසංස්කරණ කමිටුව විසින් කෙටුම්පත් කරන ලද මාර්ගෝපදේශ මත පදනම්ව අධිකරණ පරිශ්‍රය තුළ ළමා වරදකරුවන්ට සහ සාක්ෂිකරුවන්ට විශේෂ ආරක්ෂණ පියවර, ළමා හිතකාමී පහසුකම් සම්බන්ධ රෙගුලාසි සකස් කිරීම. | රෙගුලාසි සකස් කර ඇත | රෙගුලාසි පවතී | 1.කමිටුවක් පත් කිරීම.<br>2. සමාලෝචනය කිරීම.<br>3. සමාලෝචන වාර්තාව සකස් කිරීම<br>4. අමාත්‍ය මණ්ඩල අනුමැතිය<br>5. නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කිරීම.<br>6. ගැසට් කිරීම සහ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම | 2025 | | | අධි.ජා.ඒ. අමා.<br>ජා.ළ.ආ. අ.<br>ප.ළ.ර. සේ.දෙ. | 0.300 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | | | | 1.3.1.1.4. මව්වරුන් සමඟ බන්ධනාගාර පද්ධතියට ඇතුළු වන ළමයින් සම්බන්ධයෙන් රෙගුලාසි සකස් කිරීම | රෙගුලාසි සකස් කර ඇත | රෙගුලාසි පවතී | 1.කමිටුවක් පත් කිරීම.<br>2. සමාලෝචනය කිරීම.<br>3. සමාලෝචන වාර්තාව සකස් කිරීම<br>4. අමාත්‍ය මණ්ඩල අනුමැතිය<br>5. නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කිරීම.<br>6. ගැසට් කිරීම සහ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම | 2025 | | | අධි.ජා.ඒ. අමා.<br>බ.දෙ | 0.300 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | 1.3.2. වීඩියෝ සාක්ෂි සඳහා පටිගත කිරීමේ පැහැදිලි මාර්ගෝපදේශ | 1.3.2.1 පැහැදිලි ප්‍රමිතිගත ප්‍රොටෝ-කෝලයක් නොමැතිකම | 1.3.2.1.1.වීඩියෝ සාක්ෂි පිළිබඳ මාර්ගෝපදේශ සකස් කිරීම | මාර්ගෝප-දේශ සකස් කර ඇත | වීඩියෝ සාක්ෂි සඳහා අනුමත මාර්ගෝපදේ-ශ පැවතීම | 1. උපදේශන පැවැත්වීම<br>2. රෙගුලාසි / චක්‍රලේඛය සකස් කිරීම<br>3. රෙගුලාසි වලට අදාළ අනුමැතිය ලබා ගැනීම | 2025 | | | ජා.ළ.ආ.අ.<br>අධි.ජා.ඒ. අමා. | 0.100 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | | 1.3.3 සෑම විටම ළමයාගේ උපරිම යහපත සලකා බලා ළමයින්සම්බන්ධ-යෙන් තීරණ ගත යුතුය | 1.3.1.1 තීරණ ගැනීමේ බොහෝ අවස්ථාවලදී ළමයාගේ යහපත සැලකිල්ලට නොගනී | 1.3.1.1.1 ළමුන් සම්බන්ධයෙන් පරිපාලන, ව්‍යවස්ථාදායක සහ අධිකරණ තීන්දු වලදී ළමයාගේ උපරිමයහපත තීරණය කිරීම සඳහා පොදු රාමුවක් සකස් කිරීම | පොදු රාමුව සංවර්ධනය කර ඇත | පොදු රාමුව භාවිතා කර ඇති අවස්ථා පිළිබඳ වාර්තා | 1.කමිටුවක් පත් කිරීම<br>2.උපදේශන පැවැත්වීම<br>3.පොදු රාමුවක් සංවර්ධනය කිරීම<br>4. ක්ෂේත්‍ර හරහා නියමු වැඩසටහනක් කිරීම<br>5. පොදු රාමුව සම්මත කරගැනීම | | 2025 - 2027 | | අධි.ජා.ඒ. අමා. | 0.100 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| 2. සම්ම-තයන් සහ අගයන් | | 2.1 අධිකරණ ක්ෂේත්‍රයේ වෘත්තිකයන් සහ කාර්ය මණ්ඩලය ළමයින් සමඟ කටයුතු කළ යුතු ආකාරය පිළිබඳ ළමා හිතකාමී ආචාර ධර්ම පද්ධතියක් හඳුන්වා දීම | 2.1.1 අධිකරණ කටයුතු වලදී ඇති වන්නා වූ ළමා ආරක්ෂණ ගැටළු | 2.1.1. 1අධිකරණ ක්ෂේත්‍රයට අදාළ වෘත්තිකයන් සහ කාර්ය මණ්ඩලය සඳහා ළමා ආරක්ෂාව පිළිබඳ ආචාර ධර්ම පද්ධතියක් හඳුන්වාදීම | අධිකරණ අංශයට අදාළ වෘත්තිකය-න් සහ කාර්ය මණ්ඩලය සඳහා ළමා ආරක්ෂාව සඳහා ආචාර ධර්ම සංග්‍රහය | අධිකරණ ක්ෂේත්‍රයට අදාළ වෘත්තිකයන් සහ කාර්ය මණ්ඩලය සඳහා ළමා ආරක්ෂාව පිළිබඳ අනුමත ආචාර ධර්ම සංග්‍රහය පවතී | 1. කමිටුවක් පත් කිරීම<br>2. සාහිත්‍ය විචාරය<br>3. සංකල්ප පත්‍රිකා සකස් කිරීම<br>4. පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා කිරීම<br>5. පාර්ශ්වයන්ගේ එකඟතාව<br>6. ආචාර ධර්ම කෙටුම්පත් කිරීම<br>7. අනුමැතිය ලබා ගැනීම<br>8. ආචාර ධර්ම සංග්‍රහය එළි දැක්වීම | | 2025 - 2027 | | අ.සේ. කො.ස. ලේ.කා.<br>අධි.ජා.ඒ. අමා.<br>නී.දෙ.<br>ජා.ළ.ආ.අ. | 0.500 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| 3. මාපිය සහ රැකව-රණ | | 3.1. අධිකරණයේ සාමාජිකයින්ගේ ළමයින්ගේ උපරිම යහපත තහවුරු කිරීම | 3.1.1. අධිකරණ සාමාජිකයින් කාලය නොමැතිකම | 3.1.1.1. අධිකරණයේ සේවය කරන අයගේ පවුල්වල ළමයින්ගේ | පවුල් ආධාරක පද්ධතිය සංවර්ධනය කර ඇත | අධිකරණයේ සේවය කරන අයගේ පවුල්වල ළමයින්ට | 1. අවශ්‍යතා ඇගයීම<br>2. අවශ්‍ය ප්‍රතිචාර/ ආධාරක හඳුනා ගැනීම<br>3. පවුලේ සහයෝගය සඳහා උපාය මාර්ගයක් | | 2025 - 2027 | | අ.සේ. කො.ස. ලේ.කා. | 5.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| සපය-<br>න්න-<br>න්ගේ<br>සහය | | | -ත් දුර බැහැර ප්‍රදේශවල රැකියාවත් හේතුවෙන් නිවසින් දුරස් වීම ළමුන් කෙරෙහි සීමිත අවධානයක් ඇති කරයි. | යහපැවැත්ම සම්බන්ධ ගැටළු විසඳීම සඳහා පවුල් ආධාරක පද්ධතියක් හඳුන්වාදීම. | ආධාරක පද්ධතියට ප්‍රවේශ වන පවුල් සංඛ්‍යාව | උපකාර කිරීම සඳහා පවුල් ආධාරක පද්ධතියක් පැවතීම | සැකසීමට කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබල ගැනීමේ අමාත්‍යාංශය සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම<br>4. ආධාරක පද්ධතිය ක්‍රියාත්මක කිරීම | | | | කා.ළ.ක.<br>අමා | | |
| | | 3.2 ගිවිසුම් බැඳීමක් ලෙස රජය මගින් නොමිලේ නීතිමය සහාය ලබාදීම සහතික කිරීම | 3.2.1. නීති ආධාර සඳහා ප්‍රමාණවත් ප්‍රවේශයක් නොමැත | 3.2.1.1. රැකවරණය සහ ආරක්ෂාව අවශ්‍ය ළමුන් සහ ළමා වරදකරුවන් සඳහා නීතිමය උපදේශන විධිමත් කිරීම සහ ශක්තිමත් කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම | පද්ධතිය සංවර්ධනය කර ඇත. | රැකවරණය සහ ආරක්ෂාව අවශ්‍ය ළමුන් සහ ළමා වැරදිකරුවන් සඳහා නීතිමය උපදේශන විධිමත් කිරීම සහ ශක්තිමත් කිරීම සඳහා ක්‍රමවේදයක් ක්‍රියාත්මක වේ | 1. අවශ්‍ය ඇගයීම<br>2. පරිචය සහ සාහිත්‍ය සමාලෝචනය<br>3. ක්‍රමවේදය සංවර්ධනය කිරීම<br>4. ක්‍රියාත්මක කිරීම සහ ඇගයීම | | 2025<br>-<br>2027 | | ශ්‍රී.ල.නී.<br>ආ.කො. | 10.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | | | | 3.2.1.2 මනෝවිද්‍යාත්මක සහය තුළින් වැඩිදුර සහය සඳහා අවශ්‍යතා හඳුනාගැනීම සහ ළමා ආරක්ෂණ සේවාවන් සමඟ සම්බන්ධීකරණ ගොඩ නැගීමේ ක්‍රමවේදයක් සංවර්ධනය කිරීම | පද්ධතිය සංවර්ධනය කර ඇත | මනෝවිද්‍යාත්-මක සහය හරහා තවදුරටත් සහාය සඳහා අවශ්‍යතා හඳුනාගැනීමට ක්‍රමවේදයක් ක්‍රියාත්මක වේ. | 1. අධිකරණයෙන් යොමු කිරීම් ලබා ගැනීම<br>2. අධිකරණ සේවා කොමිසම විසින් යොමු කිරීම සඳහා නිර්ණායකයක් සකස් කිරීම<br>3. සමාජ සත්කාර ඒකක වෙත යොමු කිරීම<br>4. ඉහත ක්‍රියාවලිය සඳහා ප්‍රොටෝකෝලයක් සකස් කිරීම | | 2025<br>-<br>2027 | | අ.සේ.<br>කො.ස.<br>ලේ.කො. | 1.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 4. ප්‍රතිචාර සහ සහාය සේවා | | 4.1. අපරාධවලට සම්බන්ධ සැකකරුවන්, වරදකරුවන් වූවන්, අතුරුදන් වූවන් වැනි අයගේ ළමයින්ගේ ආරක්ෂාව පිළිබඳ අවශ්‍යතා සහතික කිරීම | 4.1.1.මෙම කාණ්ඩවල අවදානමට ලක්විය හැකි ළමයින්ගේ ආරක්ෂණ අවශ්‍යතා සඳහා ප්‍රමාණවත් අවධානයක් නොලැබේ | 4.1.1.1.අපරාධ වරදකරුවන්, අතුරුදහන් වූවන්, සැකකරුවන් ආදීන්ගේ ළමයින්ගේ ආරක්ෂාව සඳහා අවශ්‍යතා තක්සේරු කිරීම, හඳුනාගැනීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. | තක්සේරු වාර්තාව<br><br>සංවර්ධිත වැඩසටහන | නිර්දේශ සහිත වාර්තාව සමාලෝචනය කිරීම<br><br>නිර්දේශ මත පදනම්ව වැඩසටහන් සංවර්ධනය කර පවතී | 1. කමිටුවක් පත් කිරීම.<br>2. අවශ්‍යතා තක්සේරුව පැවැත්වීම<br>3. සමාලෝචන වාර්තාව සකස් කිරීම<br>4. නිර්දේශ ක්‍රියාත්මක කිරීම | | | 2025 - 2029 | බ.දෙ,<br><br>අ.සා.වි. ආ.කි.ජා. අ.<br><br>ජා.ළ.ආ. අ.<br><br>ප.ළ.ර. සේ.දෙ. | 1.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | | | | 4.1.1.2. සුරැකි පියස යාන්ත්‍රණයක් සමාලෝචනය කර සංවර්ධනය කිරීම | යාන්ත්‍රණය වර්ධනය කර ඇත | ආරක්ෂිත නිවාස සඳහා අනුමත යාන්ත්‍රණයක් තිබීම | 1.කමිටුවක් පත් කිරීම<br>2. උපදේශන පැවැත්වීම<br>3. යාන්ත්‍රණය සකස් කිරීම<br>4. ක්‍රියා පටිපාටිය සඳහා අදාළ අනුමැතිය ලබා ගැනීම. | | | | ජා.කා.ක.<br><br>ප.ළ.ර. සේ.දෙ.<br><br>අ.සා.වි. ආ.කි.ජා. අ. | 0.500 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | | 4.2 ළමුන් සඳහා යුක්තිය සහතික කිරීම | 4.2.1. නඩු විසඳීමේ ප්‍රමාදය | 4.2.1.1. ළමා අධිචෝදනා කඩිනම් කිරීමේ යාන්ත්‍රණය මත පදනම්ව, ළමුන් සඳහා කඩිනම් වින්දිත සහාය සඳහා යාන්ත්‍රණයක් සකස් කිරීම | යාන්ත්‍රණය සංවර්ධනය කර ඇත | ළමා අධිචෝදනා ක්‍රමානුකූලව කඩිනම් කිරීමේ ක්‍රමවේදයක් පවතී<br><br>නිරීක්ෂණ වාර්තා | 1. මහාධිකරණ නඩු ලයිස්තුවෙහි ළමා සිද්ධීන් හඳුනාගැනීමට යාන්ත්‍රණයක් සකස් කිරීම<br>2. 2. නිශ්චිත දිනයක සියලුම ළමා අපයෝජන නඩු කැඳවීමට කටයුතු කිරීම<br>3. වින්දිත සහය යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීම | 2025 | | | නී.දෙ<br><br>අ.සා.වි. ආ.කි.ජා. අ.<br><br>ශ්‍රී.ල.නී. ආ.කො. | 10.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | | | | 4.2.1.2 සංහිඳියාව පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම සමඟ එක්ව මෙම | සහයෝගීව ක්‍රියාත්මක කිරීම | ප්‍රගති වාර්තා | 1. සංහිඳියාව සහ පුනරුත්ථාපනය පිළිබඳ කමිටුව සමඟ සාකච්ඡා කිරීම | | | 2025 - 2029 | අධි.ජා.ඒ. අමා. | 0.100 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාවට නැංවීම සඳහා සහයෝගයෙන් කටයුතු කිරීම පිණිස අධිකරණ අමාත්‍යාංශය සංහිඳියාව සහ පුනරුත්ථාපනය පිළිබඳ කමිටුව සමඟ සම්බන්ධීකරණය කිරීම | | | 2. සහයෝගීතාවය සඳහා ක්ෂේත්‍ර හඳුනාගැනීම<br>3. සහයෝගීව ක්‍රියාකාරකම් කිරීම | | | | | | |
| | | | | 4.2.1.3. ද.නි.ස. 360C යටතේ නඩු අධිචෝදනා ගොනු කිරීම සඳහා සාක්ෂි ප්‍රමාණවත් නොවන අවස්ථාවලදී තවදුරටත් සාක්ෂි ඉදිරිපත් කරන ලෙස පොලිසියට උපදෙස් ලබාදීම | යාන්ත්‍රණය ස්ථාපිත කර ඇත<br><br>වැඩිදුර සාක්ෂි සඳහා නැවත පොලිසිය වෙත යොමු කරන ලද නඩු සංඛ්‍යාව<br><br>360C හරහා මහාධිකරණ වෙත ගිය නඩු සංඛ්‍යාව | තවත් සාක්ෂි සඳහා ගොනු ආපසු යවා ඇත<br><br>මහාධිකරණ වෙත යන නඩු | 1. පරිචය සහ සාහිත්‍ය සමාලෝචනය<br>2. නියමු ලෙස නඩු හොඳින් පරීක්ෂා කිරීම<br>3. සාක්ෂි හිඩැස් හඳුනා ගැනීම<br>4. අවශ්‍ය සාක්ෂි එකතු කිරීම සඳහා පොලිස් දෙපාර්තමේන්තුව සමඟ සහයෝගීතාවය<br>5. නියමු වැඩසටහන ඇගයීම හා ව්‍යාප්ත කිරීම | | 2025 - 2027 | | නී.දෙ.<br><br>ශ්‍රී. ල.පො. | 0.200 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 4.2.1.4. පළාත් මට්ටමින් ළමුන් සඳහා කැප වූ මහේස්ත්‍රාත් අධිකරණ සහ මහාධිකරණ ස්ථාපිත කිරීම | මහේස්ත්‍රාත් අධිකරණ සහ මහාධිකර-ණ පිහිටුවා ඇත | ප්‍රගති වාර්තා | 1. පරිචය සහ සාහිත්‍ය සමාලෝචනය<br>2. හඳුනාගත් අවශ්‍යතාවය මත සැලසුම් සකස් කිරීම<br>3. මහේස්ත්‍රාත් අධිකරණ සහ මහාධිකරණ පිහිටුවීමට සැලසුම් ක්‍රියාත්මක කිරීම | | | 2025 - 2029 | අධි.ජා.ඒ. අමා. | 2.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| 5. අධ්‍යාපනය සහ ජීවන කුසලතා | | 5.1 කාර්ය මණ්ඩලයේ දැනුම හා කුසලතා වැඩි දියුණු කිරීම මඟින් ළමුන් සඳහා ගුණාත්මක ප්‍රවේශයක් සහතික කිරීම | 5.1.1. ළමා අයිතිවාසිකම් ගැන සංවේදී නොවන පිරිස් | 5.1.1.1. ළමා අයිතිවාසිකම් සම්මුතියේ මූලධර්ම පිළිබඳව සෑම මට්ටමක විනිසුරුවරුන් සංවේදී කිරීම | පුහුණු මොඩියුල සංවර්ධනය කර ඇත<br><br>පවත්වන ලද වැඩසටහ-න් සංඛ්‍යාව<br><br>පුහුණු වූ විනිසුරුවරු සංඛ්‍යාව | සියලුම විනිසුරුවන් දැනුවත් කිරීමේ පද්ධතියක් පවතී ප්‍රගති වාර්තා | 1. බඳවා ගැනීමේදී දැනුම ලබාදීම<br>2. සේවස්ථ පුහුණුවේදී දැනුම ලබාදීම | | 2025 - 2027 | | ශ්‍රී.ල.වි.ආ.<br><br>අ.සේ. කො.ස. ලේ.කා.<br><br>ජා. ළ. ආ. අ. | 5.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | | | | 5.1.1.2. ළමා අයිතිවාසිකම් සම්මුතියේ මූලධර්ම පිළිබඳව අධිකරණ ක්ෂේත්‍රයේ සෑම මට්ටමක සිටින සියලුම නිලධාරීන් දැනුවත් කිරීමට යාන්ත්‍රණයක් සකස් කිරීම | යාන්ත්‍රණය සම්බන්ධ කර ඇත<br><br>පවත්වන ලද වැඩසටහ-න් සංඛ්‍යාව<br><br>පුහුණුව ලැබූ නිලධාරීන් සංඛ්‍යාව | සියලුම නිලධාරීන් දැනුවත් කිරීමේ පද්ධතියක් පවතී ප්‍රගති වාර්තා | 1. බඳවා ගැනීමේදී දැනුම ලබාදීම<br>2. සේවස්ථ පුහුණුවේදී දැනුම ලබාදීම | | 2025 - 2027 | | නී.දෙ,<br><br>ශ්‍රී.ල.වි.ආ<br><br>අ.සේ. කො.ස. ලේ.කා.<br><br>ජා. ළ. ආ. අ. | 10.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 5.1.1.3. නීති අධ්‍යාපන කවුන්සිලයට ළමා ආරක්ෂාව සහ ළමා අයිතිවාසිකම් සම්බන්ධ විෂයක් හඳුන්වාදීම. | වැඩසටහන් මොඩියුලය පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව | වැඩසටහන් මොඩියුල<br><br>ප්‍රතිලාභී පුද්ගලයින් සංඛ්‍යාව<br><br>ප්‍රගති වාර්තා | 1.මොඩියුලය සකස් කිරීම<br>2.විෂයමාලාවට මොඩියුල ඒකාබද්ධ කිරීම<br>3.පුහුණුකරුවන් / සම්පත් දායකයින් පුහුණු කිරීම<br>4. පාඨමාලා ක්‍රියාත්මක කිරීම | | | 2025-2029 | නීති අධ්‍යාපන කවුන්සිලය | 2.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| 6. සාක්ෂි ජනනය කිරීම | | 6.1 ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් සාක්ෂි මත පදනම් වූ තීරණ ගැනීම සහතික කිරීම | 6.1.1. ක්ෂේත්‍රයේ දත්ත නොමැතිකම | 6.1.1.1. සියලුම අධිකරණයන්හි ළමුන් සම්බන්ධ නඩු සම්බන්ධයෙන් සියලුම දත්ත සොයා ගැනීමට යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම. | යාන්ත්‍රණය ස්ථාපිත කර ඇත. සියලුම දත්ත ක්‍රමානුකූලව පද්ධතියට උඩුගත කෙරේ | ක්‍රියාකාරී දත්ත පද්ධතිය | 1. පරිචය සහ සාහිත්‍ය සමාලෝචනය<br>2. පාර්ශවකරුවන්ගේ උපදේශනය<br>3. තොරතුරු කළමණාකරණය පද්ධති ව්‍යුහය සංවර්ධනය කිරීම<br>4.අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම<br>5. තොරතුරු කළමණාකරණය පද්ධති සංවර්ධනය කර එළි දැක්වීම | | 2025 - 2027 | | අ.සේ. කො.ස. ලේ.කා.<br><br>නී.දෙ<br><br>අ.සා.වි. ආ.කි.ජා. අ. | 5.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | | | 6.1.2. ප්‍රමාණවත් පර්යේෂණ සහ අධ්‍යයන | 6.1.2.1. පර්යේෂණ/ අධ්‍යයනය පැවැත්වීම | පර්යේෂණ / අධ්‍යයන වාර්තාව | පර්යේෂණ සහ අධ්‍යයන වාර්තා | 1..පර්යේෂණ / අධ්‍යයනය සඳහා මාතෘකා සහ ක්‍රමවේදය නිර්ණය කිරීම<br>2.පර්යේෂණ / අධ්‍යයනය පැවැත්වීම<br>3. පර්යේෂණ / අධ්‍යයනය එළි දැක්වීම | | 2025 - 2027 | | අධි.ජා.ඒ. අමා. | 0.100 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| 7. ඇගයුම් ක්‍රමවේදය | | ළමා ආරක්ෂාව පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රමානුකූලව ක්‍රියාත්මක කිරීම | | 7.1.1.1. කාර්තුමය ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම<br><br>7.1.1.2. වාර්ෂික ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම | නිරන්තර ප්‍රගති සමාලෝචන රැස්වීම්<br><br>ක්ෂේත්‍ර විශේෂිත නිර්දේශ | සමාලෝචන වාර්තා | 1.සමාලෝචන රැස්වීම් පැවැත්වීම<br>2. ක්ෂේත්‍ර වාර්තා විශ්ලේෂණය<br>3. වැඩිදියුණු කිරීම්/ ඉදිරි මාර්ග සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම | | | 2025 - 2029 | අධි.ජා.ඒ. අමා.<br><br>ජා.ළ.ආ. අ. | 0.100 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

# 10. සංචරණ සහ සංචාරක ක්ෂේත්‍රය

**ක්ෂේත්‍රය පිළිබඳ අර්ථ දැක්වීම:**

සංචාරක ව්‍යාපාරය බහුවිධ හා ගතික කර්මාන්තයකි. 2005 අංක 38 දරන සංචාරක පනත මඟින් ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරයට අදාළ ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලිය පාලනය කරනු ලැබේ. ආදායම් උත්පාදන මූලාශ්‍ර, රැකියා සහ විදේශ විනිමය ඉපැයීම් සඳහා අවස්ථා වැඩි දියුණු කරන ආර්ථික උත්තේජකයක් ලෙස ක්‍රියාත්මකවන බැවින් රටේ විවිධ කොටස් සංචාරක ක්ෂේත්‍රය සමඟ අන්තර් සබඳතා ඇත. ශ්‍රී ලංකා ආර්ථිකයේ ව්‍යාප්තියට සහ සංවර්ධනයට දායකත්වයක් ලබා ගැනීම සඳහා සංචාරක ක්ෂේත්‍රය විසින් එම ක්ෂේත්‍ර වැඩිදියුණු කිරීමට ක්‍රියා කරයි. සත්කාරක කර්මාන්තය ඇතුළුව ප්‍රමාණවත්, ආකර්ශනීය සහ කාර්යක්ෂම සංචාරක සේවාවන් තිරසර ලෙස සංවර්ධනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම, සංචාරක කර්මාන්තය සහ අනෙකුත් ආශ්‍රිත කර්මාන්ත සම්බන්ධයෙන් දේශීය හා ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිතීන් සංවර්ධනය කිරීම, බලාත්මක කිරීම සහ පවත්වාගෙන යාම සඳහා සංචාරක ව්‍යවසාය වෙත බලපත්‍ර ලබාදීම සහ ප්‍රතීතනය කිරීම සහ පුද්ගලික අංශයේ පුද්ගලයින් හෝ ආයතන සංචාරක කර්මාන්තයේ ප්‍රවර්ධනයට සහ එම කර්මාන්තය හා සම්බන්ධ ප්‍රවර්ධන සහ පුහුණු ක්‍රියාකාරකම් වලට සහභාගී වීමට දිරිමත් කිරීම ඒ අතර වේ. මීට අමතරව, මෙම අංශය මඟින් මානව සම්පත් පුහුණු හා සංවර්ධන ක්‍රියාකාරකම් සිදු කරමින් ශ්‍රී ලංකාව දේශීය වශයෙන් මෙන්ම විදේශයන්හිද සංචාරක ගමනාන්තයක් ලෙස සංවර්ධනය කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ අලෙවිකරණය සිදු කරයි.

**ළමා ආරක්ෂාව සඳහා අදාළත්වය:**

ළමා ලිංගික සංචාරක ව්‍යාපාරය සඳහා ප්‍රසිද්ධ ස්ථාන සොයා සංචාරකයින් ශ්‍රී ලංකාවට ඇදී එන අවස්ථා ඇති බව පර්යේෂණ සහ ප්‍රායෝගික සාක්ෂි මඟින් පෙන්වා දෙයි. මෙම සංසිද්ධිය දිවයිනේ ඕනෑම ස්ථානයක සිදුවිය හැකි වුවද, බස්නාහිර, දකුණ සහ උතුරු-මැද පළාත්වල මෙන්ම ශ්‍රී ලංකාවේ වෙරළබඩ තීරයේද මෙවැනි සිද්ධි බහුලව සිදුවන බව වාර්තා වී ඇත. ජාත්‍යන්තර සංචාරක ව්‍යාපාරය තුළ පමණක් නොව, දේශීය සංචාරක ව්‍යාපාරය තුළද ළමයින් ලිංගික කාර්යයන් සඳහා ඉල්ලා සිටීම සහ ළමා ලිංගික සූරාකෑම විශාල වශයෙන් සිදුවේ. ළමා ලිංගික සංචාරක ව්‍යාපාරය සඳහා ඇති ඉල්ලුම ළමා වෙළඳාමට සහ වාණිජ සූරාකෑමට හේතු වන අතර, පවුල් අකර්මන්‍යතාවය හේතුවෙන් ඇති වන ආර්ථික දුෂ්කරතා, ළමයින්ගේ මූලික අවශ්‍යතා නොසලකා හැරීම, දුර්වල දෙමාපිය රැකවරණය, චිත්තවේගී ආතතිය, මාපිය සංක්‍රමණය වැනි නා නා විධ අවදානම් තත්ත්ව හේතුවෙන් ළමුන් සංචාරක ක්ෂේත්‍රයට තල්ලු කර ඇද දමනු ලැබේ. දණ්ඩ නීති සංග්‍රහය එහි 360 වන වගන්තිය මඟින් ලිංගික සූරාකෑම සහ ළමා වෙළඳාම තහනම් කරන අතර එය අපරාධයක් ලෙස සලකයි.

***ආයතනික රාමුව:***

වෙනත් බොහෝ ක්ෂේත්‍රවලට සමානව, සංචාරක ක්ෂේත්‍රයද ඵලදායී ලෙස ළමා ආරක්ෂණ පියවර ගැනීම උදෙසා සංචාරක අධිකාරීන් යටතේ ඇති ආයතන සමඟ බහු-ආංශික සහයෝගීතාව සහ සම්බන්ධීකරණය මත විශ්වාසය රඳවයි. අනෙකුත් බොහෝ ක්ෂේත්‍ර මෙන් නොව, සංචාරක කර්මාන්තය තුළදී රාජ්‍ය සහ පෞද්ගලික යන දෙඅංශයම සංචාරක ව්‍යාපාරය තුළ ළමා අපයෝජන මැඩලීමට සහයෝගයෙන් කටයුතු කළ යුතුය. ළමා අපයෝජන සම්බන්ධයෙන් ආමන්ත්‍රණය කිරීමට සෘජුවම දායකවන රාජ්‍ය ආයතන අතරට විදේශ කටයුතු විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය සහ ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය යන ආයතන ඇතුළත් වේ. ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය ආමන්ත්‍රණය කරන බැවින්, ශ්‍රී ලංකා පොලිසිය, ජාතික ළමා ආරක්ෂක අධිකාරිය සහ පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව සංචාරක බලධාරීන්ගේ ක්ෂේත්‍රයෙන් ඔබ්බෙහි වූ ප්‍රධාන හවුල්කාර ආයතන වේ.

.

| උපාය මාර්ගය | | උපාය මාර්ගික අරමුණු | ගැටලුව | ප්‍රධාන ක්‍රියාකාරකම් / මැදිහත්වීම් | ප්‍රධාන කාර්ය සාධක දර්ශකය | සත්‍යාපනය කිරීමේ ක්‍රම | උප ක්‍රියාකාරකම් | වසර 1 | වසර 1-3 | වසර 1-5 | ප්‍රධාන වගකිව යුතු ආයතන | ඇස්තමේන්තුගත අයවැය (රු. මිලියන) | අරමුදල් මූලාශ්‍රය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1. නීති ක්‍රියාත්මක කිරීම සහ බලාත්මක කිරීම | 1.1 ප්‍රතිපත්ති | 1.1.1. ක්ෂේත්‍ර ප්‍රතිපත්තියක් සකස් කිරීම මඟින් සංචාරක ක්ෂේත්‍රයේ ළමයින්ගේ ආරක්ෂාව තහවුරු කිරීම | 1.1.1.1. සංචාරක ක්ෂේත්‍රයේදී ළමයා නොවැදගත්ය | 1.1.1.1.1. ජාතික සංචාරක ප්‍රතිපත්තියට ළමා ආරක්ෂණය ඇතුලත් කිරීම | ප්‍රතිපත්ති ලේඛනය | අනුමත ප්‍රතිපත්තිය සහ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම | 1. කමිටුවක් පත් කිරීම<br>2. සාහිත්‍ය විමර්ශනය<br>3. සංකල්ප පත්‍රය<br>4.පාර්ශවකරුවන්ගේ සාකච්ඡාව<br>5.පාර්ශවකරුවන්ගේ එකඟතාව<br>6. ප්‍රතිපත්ති කෙටුම්පත<br>7. අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කිරීම<br>8. ප්‍රතිපත්ති එළි දැක්වීම | | 2025 - 2027 | | වි.ක.වි. රැ.ස.අමා.<br>ශ්‍රී.ල. ස. ස. අ<br>ජා.ළ.ආ. අ.<br>නී.දෙ | 0.300 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | 1.2 රෙගුලාසි | 1.2.2 පද්ධතිය නියාමනය කිරීමෙන් නිවෙස් ලැගුම්හල් පවතින ස්ථානල සිටින ස්ථානවල ළමයින්ගේ ආරක්ෂාව තහවුරුකිරීම | 1.2.2.1. නිවෙස් ලැගුම්හල්වල ජීවත්වන ළමයින් අනාරක්ෂිත වේ | 1.2.2.1.1. නිවෙස් ලැගුම්හල්වල පහසුකම් විධිමත් කිරීම සඳහා රෙගුලාසි සකස් කිරීම | සංවර්ධිත රෙගුලාසි | අනුමත රෙගුලාසි | 1. කමිටුවක් පත්කිරීම<br>2. සමාලෝචනය පැවැත්වීම.<br>3. රෙගුලාසි සකස් කිරීම<br>4. රෙගුලාසි වලට අදාළ අනුමැතිය ලබාගැනීම | | 2025 - 2027 | | වි.ක.වි.රැ.ස.අමා.<br>ශ්‍රී.ල. ස. ස. අ<br>ජා.ළ.ආ. අ. | 0.500 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | 1.2.3 පද්ධතිය විධිමත් කිරීම මඟින් රැකියා පුහුණුව අතරතුර ළමුන් ශ්‍රම සූරාකෑමෙන් ආරක්ෂා කිරීම සහතික කිරීම | 1.2.3.1. මෙම අංශයේ රැකියා සහ රැකියා පුහුණුව ලබන ළමයින් සූරාකෑමට අනාරක්ෂිත වේ | 1.2.3.1.1. කම්කරු අමාත්‍යාංශය සමඟ එක්ව සංචාරක ක්ෂේත්‍රයේ අවුරුදු 16ත් 18ත් අතර පුද්ගලයින්ගේ රැකියා සඳහා රෙගුලාසි සකස් කිරීම. | සංවර්ධිත රෙගුලාසි | අනුමත රෙගුලාසි | 1. කමිටුවක් පත් කිරීම<br>2. සමාලෝචනය පැවැත්වීම<br>3. රෙගුලාසි / චක්‍රලේඛ සකස් කිරීම<br>4. රෙගුලාසි / චක්‍රලේඛ සඳහා අදාළ අනුමැතිය ලබාගැනීම | | 2025 - 2027 | | වි.ක.වි.රැ .ස.අමා.<br><br>ක.අමා.<br><br>ශ්‍රී.ල. ස. ස. අ<br><br>ජා.ළ.ආ. අ. | 0.100 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | | 1.2.4. එක්සත් ජාතීන්ගේ ලෝක සංචාරක සංවිධානය මාර්ගෝපදේශ දේශීයකරණය කිරීමෙන් ක්ෂේත්‍රයේ ළමයින්ගේ ආරක්ෂාව සහතික කිරීම. | 1.2.4.1. ක්ෂේත්‍රයේ ප්‍රමාණවත් ප්‍රමිතීන් නොමැතිකම | 1.2.4.1.1. සංචාරක ව්‍යාපාරය හා සම්බන්ධ ළමුන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ලෝක සංචාරක සංවිධානයේ මාර්ගෝපදේශ සමාලෝචනය කිරීම | සමාලෝචන වාර්තාව | සමාලෝචන-ය කරන ලද නිර්දේශ සහිත වාර්තා | 1. කමිටුවක් පත් කිරීම<br>2. සමාලෝචනය පැවැත්වීම.<br>3. සමාලෝචන වාර්තාව සකස් කිරීම<br>4. නිර්දේශ ක්‍රියාත්මක කිරීම | 2025 | | | වි.ක.වි.රැ .ස.අමා.<br><br>ශ්‍රී.ල. ස. ස. අ | 0.500 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | | | | 1.2.4.1.2. සංචාරක පොලිසිය හරහා ළමා අපයෝජන සම්බන්ධ පැමිණිලි භාර ගැනීමට සහ ඒවාට ප්‍රතිචාර | සමාලෝචන වාර්තාව | සමාලෝචන-ය කරන ලද නිර්දේශ සහිත වාර්තා | 1. කමිටුවක් පත් කිරීම<br>2. සමාලෝචනය පැවැත්වීම.<br>3. සමාලෝචන වාර්තාව සකස් කිරීම<br>4. නිර්දේශ ක්‍රියාත්මක කිරීම | | 2025 - 2027 | | වි.ක.වි.රැ .ස.අමා.<br><br>ශ්‍රී.ල. ස. ස. අ<br><br>ශ්‍රී. ල.පො. | 0.500 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | දැක්වීමට පවතින ක්‍රමය සමාලෝචනය කර, පද්ධතිය වඩාත් ළමා හිතකාමී බවට පත් කිරීම | | | | | | | නී.දෙ | | |
| 2. සම්මත-යන් සහ අගයන් | | 2.1 සංචාරක ක්ෂේත්‍රයේ වෘත්තිකයන් සහ කාර්ය මණ්ඩල ළමයින් සමඟ කටයුතු කළයුතු ආකාරය පිළිබඳ ළමා හිතකාමී ආචාර ධර්ම පද්ධතියක් හඳුන්වාදීම | 2.1.1 පෞද්ගලික සහ රාජ්‍ය අංශයේ ආයතන තුළ ළමා ආරක්ෂාව පිළිබඳ ගැටලු ඇතිවීම | 2.1.1.1. සංචාරක ක්ෂේත්‍රයට (රාජ්‍ය සහ පෞද්ගලික අංශයට) අදාළ වෘත්තිකයන් සහ කාර්ය මණ්ඩල සඳහා ළමා ආරක්ෂාව පිළිබඳ ආචාර ධර්ම පද්ධතියක් හඳුන්වාදීම. | සංචාරක ක්ෂේත්‍රයට අදාළ වෘත්තිකයන් සහ කාර්ය මණ්ඩල සඳහා ළමා ආරක්ෂාව පිළිබඳ වූ ආචාර ධර්ම සංග්‍රහය | සංචාරක අංශයට අදාළ වෘත්තිකයන් සහ කාර්ය මණ්ඩල සඳහා ළමා ආරක්ෂාව සඳහා අනුමත ආචාර ධර්ම පද්ධතියක් පවතී | 1. කමිටුවක් පත් කිරීම<br>2.සාහිත්‍ය විමර්ශනය<br>3. සංකල්ප පත්‍රිකා සකස් කිරීම<br>4. පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා කිරීම<br>5.පාර්ශ්වයන්ගේ එකඟතාව<br>6. ආචාර ධර්ම කෙටුම් පත් කිරීම<br>7. අනුමැතිය ලබා ගැනීම<br>8. ආචාර ධර්ම සංග්‍රහය එළිදැක්වීම | 2025 | | | වි.ක.වි.ැ.ස.අමා.<br><br>ශ්‍රී.ල. ස. ස. අ | 0.500 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | | 2.2 ළමා ලිංගික සංචාරක ව්‍යාපාරය අපරාධයක් බව සංචාරකයින් දැනුවත් කිරීමට බලධාරීන් විසින් ගන්නා ලද ශක්තිමත් පණිවිඩ | 2.2.1 සංචාරකයින්ට සහ සේවා සපයන්නන්ට ශ්‍රී ලංකාවේ නීතිවලට අනුව ළමා ලිංගික වෙළඳාම සහ ලිංගික | 2.2.1.1. ගුවන්තොටුපළ හෝටල්, සංචාරක ස්ථාන සහ ආකර්ශනීය ස්ථාන වැනි ප්‍රමුඛ ස්ථානවල | සංවර්ධිත විවිධ වර්ගයේ සහ ප්‍රමාණයන්ගෙ-න් මෙවලම්<br><br>බෙදා හරින ලද මෙවලම් සංඛ්‍යාව | සංවර්ධනය කරන ලද මෙවලම් වර්ග පවතී<br><br>බෙදා හැරීමේ වාර්තා | 1.පාර්ශවකරුවන් ගේ උපදේශන<br>2. තොරතුරු, අධ්‍යාපන සන්නිවේදන මෙවලම් සංවර්ධනය කිරීම<br>3. තීරණාත්මක ස්ථාන හඳුනා | | | 2025 - 2029 | ශ්‍රී. ල. ස. ප්‍ර. අ.<br><br>ශ්‍රී.ල. ස. ස. අ | 0.100 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සහ ස්ථාවරය<br>හරහා සංචාරක<br>ව්‍යාපාරය තුළ<br>ළමා ලිංගික<br>අපයෝජනය<br>වැළැක්වීම | සූරාකෑමේ<br>අපරාධ සහ<br>ක්‍රියාත්මක වන<br>දඬුවම් පිළිබඳව<br>සීමිත<br>අවබෝධයක්<br>තිබීම. | දැනුවත් කිරීම<br>සඳහා<br>තොරතුරු,<br>අධ්‍යාපන<br>සන්නිවේදන<br>මෙවලම්<br>සංවර්ධනය හා<br>ප්‍රවර්ධනය<br>කිරීම | | | ගැනීම<br>4. බෙදා හැරීම | | | | | | |
| 3. මාපිය<br>සහ<br>ඍකවර-<br>ණ<br>සපයන්-<br>නන්ගේ<br>සහය | | 3.1 ළමයින්ට<br>එරෙහි<br>ප්‍රචණ්ඩත්වය<br>වැළැක්වීම සඳහා<br>දෙමාපියන්,<br>ළමයින් සහ ප්‍රජාව<br>වඩාත් හොඳින්<br>දැනුවත්ව,<br>හැකියාවෙන් සහ<br>සම්පත්වලින්<br>සමන්විත වන<br>පරිදි ප්‍රජා පාදක<br>ළමා ආරක්ෂණ<br>පද්ධති ශක්තිමත්<br>කිරීම | 3.1.1. රට තුළ<br>දුර්වල ප්‍රජා<br>මූලික ළමා<br>ආරක්ෂණ<br>යාන්ත්‍රණයන්<br>තිබීම | 3.1.1.1.<br>සංචාරක<br>ව්‍යාපාරය බහුල<br>පෙදෙස්වල<br>ප්‍රජා මූලික<br>ළමා ආරක්ෂණ<br>යාන්ත්‍රණයන්<br>ස්ථාපිත කිරීම/<br>වැඩිදියුණු<br>කිරීම සහ ළමා<br>ආරක්ෂණ සහ<br>වැළැක්වීමේ<br>පියවර සඳහා<br>දෙමාපියන් සහ<br>ළමයින්<br>සම්බන්ධ කර<br>ගැනීම | ප්‍රජා මූලික<br>ළමා ආරක්ෂණ<br>පද්ධති ස්ථාපිත<br>කිරීම<br><br>දෙමාපියන් සහ<br>ළමයින්සඳහා<br>පවත්වනු ලබන<br>පුහුණු හා<br>දැනුවත් කිරීමේ<br>වැඩසටහන්<br>සංඛ්‍යාව<br><br>ප්‍රතිලාභ ලැබූ<br>ළමයින්/දෙමා-<br>පියන් සංඛ්‍යාව<br><br>පද්ධති හරහා<br>හඳුනාගත් සිද්ධි<br>සංඛ්‍යාව | සංවර්ධනය<br>කරන ලද<br>යාන්ත්‍රණයන්<br>පවතී | 1. සංචාරක<br>අමාත්‍යාංශය සමඟ<br>එක්ව කාන්තා හා<br>ළමා කටයුතු<br>අමාත්‍යාංශයගත්<br>සහයෝගී<br>ක්‍රියාමාර්ග<br>2. හඳුනාගත්<br>යාන්ත්‍රණයන්<br>3. නිකුත් කරන<br>ලද චක්‍රලේඛ | 2025 | | | වි.ක.වි.ඝ<br>.ස.අමා.<br><br>ප.ළ.ර.<br>සේ.දෙ. | 0.100 | ශ්‍රී ලංකා<br>රජයේ<br>අරමුදල් |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | 3.3 පවුල් පරිසරය ශක්තිමත් කිරීම මඟින් සංචාරක ප්‍රවර්ධනය කරන ප්‍රදේශ තුළ ළමයින්ගේ ආරක්ෂාව තහවුරු කිරීම | 3.3.1. සංචාරකයින්ට සහ අතරමැදියන්ට ලිංගිකත්වය සඳහා තම ළමයින් විකිණීමට පවුල් සහ ප්‍රජාවන් පෙළඹේ | 3.3.1.1. සංචාරකයින් විසින් එල්ල කරන අවදානම් සහ අනාරක්ෂිත බව පිළිබඳව සහ ඔවුන්ට හානි කළ හැකි සංචාරක කර්මාන්තයේ නියැලෙන අයගෙන් ළමයින් ආරක්ෂා කිරීම පිළිබඳව පවුල් සහ ප්‍රජාවන් සඳහා වැඩසටහන් පැවැත්වීම. | පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව<br><br>ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව | ප්‍රගති වාර්තා | 1. ප්‍රායෝගික සාක්ෂි සහ සාහිත්‍ය සමාලෝචනය කිරීම<br>2. වැඩසටහන් සංවර්ධනය කිරීම<br>3. වැඩසටහන් ක්‍රියාත්මක කිරීම<br>4. වැඩසටහන් ඇගයීම | | | 2025 - 2029 | වි.ක.වි.රැ.ස.අමා.<br><br>ප.ළ.ර. සේ.දෙ.<br><br>ජා.ළ.ආ. අ. | 0.500 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| 4. ප්‍රතිචාර සහ සහාය සේවා | | 4.1 සංචාරකයන් බහුල ප්‍රදේශවල ළමයින්ගේ උපරිම සංවර්ධනය සඳහා අඛණ්ඩ පාසල් අධ්‍යාපනය සහතික කිරීම | 4.1.1. ළමයින් නියමිත කාලයට පෙර පාසල් හැර ගොස් සංචාරක ක්ෂේත්‍රයෙන් උපයා ගැනීමට පටන් ගනී | 4.1.1.1. ක්ෂේත්‍රයේ ප්‍රධාන සමාගම් සමඟ සහයෝගයෙ-න්, අනාරක්ෂිත පවුල්වල සිටින ළමයින්ට පාසල් අධ්‍යාපනය අඛණ්ඩව කරගෙන යාම සඳහා සමාජ සත්කාර | පුද්ගලික අංශය විසින් සකස් කරන ලද සමාජ සත්කාර වැඩසටහන් | සමාජ සත්කාරක වැඩසටහන් පවතී | 1.පාර්ශවකරුවන් ගේ උපදේශන<br>2. සමාජ සත්කාරක වැඩසටහනක් සැලසුම් කිරීම<br>3. සමාගම් සමඟ වැඩසටහන් පවත්වා ගැනීම පිළිබඳ සාකච්ඡා<br>4. වැඩසටහන් පැවැත්වීම | | 2025 - 2027 | | ශ්‍රී.ල. ස. ස. අ<br><br>ජා.ළ.ආ. අ.<br><br>ප.ළ.ර. සේ.දෙ. | 1.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | වැඩසටහනක් සංවර්ධනය කිරීම | | | | | | | | | |
| | | 4.2 රට තුළ පවතින සංචාරක ක්ෂේත්‍රයේ ළමා ලිංගික අපයෝජන ළමා වෙළදාම සහ සූරාකෑමට එරෙහිව බහු-ආංශික පියවරයන් සඳහා සංචාරක ක්ෂේත්‍රය ක්‍රියාකාරී භූමිකාවක් ඉටු කරන බවට සහතික වීම. | 4.2.1 ළමා ආරක්ෂණය ආමන්ත්‍රණය කිරීම සඳහා සංචාරක ක්ෂේත්‍රයේ ප්‍රමාණවත් දායකත්වයක් නොලැබීම | 4.2.1.1 සංචාරක ක්ෂේත්‍රයේ බලධාරීන් ප්‍රාදේශීය, දිස්ත්‍රික්, පළාත් සහ ජාතික මට්ටමින් ළමා ආරක්ෂාව පිළිබඳ බහු-ආංශික තීරණ ගැනීමේ ක්‍රියාවලීන් සඳහා සහභාගී වීම. | සෑම තරාතිරමකම ළමා ආරක්ෂාව සම්බන්ධ බහු-ආංශික තීරණ ගැනීමේ වේදිකාවල සංචාරක ක්ෂේත්‍රයේ බලධාරීන්ගේ සහභාගීත්වය | රැස්වීම් වාර්තා සටහන් | 1. උප ජාතික මට්ටමේ ළමා ආරක්ෂණ සංසද සමඟ සන්නිවේදනය කිරීම<br>2. අනිවාර්ය සහභාගීත්වය සඳහා චක්‍රලේඛය නිකුත් කිරීම<br>3. සහභාගීත්වය සහ මැදිහත්වීම නියාමනය කිරීම | | | 2025 - 2029 | වි.ක.වි.ර .ස.අමා.<br><br>ශ්‍රී.ල. ස. ස. අ | 0.100 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| 5. අධ්‍යාප-නය සහ ජීවන කුසලතා | | 5.1 සංචාරක ක්ෂේත්‍රයේ රැකියා පිළිබඳ දැනුවත් තීරණ ගැනීමට පවුල්වලට හැකියාව ලබා දීම | 5.1.1. ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් ළමයාගේ උපරිම වර්ධනයට බාධා කරයි. | 5.1.1.1. සංචාරක ක්ෂේත්‍රයේ රැකියා අවස්ථා සහ අවදානම් පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම | වැඩසටහන් මොඩියුලය<br><br>පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව | වැඩසටහන් උපායමාර්ග සටහන<br><br>වැඩසටහන් මොඩියුල<br><br>ප්‍රගති වාර්තා | 1. දැනුවත් කිරීමේ වැඩසටහනේ මොඩියුලය සකස් කිරීම<br>2. පුහුණුකරුවන් / සම්පත් දායකයන් පුහුණු කිරීම<br>3. වැඩසටහන් පැවැත්වීම | | 2025 - 2027 | | වි.ක.වි.ර .ස.අමා.<br><br>ශ්‍රී.ල. ස. ස. අ<br><br>ශ්‍රී.ල.ස. හෝ.ක. ආ | 0.500 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | | | | 5.1.1.2. ක්ෂේත්‍රයේ පුද්ගලයින් සඳහා ළමා ආරක්ෂණ සමාජ සහ චර්යා විපර්යාස | සංවර්ධිත වැඩසටහන<br><br>පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව | ප්‍රගති වාර්තා | 1. සමාජ සහ චර්යා විපර්යාස උපාය මාර්ගය සහ උපදේශනය සඳහා ක්‍රම සකස් කිරීම<br>2. වැඩසටහන | | | 2025 - 2029 | වි.ක.වි.ර .ස.අමා.<br><br>ශ්‍රී.ල. ස. ස. අ<br><br>ශ්‍රී.ල.ස. | 1.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | වැඩසටහන් පැවැත්වීම. | ප්‍රතිලාභ ලැබූ පුද්ගලයින් සංඛ්‍යාව | | සංවර්ධනය කිරීම<br>3. අවශ්‍ය සම්පත් රැස් කිරීම<br>4. වැඩසටහන් පැවැත්වීම | | | | හෝ.ක.ආ<br><br>ජා.ළ.ආ.අ. | | |
| | | | | 5.1.1.3. සංචාරක හා ආගන්තුක සත්කාරයට සම්බන්ධ උසස් අධ්‍යාපන ආයතන ක්‍රියාත්මක කරන විෂයමාලාවට ළමා ආරක්ෂාව ඇතුළත් කිරීම | සංශෝධිත විෂය මාලාව | විෂයමාලා පවතී | 1. ප්‍රායෝගික සාක්ෂි සහ සාහිත්‍ය සමාලෝචනය කිරීම<br>2. විෂයමාලා සංවර්ධනය<br>3. අධ්‍යාපනික වැඩසටහන්වලට අන්තර්ගත කිරීම | | | 2025 - 2029 | වි.ක.වි.රැ.ස.අමා.<br><br>ශ්‍රී.ල.ස.හෝ.ක.ආ.<br>වි.වි.ප්‍ර.කො.ස<br><br>පෞද්ග-ලික හෝටල් පාසල්<br><br>විශ්ව විද්‍යාල | 1.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | | | | 5.1.1.4.වයස-අවු 16-18 ත් අතර පාසල් හැරයන අයව සංචාරක කර්මාන්තය බහුල ප්‍රදේශවල සංචාරක ක්ෂේත්‍රයේ වෘත්තියක් ඉගෙන ගැනීමට යාන්ත්‍රණයක් සැලසුම් කිරීම | සංවර්ධිත යාන්ත්‍රණය | වයස අවු.16 – 18ත් අතර පාසල් හැර යන අයට සංචාරක ව්‍යාපාරය බහුල ප්‍රදේශවල සංචාරක ක්ෂේත්‍රයේ වෘත්තියක් ඉගෙන ගැනීමට ක්‍රමවේදයක් තිබීම | 1.පාර්ශ්වකරුවන් ගේ උපදේශන<br>2. ප්‍රායෝගික සාක්ෂි සහ සාහිත්‍ය විමර්ශනය කිරීම<br>3. විෂයමාලා සංවර්ධනය / අනුගත වීම<br>4. වෘත්තීය පුහුණු අවස්ථා හඳුන්වා දීම<br>5.වෘත්තීය පුහුණු අවස්ථා ප්‍රවර්ධනය | | | 2025 - 2029 | වි.ක.වි.රැ.ස.අමා.<br><br>ශ්‍රී.ල.ස.හෝ.ක.ආ<br><br>අ.උ.අ.වෘ.අ.අමා.<br><br>ශ්‍රී.ල.වෘ.පු.අ. | 5.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 5.1.1.5. ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් පිළිබඳ අනාරක්ෂිත පවුල්වල දෙමාපියන් සහ රැකවරණ සපයන්නන් සඳහා කුසලතා වර්ධනය කිරීම පිණිස උපකාරක වැඩසටහන් | සංවර්ධනය කරන ලද වැඩසටහන්<br><br>පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව<br><br>ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව | වැඩසටහන් නිර්මාණය<br><br>වැඩසටහන් මොඩියුල<br><br>ප්‍රතිලාභ ලැබූ පුද්ගලයින් පිළිබඳ වාර්තා | 1. ප්‍රායෝගික සාක්ෂි සහ සාහිත්‍ය විමර්ශනය කිරීම<br>2.පාර්ශ්වකරුවන් ගේ උපදේශන<br>3. වැඩසටහන් සංවර්ධනය කිරීම<br>4. වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | | 2025 - 2027 | | වි.ක.වි.රා .ස.අමා.<br><br>ශ්‍රී.ල. ස. ස. අ<br><br>ශ්‍රී.ල.ස. හෝ.ක. ආ | 0.200 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| 6. සාක්ෂි ජනනය කිරීම | | 6.1 සංචාරක ක්ෂේත්‍රයේ ළමා ආරක්ෂණ මැදිහත්වීම් සඳහා සාක්ෂි පදනම් කරගත් තීරණ ගැනීම සහතික කිරීම | 6.1.1. ක්ෂේත්‍රයේ ළමයින්ට ඇති අවදානම් පිළිබඳ ප්‍රමාණවත් දත්ත හෝ පර්යේෂණ සාක්ෂි නොමැති බව | 6.1.1.1 නිවෙස් ලැගුම්හල් පහසුකම් සහ එම පහසුකම්වල ජීවත් වන ළමයින්ගේ තොරතුරු රැස් කිරීමට යාන්ත්‍රණයක් සකස් කිරීම | සංවර්ධිත දත්ත රැස් කිරීමේ යාන්ත්‍රණය | නිවෙස් ලැගුම්හල් පහසුකම් සහ එම පහසුකම්වල ජීවත්වන ළමයින්ගේ තොරතුරු රැස්කිරීමේ පද්ධතියක් තිබීම | 1.පාර්ශ්වකරුවන්-ගේ උපදේශනය<br>2. දත්ත රැස් කිරීමේ රාමුව සංවර්ධනය කිරීම<br>3. තොරතුරු කළමණාකරණ පද්ධතිය සංවර්ධනය කිරීම | | | 2025 - 2029 | සං.අමා.<br><br>ශ්‍රී.ල. ස. ස. අ<br><br>ජා.ළ.ආ. අ.<br><br>ප.ළ.ර. සේ.දෙ. | 1.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| | | | | 6.1.1.2. ආසියානු කලාපයේ සහ දේශීය සංචාරක ව්‍යාපාරය තුළ ළමා | සමාලෝචන වාර්තාව සම්පූර්ණ කර ඇත<br><br>බෙදා හැරීම | නිර්දේශ සහිත සමාලෝචන වාර්තා<br><br>බෙදා හැරීමේ වාර්තා | 1. සමාලෝචනය පැවැත්වීම.<br>2. සමාලෝචන වාර්තාව සකස් කිරීම<br>3. නිර්දේශ ක්‍රියාත්මක | | | 2025 - 2029 | වි.ක.වි.රා .ස.අමා.<br><br>ශ්‍රී.ල. ස. ස. අ | 2.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | ආරක්ෂණය පිළිබඳ ප්‍රශස්ත ව්‍යවහාරයන් පිළිබඳ දැනුම සමාලෝචනය කර බෙදා හැරීම. | ප්‍රතිලාභී පුද්ගලයින් සංඛ්‍යාව | | කිරීම<br>4. වාර්තාව බෙදා හැරීම | | | | ජා.ළ.ආ. අ. | | |
| | | 6.2 රට තුළ ළමා සුරක්ෂිත සංචාරක ව්‍යාපාරය සහ සදාචාරාත්මක සංචාරක ව්‍යාපාරය පිළිබඳ පර්යේෂණ සහ අධ්‍යයන සිදු කරමින් සාක්ෂි වර්ධනය කිරීම | 6.2.1ළමා සුරක්ෂිතතාව සහ සදාචාරාත්මක සංචාරක ව්‍යාපාරය පිළිබඳ ප්‍රමාණවත් සාක්ෂි නොමැති වීම | 6.2.1.1. පර්යේෂණ / අධ්‍යයනය කිරීම | පර්යේෂණ / අධ්‍යයන වාර්තාව | පර්යේෂණ සහ අධ්‍යයන වාර්තා පවතී | 1. පර්යේෂණ / අධ්‍යයනය සඳහා මාතෘකා සහ ක්‍රමවේදය නිර්ණය කිරීම<br>2. පර්යේෂණ / අධ්‍යයනය පැවැත්වීම<br>3. පර්යේෂණ / අධ්‍යයන දියත් කිරීම | | | 2025 - 2029 | වි.ක.වි.රැ .ස.අමා.<br><br>ශ්‍රී.ල. ස. ස. අ | 5.000 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |
| 7. ඇගයුම් ක්‍රමවේ-දය | | 7.1 ළමා ආරක්ෂණය පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රමානුකූලව ක්‍රියාත්මක කිරීම | | 7.1.1.1. කාර්තුමය ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම<br><br>7.1.1.2. වාර්ෂික ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම | නිරන්තරයෙන් සමාලෝචන රැස්වීම් පැවැත්වීම්<br><br>අංශ විශේෂිත නිර්දේශ ඉදිරිපත් කර ඇත | සමාලෝචන වාර්තා | 1.සමාලෝචන රැස්වීම් පැවැත්වීම<br>2. ක්ෂේත්‍ර වාර්තා විශ්ලේෂණය<br>3. වැඩිදියුණු කිරීම්/ ඉදිරි ක්‍රියාමාර්ග සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම | | | 2025 - 2029 | වි.ක.වි.රැ .ස.අමා.<br><br>ශ්‍රී.ල. ස. ස. අ<br><br>ජා.ළ.ආ. අ. | 0.100 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් |

**මෙහෙයුම් හා ඇගයුම් ක්‍රමවේදය**

මෙහෙයුම් හා ඇගයුම් ක්‍රමවේදය ස්ථාපනය සඳහා ඇති නෛතික ප්‍රතිපාදන:

1. ළමා ආරක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය
2. 1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරි පනතේ 14 (ඊ) ළමා අපචාර වැළැක්වීම සඳහා ජාතික ප්‍රතිපත්තිය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නීතිමය, පරිපාලනමය හෝ වෙනත් සංශෝධන නිර්දේශ කිරීම සහ 15 (ඉ) ස්වකීය කර්තව්‍යයන් ඵලදායී ලෙස ඉටු කිරීම සඳහා අනුකමිටු පත් කිරීම හෝ පළාත් මට්ටම් ඒකක සමග සම්බන්ධීකරණය වීම.

ළමා ආරක්ෂණ කමිටු හෙවත් ස්වාධීන තාක්ෂණික කමිටු ජාතික, පළාත්, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය වශයෙන් ස්ථාපනය කළ යුතුව ඇත.

ළමා ආරක්ෂණය පිළිබඳ ජාතික මෙහෙයුම් කමිටුව: ප්‍රතිපත්තියේ සඳහන් ව්‍යුහය පරිදි ස්ථාපනය කළ යුතුය. (ඇමුණුම 01)

ළමා ආරක්ෂණය පිළිබඳ ජාතික තාක්ෂණික කමිටුව : ප්‍රතිපත්තියේ සඳහන් ව්‍යුහය පරිදි ස්ථාපනය කළ යුතුය. (ඇමුණුම 02)

ළමා ආරක්ෂණය පිළිබඳ දිස්ත්‍රික් තාක්ෂණික කමිටුව: දිස්ත්‍රික් ළමා ආරක්ෂක කමිටු හෙවත් දිස්ත්‍රික් ස්වාධීන තාක්ෂණික කවයන්හි සමාජිකත්වය වන්නේ ළමා ආරක්ෂාවේ පාර්ශවකරුවන් වන ක්ෂේත්‍ර 10 ආවරණය වන පරිදි දිස්ත්‍රික්කයට අදාළව සිටින ප්‍රවීනයන් වේ. මෙම කමිටුව ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේදී (Regional Director of Health Service Office) රැස්වන අතර පහසුකාරක හා සම්බන්ධීකාරක වන්නේ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ දිස්ත්‍රික් ළමා ආරක්ෂක නිලධාරි වේ. මෙම කමිටුවේ ප්‍රධානත්වය රැස්වීමෙන් රැස්වීමට තාක්ෂණික කමිටු සාමාජිකයින් අතර හුවමාරු වීම සිදුවේ. අදාළ තාක්ෂණික කමිටු සාමාජිකයින් අධිකාරියේ ප්‍රධාන කාර්යාලය විසින් රැස්වීම් සඳහා කැඳවනු ලබයි. දිස්ත්‍රික්කයේ සිටින ඒ ඒ විෂයන්ට අදාළ දිස්ත්‍රික් නිලධාරින් තාක්ෂණික කමිටුව ඉදිරියේ තම ගැටළු හා ප්‍රගතිය සාකච්ඡා කරනු ඇත. (ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ දිස්ත්‍රික් නිලධාරියාගේ දැනුම් දීම පරිදි ඒ ඒ විෂයන් සඳහා අවශ්‍ය තාක්ෂණික විශේෂඥයන්ගේ ප්‍රධානත්වයෙන් කුඩා කමිටු රැස්වීම් සිදු කළ හැක.)

පළමු අදියරේදී ජාතික මෙහෙයුම් කමිටුව, ජාතික තාක්ෂණික කමිටුව හා දිස්ත්‍රික් තාක්ෂණික කමිටු පත් කර ගැනීමට ක්‍රියා කරයි. මෙහිදී නියාමනය, ඇගයීම, වගවීම හා ඉගෙනුම පරිදි පළාත් හා ප්‍රාදේශීය ව්‍යුහයන් සකස් කිරීමට නියමිතය.

**කමිටු සාමාජිකයින් පත් කිරීම:**

ළමා ආරක්ෂණය පිළිබඳ ජාතික මෙහෙයුම් කමිටුව: ජාතික මෙහෙයුම් කමිටුවේ සභාපති ලෙස ළමා විෂය භාර අමාත්‍යාංශ ලේකම් විසින් අදාළ ක්ෂේත්‍රයන් වන ළමා කටයුතු, ආරක්ෂක හා නීතිය බලාත්මක කිරීම, ආපදා කළමනාකරණය, අධ්‍යාපනය, සෞඛ්‍ය, අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ, කම්කරු, ජනමාධ්‍ය හා තොරතුරු තාක්ෂණය, සමාජ සවිබලගැන්වීම් සහ සංචාරක යන ක්ෂේත්‍රයන්ට අදාළ වන අමාත්‍යාංශයන්ගෙන් කමිටු සාමාජිකයින් නම් කිරීම සඳහා ඉල්ලුම් කිරීම.

ළමා ආරක්ෂණය පිළිබඳ ජාතික තාක්ෂණික කමිටුව: ජාතික මෙහෙයුම් කමිටුවේ සභාපති ලෙස ළමා විෂය භාර අමාත්‍යාංශ ලේකම් විසින් අදාළ ක්ෂේත්‍රයන් වන ළමා කටයුතු, ආරක්ෂක හා නීතිය බලාත්මක කිරීම, ආපදා කළමනාකරණය, අධ්‍යාපනය, සෞඛ්‍ය, අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ, කම්කරු, ජනමාධ්‍ය හා තොරතුරු තාක්ෂණය, සමාජ සවිබලගැන්වීම් සහ සංචාරක යන ක්ෂේත්‍රයන්ට අදාළ වන ජාතික මෙහෙයුම් කමිටු සාමාජිකයින් මගින් තාක්ෂණික කමිටු සාමාජිකයින් නම් කිරීම සඳහා ඉල්ලුම් කිරීම.

ළමා ආරක්ෂණය පිළිබඳ දිස්ත්‍රික් තාක්ෂණික කමිටුව: ජාතික මෙහෙයුම් කමිටුවේ සභාපති ලෙස ළමා විෂයය භාර අමාත්‍යාංශ ලේකම් විසින් අදාළ ක්ෂේත්‍රයන් වන ළමා කටයුතු, ආරක්ෂක හා නීතිය බලාත්මක කිරීම, ආපදා කළමනාකරණය, අධ්‍යාපනය, සෞඛ්‍ය, අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ, කම්කරු, ජනමාධ්‍ය හා තොරතුරු තාක්ෂණය, සමාජ සවිබලගැන්වීම් සහ සංචාරක යන ක්ෂේත්‍රයන්ට අදාළ වන ජාතික මෙහෙයුම් කමිටු සාමාජිකයින් මගින් දිස්ත්‍රික් 25 ආවරණය වන පරිදි තාක්ෂණික කමිටු සාමාජිකයින් නම් කිරීම සඳහා ඉල්ලුම් කිරීම.

**රැස්වීම් පැවැත්වීම**

1. ළමා ආරක්ෂණය පිළිබඳ ජාතික මෙහෙයුම් කමිටුව: වසරකට අවම වශයෙන් රැස්වීම් වාර දෙකක් පැවැත්විය යුතුය.
2. ළමා ආරක්ෂණය පිළිබඳ ජාතික තාක්ෂණික කමිටුව: අවම වශයෙන් වසරකට රැස්වීම් වාර තුනක් පැවැත්විය යුතුය.
3. ළමා ආරක්ෂණය පිළිබඳ දිස්ත්‍රික් තාක්ෂණික කමිටුව: අවම වශයෙන් වසරකට රැස්වීම් වාර හතරක් පැවැත්විය යුතුය. අවශ්‍යතාව පරිදි විෂයානුබද්ධ වශයෙන් කුඩා කණ්ඩායම් රැස්වීම් මසකට එක් රැස්වීමකට නොවැඩි වන සේ පැවැත්විය හැක.

මෙම සැලැස්මේ ප්‍රගති සමාලෝචනය සම්බන්ධයෙන් සම්මත ක්‍රියා පටිපාටින් ජාතික තාක්ෂණික කමිටු සාමාජිකයන් විසින් ක්ෂේත්‍ර 10 ආවරණය වන සේ සකස් කර ගත යුතුය. තෘණ මූල මට්ටමේ සිට ජාතික තලය දක්වා කාර්ය සාධන මැනීම් මෙවලම් කෙසේ විය යුතුද යන්න කමිටුව විසින් තීරණය කළ යුතුය. මෙයට අමතරව, සියලු විෂයය ක්ෂේත්‍රයන් ආවරණය කරනු ලබන ආයතන විසින් ළමා ආරක්ෂණය පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්මේ තමන් විසින් ඉටු කරනු ලබන ක්‍රියාකාරකම් සම්බන්ධව ප්‍රගතිය පිළිබඳ මාසික වාර්තාවක් තාක්ෂණික කමිටු සභාපති වන ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සභාපති වෙත ඉදිරිපත් කළ යුතුය.

**පස් අවුරුදු ක්‍රියාකාරී සැලැස්ම සඳහා සාරාංශගත දළ මූල්‍ය ඇස්තමේන්තුව**

මෙම ක්‍රියාකාරී සැලැස්මට අදාළව ඉදිරි වසර පහ සඳහා දළ වියදම් ඇස්තමේන්තුවක් පහත ඉදිරිපත් කර ඇත. රටේ පවතින ආර්ථික අර්බුදය මත මෙහි සඳහන් ඇස්තමේන්තු කාලානුරූපීව වෙනස් විය හැකි බව සළකන්න. සැලැස්මෙහි අඩංගු කාර්යයන් ක්‍රියාත්මක කිරීමේදී ඒ ඒ ක්ෂේත්‍රයන්හි ඇති ක්‍රියාකාරී ආයතන විසින් වාර්ෂිකව ඇස්තමේන්තු සකස් කර මහා භාණ්ඩාගාරය වෙත අනුමැතිය පිණිස ඉදිරිපත් කරනු ඇත.

| අනු අංකය | ක්ෂේත්‍රය | දළ ඇස්තමේන්තුව (රු.මි.) | | | මූලාශ්‍රය |
|---|---|---|---|---|---|
| | | 1 වසර | 1-3 වසර | 1-5 වසර | |
| 1 | ළමා කටයුතු ක්ෂේත්‍රය | 12.300 | 20.900 | 235.400 | වාර්ෂික මූල්‍ය ප්‍රතිපාදන ලෙස මහා භාණ්ඩාගාර ප්‍රතිපාදන හෝ රාජ්‍ය නොවන සංවිධාන මගින් ලබා ගැනීමට අපේක්ෂිත මූල්‍ය ප්‍රතිපාදන |
| 2 | ආපදා කළමනාකරණ ක්ෂේත්‍රය | 3.600 | 10.400 | 61.600 | |
| 3 | ආරක්ෂක සහ නීතිය බලාත්මක කිරීමේ ක්ෂේත්‍රය | 11.400 | 44.450 | 158.800 | |
| 4 | සමාජ සවිබලගැන්වීමේ ක්ෂේත්‍රය | 1.200 | 49.100 | 16.200 | |
| 5 | මාධ්‍ය සහ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රය | 8.300 | 8.900 | 30.100 | |
| 6 | සෞඛ්‍ය ක්ෂේත්‍රය | 0.000 | 5.100 | 128.700 | |
| 7 | කම්කරු සහ රැකියා ක්ෂේත්‍රය | 6.500 | 16.600 | 32.300 | |
| 8 | අධ්‍යාපනය ක්ෂේත්‍රය | 2.200 | 11.300 | 27.900 | |
| 9 | අධිකරණ සහ නීති ප්‍රතිසංස්කරණ ක්ෂේත්‍රය | 11.200 | 28.000 | 5.600 | |
| 10 | සංචරණ සහ සංචාරක ක්ෂේත්‍රය | 1.100 | 3.100 | 15.800 | |
| | එකතුව | **57.800** | **197.850** | **712.400** | |

ඇමුණුම 01

# ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා වූ යාන්ත්‍රණය

## ළමා ආරක්ෂණය පිළිබඳ ජාතික මෙහෙයුම් කමිටුව

1. අනුශාසකවරු
    - ජනාධිපති
    - අගමැති
    - ළමා කටයුතු විෂයය භාර අමාත්‍යවරයා
2. සභාපති
    - ලේකම් - ළමා කටයුතු විෂයය භාර අමාත්‍යාංශය
3. ලේකම්
    - සභාපති - ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
4. සාමාජික (සාමාජිකයින් 22)
    - ළමා විෂයය හා සම්බන්ධ සියලු අමාත්‍යාංශ නියෝජනය වන පරිදි ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් ධුරයට නො අඩු ධුරයක් දරන නිලධාරියෙකු (ළමා කටයුතු ක්ෂේත්‍රය, ආපදා කළමනාකරණ ක්ෂේත්‍රය, ආරක්ෂක සහ නීතිය බලාත්මක කිරීමේ ක්ෂේත්‍රය, සමාජ සවිබලගැන්වීමේ ක්ෂේත්‍රය, මාධ්‍ය සහ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රය, සෞඛ්‍ය ක්ෂේත්‍රය, කම්කරු සහ රැකියා ක්ෂේත්‍රය, අධ්‍යාපනය ක්ෂේත්‍රය, අධිකරණ සහ නීති ප්‍රතිසංස්කරණ ක්ෂේත්‍රය, සංචරණ සහ සංචාරක ක්ෂේත්‍රය)
    - ළමා කටයුතු පිළිබඳ විෂයය භාර සියලු පළාත් අමාත්‍යාංශ ලේකම්වරුන්
    - කොමසාරිස්, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව (මධ්‍යම රජය)
    - කොමසාරිස්, කම්කරු දෙපාර්තමේන්තුව
    - සභාපති/අධ්‍යක්ෂ ජනරාල්, අපරාධයක වින්දිතයින් හා සාක්ෂිකරුවන් හට සහය දීමේ සහ ආරක්ෂා කිරීමේ ජාතික අධිකාරිය

## ළමා ආරක්ෂණය පිළිබඳ ජාතික තාක්ෂණික කමිටුව

1. කමිටු කැඳවීම හා මෙහෙයවීම
   - සභාපති - ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
2. සාමාජික
   - ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයින් (සාමාජිකයින් 14)
     (ජ්‍යෙෂ්ඨ මනෝ චිකිත්සකවරයෙක්, ජ්‍යෙෂ්ඨ ළමා රෝග විශේෂඥවරයෙක්, අධිකරණ වෛද්‍යවරයෙක්, ජ්‍යෙෂ්ඨ මනෝ විද්‍යාඥයෙක්, ජ්‍යෙෂ්ඨ රජයේ නීතිඥ ධුරයට අඩු නොවන නිලයක් දරන , නීතිපති දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධරයෙක්, නියෝජ්‍ය පොලිස්පති ධුරයට අඩු නොවන නිලයක් දරන, පොලිස් දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධරයෙක්, නීතිය, ළමා සුබ සාධනය, අධ්‍යාපනය හෝ වෙනත් ඒ හා සම්බන්ධ ක්ෂේත්‍රයක පුළුල් පළපුරුද්දක් ,සාමාර්ථයක් හා පිළිගැනීමක් ඇති බව ජනාධිපතිවරයාට පෙනී යන තැනැත්තන් අතුරෙන් සාමාජිකයන් පස්දෙනෙක්, පරිවාස හා ළමාරක්ෂක කොමසාරිස්වරයා (මධ්‍යම රජය), කම්කරු කොමසාරිස්වරයා සහ ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තියේ 40 වන වගන්තිය මඟින්, ඒ ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ කාර්ය සඳහා සංස්ථාපනය කරනු ලැබූ කමිටුවේ සභාපතිවරයා)
   - විෂයය ක්ෂේත්‍ර 10 ආවරණය වන පරිදි තාක්ෂණික විශේෂඥයින් (සාමාජිකයින් 10)
     (ළමා කටයුතු ක්ෂේත්‍රය, ආපදා කළමනාකරණ ක්ෂේත්‍රය, ආරක්ෂක සහ නීතිය බලාත්මක කිරීමේ ක්ෂේත්‍රය, සමාජ සවිබලගැන්වීමේ ක්ෂේත්‍රය, මාධ්‍ය සහ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රය, සෞඛ්‍ය ක්ෂේත්‍රය, කම්කරු සහ රැකියා ක්ෂේත්‍රය, අධ්‍යාපන ක්ෂේත්‍රය, අධිකරණ සහ නීති ප්‍රතිසංස්කරණ ක්ෂේත්‍රය, සංචරණ සහ සංචාරක ක්ෂේත්‍රය)
   - ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානයන්හි නියෝජිතයින් (සාමාජිකයින් 07)
     (ළමයින් සම්බන්ධයෙන් කටයුතු කරනු ලබන නියෝජිත ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන වන United Nations Children Fund (UNICEF), Save the Children Sri Lanka, Child Fund Sri Lanka, United Nations Development Programme (UNDP), International Labour Organization (ILO), International Organization for Migration (IOM), World Vision International.